**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**අටවැනි පාර්ලිමේන්තුවේ**
**පළමුවැනි සැසිවාරය**

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 200**

# රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවන වාර්තාව

(2016.05.04 සිට 2016.10.28 දක්වා)

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති
**ගරු ලසන්ත අලගියවන්න මහතා**
විසින්
2017 ක් වූ ජූනි මස 23 වැනි දින
ඉදිරිපත් කරන ලදී.

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව නියම කළේ 2017 අගෝස්තු මස 08 වැනි දින

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී මුද්‍රණය කරන ලදී
කොළඹ රජයේ ප්‍රකාශන කාර්යංශයෙන් මිල දී ගත හැක.

අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය**

ගරු ලසන්ත අලගියවන්න මහතා (සභාපති)

ගරු එස්.බී. දිසානායක මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු පී. හැරිසන් මහතා

ගරු ෆයිසර් මුස්තාපා මහතා

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු සුජීව සේනසිංහ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සෙයිඩ් අලි සහීර් මවුලානා මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු සීනිතම්බි යෝහේෂ්වරන් මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු අයි. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා

# පටුන

**පිටු අංකය**


- සභාපතිවරයාගේ සටහන — 01
- සංක්ෂිප්ත වාර්තාව — 03
- කාරක සභාවේ ඉදිරි වැඩපිළිවෙළ — 05
- පොදු නිරීක්ෂණ, නිගමන සහ නිර්දේශ — 09
- විශේෂිත නිරීක්ෂණ, නිගමන සහ නිර්දේශ — 13
- විමර්ශනය කරන ලද එක් එක් ආයතනවල හඳුනාගත් ප්‍රධාන ගැටළු, නිරීක්ෂණ හා නිර්දේශ — 19
- සුචිය — 107

# සභාපතිවරයාගේ සටහන

අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය සඳහා වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව 2015 නොවැම්බර් මස 26 වැනි දින එහි කටයුතු ආරම්භ කල අතර විමර්ශන පැවැත් වූ පළමු කාර්තුවේදී එනම් 2016 ජනවාරි මස 09 වැනි දින සිට 2016 අප්‍රේල් මස 07 වැනි දින දක්වා රාජ්‍ය ආයතන 38 ක් පිළිබඳ විමර්ශන 41 ක් පවත්වන ලද අතර, 2016 සැප්තැම්බර් මස 22 වැනි දින එම පළමු වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. මෙම කෙටි කාලය තුළ කාරක සභාව විසින් රජයේ ආයතනවල මූල්‍ය විනය පවත්වාගෙන යාම සඳහා ඇති කළ බලපෑම මගින් බොහෝ ආයතන අත්පත් කර ගෙන ඇති සතුටුදායක කාර්යසාධනය හා ධනාත්මක වර්ධනය පිළිබඳව මම අතිශයින් සතුටට පත් වෙමි.

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ඊළඟ පියවර ලෙස 2016 මැයි මස සිට ඔක්තෝම්බර් මස දක්වා පැවැත්වූ විමර්ශනයන් 36 ක් පදනම් කර ගෙන සකසන ලද කාරක සභාවේ දෙවන වාර්තාව අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හැකි වීම සතුටට කරුණකි.**

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ විමර්ශනය යටතට ගැනෙන 842ක් වූ ප්‍රධාන රාජ්‍ය ආයතන සියල්ල වසරක් තුළ කාරක සභාව ඉදිරියට කැඳවීම ප්‍රායෝගික නොවන බැවින්, ඒ සඳහා අභිනවයෙන් හඳුන්වා දෙන ලද, පරිගණක මෘදුකාංග යෙදුම් මඟින් ආයතනයන්හි තොරතුරු මාර්ගගත ක්‍රමයට (Online) ලබා ගැනීම, තෝරාගත් නිර්ණායකයන් මත ආයතන මූලික ඇගයීමකට ලක් කිරීම තුළින් ආයතන සමඟ අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම, ආයතන කැඳවීමේ නව ක්‍රමවේද සැකසීම මෙන්ම පළාත් සභා හා පළාත් පාලන ආයතන කාරක සභාව ඉදිරියට කැඳවීම සක්‍රිය කිරීම මගින් නව ජවයකින් යුක්තව කටයුතු කරන කාරක සභාව, ආයතන තුළ පරිගණක මෘදුකාංග වැඩසටහන් භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා උනන්දු කිරීම හේතුවෙන් මේ වන විටත් එම වැඩසටහන් බොහෝ ආයතන තුළ ක්‍රියාත්මක වීමද බෙහෙවින් අගය කළ යුත්තකි.

කාරක සභාවේ ප්‍රධාන අරමුණ වන්නේ පශ්චාත් විමර්ශනයන් කිරීම පමණක් නොව, ආයතන තුළ පවතින අක්‍රමිකතා හා දුර්වලතා අවම කර ගනිමින් ඒවායේ ප්‍රගතිය ඇති කිරීම බවද මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණකි.

රාජ්‍ය ආදායමට වැඩිම දායකත්වයක් දරණ ප්‍රධාන ආයතනවල පරිගණක යෙදුම් භාවිතය සම්බන්ධව ඇති ගැටලු නිරාකරණය කිරීම, වැඩිදියුණු කිරීම හා එම ආයතන අතර පරිගණක ජාල සම්බන්ධිත ක්‍රියාදාමයක් සැකසීම මගින් ආයතන තුළ සිදුවන දෝෂ, වැරදි හා අක්‍රමිකතා අවම කිරීමත්, එමගින් රජයට ලැබිය යුතු ආදායම වර්ධනය කිරීමත්, එම ආයතන වලින් සේවය ලබා ගන්නා මහජනතාවට උපරිම පහසුව සැලසීමත් යන කරුණු අරමුණු කොට ගෙන, ගරු ඉරාන් වික්‍රමරත්න මහතාගේ සභාපතිත්වයෙන් යුක්තව පිහිටුවන ලද අනු කාරක

සභාවේ වාර්තාව ද 2016 නොවැම්බර් 23 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර, එම වාර්තාව මගින් ඉදිරිපත් කර ඇති නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ අවධානය යොමු වනු ඇතැයි ද අපේක්ෂා කරමි.

2016 වසරේදී කෙටි කාල පරාසයක් තුළ ආයතන 69ක්, කාරක සභාව හමුවට කැඳවා එම ආයතන පිළිබඳ විමර්ශන 74ක් ද ( සලකා බලන ලද වාර්තා සංඛ්‍යාව 212 කි) විශේෂ කරුණු පිළිබඳ විමර්ශන 3ක් ද පැවැත්වීම අභියෝගාත්මක විය. එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ යාන්ත්‍රණය ශක්තිමත් කරමින් යහ පාලනය ස්ථාපිත කරනු වස්, කාරක සභාව විසින් ප්‍රශංසාත්මක දායකත්වයක් ලබා දී ඇති බව මගේ හැඟීමයි.

ආයතනවල කටයුතු විමර්ශනයෙන් අනතුරුව, ඒවා පිළිබඳ කාරක සභාව විසින් ලබාදෙනු ලබන නිර්දේශ ඍණාත්මක බවට පැවති මතවාදය බිඳ දමමින්, සිය මූල්‍ය කටයුතු හා කාර්ය සාධනය යහපත් මට්ටමකින් පවත්වාගෙන යනු ලබන ආයතන අභිප්‍රේරණය සඳහා මෙන්ම එම ආයතන ප්‍රශංසාවට ලක් කිරීම සඳහා ද කාරක සභාව නොපැකිලිව කටයුතු කෙරේ.

පක්ෂ භේදයකින් තොරව ඉතා ඕනෑකමින් හා කැපවීමෙන් කාරක සභාවේ කටයුතු ඉටු කළ කාරක සභාවේ සභික මන්ත්‍රීවරුන්ට මාගේ ස්තුතිය පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කර ගන්නා අතර පාර්ලිමේන්තුවේ මහලේකම්, නියෝජ්‍ය මහලේකම්, සහකාර මහ ලේකම්වරුන් ඇතුළු කාරක සභාවේ කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කරන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයටද මාගේ කෘතඥතාව පිරිනමමි.

එසේම කාරක සභාවේ කාර්යභාරය වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටු කිරීම සඳහා උපරිම සහයෝගය ලබා දෙන විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ද මහා භාණ්ඩාගාරයේ සියළුම නිලධාරීන්ද කෘතවේදීව සිහිපත් කරමි.

වත්මන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සැලසුම් කරන ලද නව මානයන් ඔස්සේ මේ දක්වා සාර්ථක අන්දමින් කටයුතු කර ඇති බවත්, එම තත්වයන් තව දුරටත් ප්‍රවර්ධනය කර ගනිමින් සිය ඉදිරි කටයුතු සඳහා නවීන තාක්ෂණික ක්‍රමවේදයන් වෙත ද අනුගත වෙමින්, නවමු ආකාරයෙන් කටයුතු කිරීම පිණිස රාජ්‍ය ආයතන යොමු කරවීම සඳහා කාරක සභාව බලාත්මක කිරීමට අදහස් කරන බවත් මෙහිලා සතුටින් දන්වනු කැමැත්තෙමි.

**ලසන්ත අලගියවන්න**
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති

# සංක්ෂිප්ත වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති රාජ්‍ය මූල්‍ය පාලන බලය අධීක්ෂණය කරමින් ක්‍රියාත්මක කරවන, ප්‍රධානතම කාරක සභාවක් වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ මූලික කාර්ය වනුයේ විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබෙන විගණන වාර්තා සහ රාජ්‍ය ආයතනවල කාර්ය සාධනය විමර්ශනය කිරීම, සමාලෝචනය කිරීම සහ වගවීමට බැඳී සිටින රාජ්‍ය නිලධාරීන් සහ අදාළ ලේඛන පරීක්ෂාවට ලක්කොට, අදාළ කාර්යයන් වල මූල්‍ය හා භෞතික කාර්ය සාධනය, සකසුරුවම, කාර්යක්ෂමතාවය, ඵලදායිතාවය මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීමේදී යම් දූෂණ, අක්‍රමිකතාවයන් හෝ නීති රීති, රජයේ මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උල්ලංඝනය වීම් සිදුව ඇත්ද යන්න පරීක්ෂා කොට ඒවා නිවැරදි කිරීම සඳහා නිර්දේශ නිකුත් කිරීමයි.

ඒ සඳහා, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක **125** යටතේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙහි කාර්යභාරය පහත සඳහන් පරිදි බලාත්මක කර ඇත.

> ***"125 (2)** මෙම කාරක සභාවේ කාර්යය වනුයේ පොදු වියහියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් දෙන ලද මුදල් ඒ ඒ කටයුතුවලට යෙදූ පිළිවෙළ දැක්වෙන ගිණුම් ද පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ලද අනිකුත් ගිණුම් වලින් කාරක සභාව සුදුසු යැයි සලකන ගිණුම් ද ඒ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා ද පළාත් පාලන ආයතන පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තා ද පරීක්ෂා කිරීමයි"*
>
> ***කවර හෝ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක හෝ පරීක්ෂාවට භාජනය කරන ලද ගිණුම්, මුදල් තත්ත්වය මුදල් කටයුතු පිළිබඳ කාර්යය පරිපාටි හා සාමාන්‍ය කළමණාකාරීත්වය ගැන ද ඒ අනුව පැන නගින කවර හෝ කරුණක් ගැන ද මෙම කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.***
>
> ***කාරක සභාව විසින් නියම කරනු ලබන කවර හෝ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රාදේශීය බල මණ්ඩලක සියළුම ගිණුම් , මුදල් තත්ත්වය හා කළමණාකාරිත්වය පරීක්ෂා කර කාරක සභාවට වාර්තා කිරීම පිණිස කාරක සභාවට අවශ්‍ය යැයි හැඟීගිය විටක කාරක සභාවේම සාමාජිකයන්ගෙන් සමන්විත අනු කාරක සභා පත් කිරීම කාරක සභාවට කළ හැකිය.***
>
> ***කාරක සභාවට හෝ එහි කිසියම් අනුකාරක සභාවකට ඊට අයත් කාර්යය ඉටු කිරීම පිණිස කවර හෝ පුද්ගලයෙකු කැඳවා ප්‍රශ්ණ***

***කිරීමේ බලයත් කවර හෝ ලිපියක් පොතක් ,ලේඛණක් හෝ වෙනයම් ලියවිල්ලක් ගෙන්වා පරීක්ෂා කිරීමේ බලයත් ගබඩාවලට සහ වෙනත් දේපලවලට පිවිසීමේ බලයත් කාරක සභාවටත් එහි අනු කාරක සභාවලටත් තිබිය යුතුය."***

ඒ අනුව අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවන වාර්තාව පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබයි.

කාරක සභාවේ අධීක්ෂනයට අයත්වන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන සහ පළාත් සභා අතුරින් ආයතන 69 ක් 2016 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාල සීමාව තුලදී විමර්ශනයට භාජනය කරන ලදී. ඒ අතරින් 2016 මැයි මස සිට ඔක්තෝම්බර් මස දක්වා ආයතන 31 ක් වෙනුවෙන් හා විශේෂ කරුණු 3ක් පිළිබඳව නිකුත් කරන ලද විගණකාධිපතිවරයාගේ වාර්තා වල සඳහන් කරුණු සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශන 36 ට අදාළව, ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ ලිඛිත හා වාචික පැහැදිලි කිරීම්වලට අදාළව මෙන්ම කාරක සභාවට ලැබෙන වෙනත් තොරතුරුවලට අදාළව සිදුකළ විමර්ශනයන් සහ ඒ සඳහා ලබාදෙන ලද කාරක සභාවේ අදහස්, නිර්දේශ හා නියෝගද කාරක සභාව ඉදිරියට කැඳවා ඇති ආයතන අත්පත් කර ගෙන ඇති ප්‍රගතිය හා කාරක සභාව විසින් ඉටු කිරීමට බලාපොරොත්තු වන ඉදිරි වැඩපිළිවෙලද මෙම වාර්තාවේ අන්තර්ගත වේ.

මෙම වාර්තාව මගින් හෙළිදරව් කරන කරුණු හේතුවෙන් රාජ්‍ය ආයතන තුළ තවදුරටත් පවතින්නා වූ අඩුපාඩුකම් හා අක්‍රමිකතාවයන් අවම කර ගනිමින් යහපත් මූල්‍ය විනයක් මෙන්ම ඵලදායී කාර්ය සාධනයක් පවත්වාගෙන යනු ඇතැයි ද, ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති හා තීන්දු තීරණ ගනු ඇතැයි ද කාරක සභාව සිය විශ්වාස පළ කරයි.

# කාරක සභාවේ ඉදිරි වැඩපිළිවෙල

## 01. පළාත් සභා, පළාත් පාලන ආයතන හා පළාත් සභා යටතේ පවතින අනු ආයතන පිළිබඳ තොරතුරු ලබා ගැනීම, ඇගයීම සහ විමර්ශනය කිරීම.

පසුගිය කාල වකවානුවේ නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ පළාත් පාලන ආයතනවල මානව, මූල්‍ය හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ලබා ගත් තොරතුරු පරිගණක ගතකර ලකුණු දීම තුළින් ඇගයීමක් කර ඒ අනුව එම ආයතන කාරක සභාව ඉදිරියට කැඳවීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදී.

වර්තමානයේ ඉන් ඔබ්බට ගොස් එම ක්‍රියාවලිය සඳහා පළාත් සභා සහ පළාත් සභා යටතේ පවතින අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අරමුදල්, ප්‍රඥප්ති සහ අධිකාරි පිළිබඳ ඇගයීමක් කිරීමටද කාරක සභාව දැනටමත් කටයුතු කර ඇති අතර, 2017 වසර වනවිට එම ආයතන ලවා සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලි සෘජුවම පරිගණක මාර්ගගත ක්‍රමයට (online) කාරක සභාව වෙත ගෙන්වා ගැනීමටත්, විගණකාධිපතිවරයා විසින් සෘජුවම මේ හා සම්බන්ධ වී අදාළ තොරතුරු පිළිබඳ අධ්‍යනය කිරීමටත්, සිය මතය ඇතුලත් වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් නියමිතය.

මෙමඟින් ආයතන ඇගයීමට අමතරව අදාළ ආයතනවල පවතින මූල්‍ය විනය හා කාර්ය සාධනය පිළිබඳව අවබෝධයක් ලබා ගෙන ඒවායේ පවතින දුර්වලතා අවම කර ගැනීමටත්, පවතින අවස්ථා වලින් නිසි ප්‍රයෝජන ගැනීමට මඟ පෙන්වීමටත් කාරක සභාව අදහස් කරයි.

එසේම කාරක සභාව විසින් සක්‍රීය කරන ලද පළාත් සභා සහ පළාත් පාලන ආයතන කාරක සභාව වෙත කැඳවීමේ ක්‍රියාවලිය නොකඩවා ඉදිරියට ගෙන යාමටත්, ඒ කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමටත් කාරක සභාව අදහස් කරයි.

## 02. රජයේ ගිණුම් පිළිබද කාරක සභාවේ වෙබ් අඩවිය මගින් මහජන සම්බන්ධතා ගොඩනගා ගැනීම.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා විසින් සෑම ඉදිරි මාසයක් තුලදීම කාරක සභාව ඉදිරියට කැඳවීමට අදහස් කරන ආයතන නාමාවලිය කාරක සභා වෙබ් අඩවිය මගින් ඊට මාසයකට පෙර ප්‍රසිද්ධ කිරීමට බලාපොරොත්තු වන අතර එමගින් එම ආයතන පිළිබඳ පවතින මහජන අදහස් කාරක සභාව වෙත ලබා ගැනිමට කටයුතු කිරීම මඟින් අදාළ ආයතනවල පවතින සැබෑ තත්ත්වය පිළිබඳ අදහසක් ලබා ගැනීමටත්, මෙම අදහස් අදාල ආයතන කාරක සභාව ඉදිරියට කැඳවීමේ නිර්නායකයක් ලෙස යොදා ගැනීමටත් ඒ පිළිබඳව විමර්ශනය කර සිදු විය හැකි අක්‍රමිකතා අවම කිරීමටත්, ආයතනවල කටයුතු ක්‍රමානුකූල කිරීමට පියවර ගැනීමටත් කාරක සභාව අදහස් කරයි.

## 03. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති වාර්තා පිළිබඳ විමර්ශනය කිරීම.

විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලබන ආයතන පිළිබඳව සකස් කරන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පසු එම විගණන වාර්තා පදනම් කර ගෙන අදාළ ආයතන විමර්ශන කිරීමට රජයේ ගිණුම් කාරක සභාව ඉදිරියට කැඳවනු ලබයි. එවැනි සියළුම වාර්තා විමර්ශනය කිරීමේ ප්‍රායෝගික අපහසුතාවයක් පවතින මුත්, ඉදිරියේ දී හැකිතාක් දුරට එම වාර්තා සියල්ලම විමර්ශනය කිරීමට කාරක සභාව අදහස් කරයි. දැනටමත් ඒ සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති බව පැහැදිලි වේ.

*2005 – 2016 ඔක්තෝම්බර් මස දක්වා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රධාන වියදම් ඒකක සම්බන්ධව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති විගණන වාර්තා සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද සහ විමර්ශනය කළ යුතුව ඇති වාර්තා පිළිබඳ සංක්ෂිප්ත සටහන.*

| රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව යටතට ගැනෙන ආයතන | 2015.12.31 දිනට පැවති වාර්තා සංඛ්‍යාව | 2005-2015 දක්වා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ මුත් මෙතෙක් විමර්ශනය නොකළ වාර්තා | 2016 වර්ෂයේ ඔක්තෝබර් දක්වා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තා සංඛ්‍යාව | 2016 ඔක්තෝබර් වන විට විමර්ශනය කළ වාර්තා සංඛ්‍යාව | 2016 වන විට විමර්ශනය කිරීමට ඇති ඉතිරි වාර්තා සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සහ විශේෂිත වියදම් ඒකක** | 159 | 514 | 120 | 175 | 459 |
| **දිස්ත්‍රික් ලේකම් කාර්යාල** | 25 | 51 | 4 | 13 | 42 |
| **පළාත් පාලන ආයතන** | 335 | 11 | 7 | 5 | 13 |
| **පළාත් සභා** | 9 | 76 | 32 | 19 | 89 |
| **එකතුව** | 528 | 652 | 163 | 212 | 603 |

## 04. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් දෙනු ලබන නියෝග සහ නිර්දේශවල ක්‍රියාත්මකභාවය සහ අදාළ වාර්තා සැපයීම.

රජයේ ගිණුම් කාරක සභාව විසින් ආයතන කැඳවීමේදී එම ආයතන සඳහා දෙනු ලබන නියෝග සහ නිර්දේශ ඉටුකිරීම පිළිබඳවත් කාරක සභාව කැඳවන වාර්තා නියමිත කාලසීමාව තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කර තිබේද යන්න

විමසා බැලීම සඳහා පසුවිපරම් ක්‍රමවේදයක් ආරම්භ කිරීමට අදහස් කරන අතර, දැනට ඒ සඳහා මූලික පියවර ගෙන ඇත.

2016 වර්ෂය තුළදී කාරක සභාව විසින් විමර්ශනය කරන ලද ආයතන 70 න් වාර්තා 234 ක් කැඳවා ඇති අතර, 2016.11.18 දිනට වාර්තා 91 ක් ලැබී ඇත. කාරක සභාවේ පසුවිපරම් ක්‍රියාවලිය සක්‍රීයව පවතින බැවින් ලැබී නොමැති වාර්තා පිළිබඳව නිරන්තර අවධානය යොමුකර, නියමිත කාලය තුළ අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳවද කාරක සභාවේ අවධානය යොමු වී ඇත. ඒ අනුව නොලද හා ප්‍රමාද වූ වාර්තා මෙන්ම අදාළ නිර්දේශයන් ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව සිය අවධානය යොමු කිරීමටත්, ප්‍රමාදයන් වලක්වා ගැනීමටත් පියවර ගැනීම කාරක සභාවේ අරමුණ වී ඇත.

05. **තොරතුරු තාක්ෂණයට අනුගතවීම සඳහා දැනට අනුගමනය කරන කාර්යාවලියෙහි විය යුතු සංශෝධන හඳුනා ගැනීම හා එය සංශෝධනය කිරීමද කාර්යමණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා ඒ සඳහා ඉඩ ප්‍රස්ථා සැලසීම.**

කාරක සභාව විසින් දැනටමත් යොදා ඇති විධිවිධාන ක්‍රියාත්මක කරවීම සඳහාද ඉදිරි කාලයේදී කෙටි කාලීනව හා මධ්‍ය කාලීනව අනුගමනය කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාදාමයන්ට ගැලපෙන සේ විශේෂයෙන් පරිගණක ජාලගත නියාමනය සඳහා මෙතෙක් පැවති ක්‍රියාවලීන්හි ඇති විය යුතු සංශෝධ ඇති කිරීම ද ඒ හා සම්බන්ධිත කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් පුහුණුවීම් ලබාදීම ද අත්‍යාවශ්‍ය කරුණක් බව කාරක සභාව අවධාරණය කර සිටී.

# පොදු නිරීක්ෂණ, නිගමන සහ නිර්දේශ

## 1. විගණන හා කළමනාකරණ කමිටු

අංක DMA (2009) (1) හා 2016.06.09 දිනැති මුදල් චක්‍රලේඛ අනුව වසරකට විගණන හා කළමනාකරණ කමිටු හතරක් පැවැත්වීම අනිවාර්ය වුවද එසේ සිදු නොවන බවත්, ඇතැම් ආයතනවල අභ්‍යන්තර විගණක තනතුරක් පවා නොමැති බවත් නිරීක්ෂණය විය. එසේම පළාත් පාලන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු දිස්ත්‍රික් කාර්යාලවල පවත්වා ඇති බවද නිරීක්ෂණය විය.

පළාත් පාලන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු දිස්ත්‍රික් කාර්යාලවල පැවැත්වීම ප්‍රමාණවත් නොවන බව අවධාරණය කරන කාරක සභාව ඒවා ආයතනික මට්ටමින් පැවැත්වීමේ අවශ්‍යතාවයත් පවතින අඩුපාඩු හඳුනාගනිමින් නිවැරදි කිරීමත් ආයතනයක ප්‍රධාන ගණන් දීමේ නිලධාරීයාගේ වගකීම බවත් කාරක සභාව අවධාරණය කරයි.

## 2. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම

කාරක සභාව ඉදිරියට ආයතන කැඳවීමේදී එම ආයතන විසින් විගණන විමසුම් නොලද බවත්, යවන ලද පිළිතුරු විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත නොලැබුණු බවත්, සාක්ෂි විමසීමේදී අනාවරණය විය. මෙලෙස පිළිතුරු සැපයීමේදී අතරමගදී සිදුවන ප්‍රමාදයන් හෝ අස්ථානගත වීම් පිළිබඳ අවධානය යොමු විය යුතු අතර, මේ තත්ත්වය වළක්වා ගැනීමට විගණකාධිපති වෙත පිළිතුරු ලද බවට සනාථ කර ගැනීමේ ක්‍රමවේදයක් අත්‍යාවශ්‍ය බවත්, ඒ සඳහා දෙපාර්ශ්වයම සාකච්ඡා කර නිසි වැඩපිළිවෙලක් සකසා ගත යුතු බවට කාරක සභාව නිර්දේශ කරයි.

## 3. ආරම්භ කර අතරමග නවතා දමන ලද හෝ පාඩු ලබන ව්‍යාපෘති

විශාල ආයෝජනයක් සිදු කර ආරම්භ කරන ලද විවිධ ව්‍යාපෘති පසු කාලීනව පාඩු ලබන අවස්ථා මෙන්ම අතරමග නවතා දමන ලද අවස්ථාද බහුලව නිරීක්ෂණය විය.

මේ තත්වය වැළැක්වීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳව ගැඹුරින් අධ්‍යනය කර දේශපාලන න්‍යාය පත්‍රයන් පෙරදැරි කරගෙන වැඩකිරීම පසෙකලා රටේ හිතසුව පිණිස තීරණ ගත යුතු බවත්, ශක්‍යතා වාර්තා ලබා ගෙන ඒ සඳහා සැලසුම් සකස් කිරීමේදී ප්‍රායෝගික දත්ත හා කාලවකවානු අනුව සකස් කළ යුතු බවත්, ක්‍රියාත්මක වීමේදී නිරන්තරයෙන්ම පසුවිපරම් සිදුකළ යුතු බවටත්, නිර්දේශ කරන කාරක සභාව වසා දමා ඇති හෝ දිගින් දිගටම පාඩු ලබන ව්‍යාපෘති ඇත්නම් ඒවා වෙනත් කාර්යයක් සඳහා යොමු කර පාඩු අවම කර ගැනීම හෝ ලාභ ලබා ගැනීම සඳහා පියවර ගත යුතු බවටත් අවධාරණය කරයි.

## 4. සේවක පුරප්පාඩු

විමර්ශනය කරන ලද ආයතන අතුරින් 90%ක පමණ සේවක පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය.

මේ සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවට නිර්දේශ කරන කාරක සභාව ආයතනයේ ඉදිරි වැඩ පිළිවෙල හා අපේක්ෂාවන් අරමුණු කරමින් සැලසුම් සකස් කර ඒ අනුව අවශ්‍ය සේවක සංඛ්‍යාව තීරණය කළ යුතු බවත්, සේවකයින්ගේ වයස් සීමාවන් මෙන්ම ඔවුන් විශ්‍රාම යන හෝ උසස්වීම් ලබන කාලසීමා පිළිබඳවද අවධානය යොමු කළ යුතු බවත්, අනාගත සේවක සංඛ්‍යාව පුරෝකථනය කර බඳවා ගැනීම් සහ උසස් වීම් සැලසුම් කළ යුතු බවටත් නිර්දේශය කරයි.

## 5. පළාත් සභා සහ පළාත් පාලන ආයතන

### අ. පළාත් පාලන ආයතන සඳහා නීති නිලධාරී තනතුරු

ප්‍රාදේශීය සභා සහ නගර සභාවලට අනුයුක්තව නීති නිලධාරීන් නොමැති වීම නිසා බොහෝ අවස්ථාවලදී නියෝග ක්‍රියාත්මක කිරීමේ හා ගැටළු විසඳීමේ ප්‍රමාදයන් සිදුවන බව නිරීක්ෂණය වූ අතර පළාත් සභාවල නීති නිලධාරීන් හට ප්‍රාදේශීය සභාවල කටයුතු ද ආවරණය කිරීමට සිදුව ඇත. වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සඳහා නගර සභා සහ ප්‍රාදේශීය සභාවල නීති කටයුතු ආවරණය කිරීමට දිස්ත්‍රික් සහකාර කොමසාරිස්වරයකු යටතේ නීති නිලධාරියෙකු ලබාදීමේ අවශ්‍යතාවය සහ පළාත් සභාවලට අනුයුක්ත නීති නිලධාරින් සංඛ්‍යාව වැඩි කිරීම පිළිබඳ අවධානය යොමු කළ යුතු බව කාරක සභාව අවධාරණය කරයි.

### ආ. මහජන සෞඛ්‍ය නිලධාරීන් පත් කිරීම

වර්තමානයේ නගර සභා සහ ප්‍රාදේශීය සභාවලට මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු අනුමත වී නොතිබීම මෙවන් පාරිසරික ගැටළු පවතින අවධියක බලවත් අඩුපාඩුවක් බව නිරීක්ෂණය කළ කාරක සභාව, ප්‍රාදේශීය සභා සහ නගර සභා බල ප්‍රදේශ ආවරණය කළ හැකි වන පරිදි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් ද සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් යටතේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ද පත් කළ යුතු බවත්, අවශ්‍යතාවය මත ප්‍රමාණය තීරණය කළ යුතු බවත් නිර්දේශ කරයි.

### ඇ. ඉඩම් කැබලි කර විකිණීම

පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ඉඩම් කැබලි කර විකිණීම සුලභව සිදු වන අතර, එම ඉඩම්වල ජලය ගලා බැසයාමේ ක්‍රම සහ පොදු පහසුකම් පිළිබඳ වැඩි අවධානයක් යොමු නොවන බව නිරීක්ෂණය වී ඇත. පොදු පහසුකම් වෙනුවෙන් වෙන් කෙරෙන ඉඩම් කැබලි බොහෝ විට භාවිතයට ගත නොහැකි මඩවගුරු වැනි ස්ථාන බව හෙළි වී ඇත.මෙම තත්වය වලක්වා ගැනීම සඳහා

සපුරලිය යුතු අවශ්‍යතා සම්පූර්ණ කරන තෙක් ඒ සඳහා අනුමැතිය ලබා දීම අත්හිටුවන ලෙසට කාරක සභාව නිර්දේශ කරයි.

**ඈ. <u>රජයට අයත් අභාවිත නිල නිවාස අබලන්වීම</u>**

අවශ්‍ය පහසුකම් නොමැතිකම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් නිල නිවාස නිලධාරීන් විසින් භාවිතයට නොගෙන අබලන්ව පවතින බවත් ඇතැම් නිවාස නියමාකාරයෙන් පවරා ගෙන නොමැති බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය. ඒ අනුව පවරා ගැනීම් හැකි ඉක්මණින් නිමා කරන ලෙසත්, භාවිතයට නොගන්නා නිල නිවාස හඳුනාගෙන ඒවා සුදුසු නිලධාරීන්ට ලබා දීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කරන ලෙසත්, නිවෙස්වලට අවශ්‍ය සියළු පහසුකම් ලබාදිම මෙන්ම නිරන්තර අළුත්වැඩියාව හා අධීක්ෂණයට භාජනය කළ යුතු බවත් කාරක සභාව නිර්දේශ කරයි.

**ඉ. <u>වරිපනම් ඒකක / දැන්වීම් පුවරු ආදායම්/ දුරකථන කුළුණු</u>**

පළාත් සභා, මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයන්හි ඇති වරිපනම් ඒකක ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව හඳුනාගෙන නොමැති බැවින් රජයට හිමිවිය යුතු ආදායම් අහිමි වන බව, නිරීක්ෂණය කළ කාරක සභාව දැන්වීම් පුවරු, දුරකථන කුළුණු වැනි ආදායම් ඒකක ස්ථාපිත කර ඇති ස්ථාන හඳුනා ගැනීම සඳහා ග්‍රාමසේවා නිලධාරීන්ගේ සහාය ලබා ගැනීම, නිවැරදි තක්සේරුවක් මගින් වටිනාකම් නැවත නිශ්චය කිරීම, රජයට හිමිවිය යුතු ආදායම් වැඩිකර ගැනීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලෙස නිර්දේශ කරයි.

එසේම සියළු පළාත් පාලන ආයතන ඒකාබද්ධ කළ පරිගණක මෘදුකාංග වැඩසටහනක් මඟින් කාර්යක්ෂම කිරීමේ අවශ්‍යතාවය වැඩිදුරටත් අවධාරණය කරයි.

**ඊ. <u>කසල කළමනාකරණය</u>**

මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල කුණු කසල ඉවත් කිරීම සඳහා විශාල මුදලක් වැය කරන අතර එමගින් ආදායම් උත්පාදනය කර ගන්නා පළාත් පාලන ආයතන ඇති බවද නිරීක්ෂණය විය. කසල බැහැර කිරීම ඉතා ගැටළුකාරී තත්ත්වයකට පත්ව ඇති අවධියක කසල වර්ගීකරණය කිරීමට ග්‍රාමීය මට්ටමෙන් දිරිගැන්වීම සහ උපදෙස් ලබා දීම, නිශ්චිත දිනකදී කසල එකතු කිරීම, රැස් කරන ස්ථාන ඇති කිරීම,ප්‍රතිචක්‍රීයකරණය කිරීම ආදිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු බවත්, මේ සම්බන්ධයෙන් රජය ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු බවත්, නව නීතිරීති සම්පාදනය කළ යුතු බවත්, නිර්දේශ කරන කාරක සභාව කසල වර්ගීකරණය හා ප්‍රතිචක්‍රීයකරණ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ අවශ්‍යතාවය දැඩිව අවධාරණය කරයි.

මුහුදු සීමාවේ සිට මීටර 300 ක් ගොඩබිම දෙසටත්, කිලෝමීටර් 2 ක් මුහුද දෙසටත් වන වෙරළ කලාපීය ප්‍රදේශය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අයත් වුවද එහි රැස්වන කසල ඉවත් කිරීමේ කාර්යභාරය අදාළ පළාත් පාලන ආයතනවලට පැවරෙන බව අනාවරණය විය.

දෙපාර්තමේන්තුවේ පරිපාලන කලාපය නවීන තාක්ෂණය උපයෝගී කරගෙන සිතියම් ගත කළ යුතු බවත්, ඒ සම්බන්ධයෙන් අධ්‍යනයක් කර ආරක්ෂක නියාමකයින් සහ ග්‍රාම නිලධාරීන් මෙම කාර්යයන් නියාමනය කිරීම සඳහා ද යොදවන ලෙසත්, අදාළ පළාත් පාලන ආයතන සමඟ යහපත් සම්බන්ධීකරණයක් තුළින් කසල කළමනාකරණය වඩා ක්‍රමවත් කිරීම සඳහා පියවර ගත යුතු බවත්, කාරක සභාව නිර්දේශ කරයි.

**උ. <u>පළාත් පාලන ආයතන සඳහා ගණකාධිකාරිවරුන්/ අභ්‍යන්තර විගණකවරුන් පත් කිරීම</u>**

රුපියල් බිලියනයකට වැඩි ප්‍රමාණයක වාර්ෂික ආදායමක් පවතින සියලුම පළාත් පාලන ආයතන වලට අධි ශ්‍රේණියේ ගණකාධිකාරිවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන් පත් කිරීම සඳහා පියවර ගත යුතු බවත්, එමගින් වංචා, දූෂණ සහ අක්‍රමිකතා ඇති වීමේ ඉඩකඩ ඇහිරීමටත්, ප්‍රමිතියකින් යුතු මූල්‍ය පාලනයක් ඇති කළ හැකි බවත්, කාරක සභාව අදහස් කරයි.

# විශේෂිත නිරීක්ෂණ, නිගමන සහ නිර්දේශ

## 1) හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරක් විසින් ලියාපදිංචි කර තිබූ ඉඩම් දීමනා පත්‍ර 610 ක් හා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි නොකළ ඉඩම් දීමනා පත්‍ර 337 ක් ඒවායේ හිමිකරුවන්ට බෙදා දීමට කටයුතු කර නොමැති බවත් ඉන් සමහරක් වසර 32 ඉක්මවා ඇති බවත් හෙළි විය.

මේ සඳහා ප්‍රමාදවීමට තුඩු දුන් හේතු සොයා බලා ඒවාට කඩිනම් පියවර ගන්නා ලෙසත්, මෙම කටයුතු සඳහා වෙනම නිලධාරියකු අනුයුක්ත කර එම කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නා ලෙස කාරක සභාව නිර්දේශ කරයි.

## 2) නීතිපති දෙපාර්තමේන්තුව

ආයතනවල මූල්‍ය අක්‍රමිකතා සහ වෙනත් පරිපාලනමය ගැටළු ඇති වූ අවස්ථාවලදී ඒ සඳහා උපදෙස් ලබා ගැනීමේ අරමුණින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන කරුණු පිළිබඳව පසුවිපරම් කිරීමේ දුර්වලතාවයන් මෙන්ම ප්‍රමාදයන් පවතින බව කාරක සභාව නිරීක්ෂණය කළේය. මේ හේතුවෙන් ආයතන තුළ පවතින දූෂණ හා රාජ්‍ය මුදල් අවභාවිතය වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රමාදයක් ඇති වන බැවින් එම අක්‍රමිකතා දිගු කාලීනව පැවතීමේ අවස්ථාවන් උද්ගත වන බව නිරීක්ෂණය විය.

මෙම ප්‍රමාදයන් වැළැක්වීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය සම්පත් ලබා දීම සිදු කළ යුතු වන අතර, නිසි අධීක්ෂණයක් යටතේ පරීක්ෂණ සිදු වීම සඳහා අප්‍රමාදව නීතිපති උපදෙස් ලබා දීම අත්‍යවශ්‍ය කරුණක් බව කාරක සභාව අවධාරණය කරයි.

## 3) මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

අස්ථානගත වූ ලිපි ගොනු සියල්ල මේ වන විටත් සොයා ගැනීමට නොහැකි වී ඇති අතර, වාහන ලිපිගොනු අස්ථානගත වීම පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද කමිටුවේ ප්‍රධානියා ලෙස අදාළ වකවානුවේ එම ප්‍රශ්නගත කාර්යයන්වල නිරත වූ නිලධාරියෙකු පත් කිරීම පිළිබඳව කමිටුවේ අප්‍රසාදය පළ විය.

විමර්ශන කමිටුව විසින් සකස් කළ වාර්තාව තමා වෙත ලැබී ඇති බවත්, එම වාර්තාව පිළිබඳ තමාට සෑහීමකට පත්විය නොහැකි බැවින් ඒ සඳහා වෙනත් නිලධාරියෙකු මගින් එම කටයුතු නැවත විමර්ශනය කරන බවට ප්‍ර.ග.නි. විසින් කළ ප්‍රකාශය අනුමත කළ කාරක සභාව මේ සඳහා වහා නිසි ක්‍රමවේදයක් සකස් කරන ලෙසත්, ඉතිරි ලිපි ගොනු සියල්ල විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙසත්, නියෝග කළේය. එසේම මෙම ප්‍රශ්නය නිරාකරණය වන තුරු එහි ප්‍රගතිය විමර්ශනය කිරීම සඳහා ද, මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විශාල

වශයෙන් අක්‍රමිකතා, වංචා සහ දූෂන සිදුවන ආයතනයක් බැවින් ද කාරක සභාවේ නිරන්තර අවධානය යොමු කල යුතු බවට ද තීරණය කරන ලදී.

**4) ශ්‍රී ලංකා ගුවන් /යුධ /නාවික හමුදා**

ත්‍රිවිධ හමුදාව විසින් ඉටුකරනු ලබන විශිෂ්ය සේවාව කාරක සභාවේ විශේෂ ඇගයිමට ලක් වූ අතර ත්‍රිවිධ හමුදාවේ මානව හා මූල්‍ය කළමනාකරන තත්ත්වය වඩා උසස් කිරීමේලා පවත්නා දූර්වලතා අවම කර ගනිමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය ද කාරක සභාව අවධාරණය කළේය.

අ) වර්තමානයේ ත්‍රිවිධ හමුදාවල අභ්‍යන්තර විගණන ඒකක සඳහා සේවයේ යොදවා ඇති නිලධාරීන් හමුදා සේවයට අනුයුක්ත පුද්ගලයන් බව කාරක සභාව නිරීක්ෂණය කළේය. ත්‍රිවිධ හමුදාවේ රැකියා ශ්‍රේණිවල පවතින තනතුරු බලය පිළිබඳ අවධානය යොමු කළ කාරක සභාව ත්‍රිවිධ හමුදාවට අභ්‍යන්තර විගණන අංශ ශක්තිමත් කිරීමට ගණකාධිකාරි සේවයේ සිවිල් නිලධාරීන් පත් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරයි.

ආ) භාණ්ඩ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට හා මූල්‍ය රෙගුලාසිවලට පටහැනිව පූර්ව ගෙවීම් සිදු කිරීම නිරීක්ෂණය වූ අතර, නියමිත ක්‍රමවේදය අනුව මිලදී ගැනීම් සිදු කරන ලෙසත්, විශේෂ හෝ හදිසි අවස්ථා නොවන්නේ නම් හැකිතාක් දුරට පසුගෙවීම් ක්‍රමය අනුගමනය කිරීම සුදුසු බවත් නිර්දේශ කරයි.

**5) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ලිපිගොනු අස්ථානගත වීම හේතුවෙන් ණය ආපසු අය කර ගැනීම හා අභ්‍යන්තර පරීක්ෂණ කටයුතු ඇනහිටීම මෙන්ම වැරදිකරුවන්ට දඬුවම් ලබා දීමේ ප්‍රමාදයන් සිදුවී ඇත. 1984 සිට 2009 කාලය තුල සේවයෙන් ඉවත් කළ නිලධාරීන් පස්දෙනෙකුගේ ණය ලියකියවිලි සහ වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 31 දෙනෙකුගේ ලිපිගොනු සහ වෙනත් හේතූන් මත සේවයෙන් ඉවත් වූ නිලධාරීන් 9 දෙනෙකුගේ ලියකියවිලි අස්ථානගත වීම නිසා එම කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම අපහසු වී ඇත.

අස්ථාන ගත වි ඇති ලිපිගොනු සම්බන්ධයෙන් ඊට වගකිවයුතු නිලධාරින්ට විරුද්ධව වහාම ක්‍රියාමාර්ග ගැනිමටත්, අමාත්‍යාංශ කමිටුවක් මගින් මුදල් අමාත්‍යාංශයේ ද නිර්දේශ සහිතව නීතිපති උපදෙස් මත ගැටළු යොමුකර එම උපදෙස් මත මාස 3ක් තුල මෙම ගැටලුව නිරාකරණය කිරිමට කටයුතු කරන ලෙසට කාරක සභාව නියෝග කළේය.

**6) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

2012 අගෝස්තු 29 දින රු. 1,919,764/- ක වියදම් දරා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපිත කර තිබුණු නමුත්, එහි සේවා කටයුතු නිසි පරිදි ඉටුකරවා නොගැනීම නිසා 2016 ජුනි 01 දින වනවිට සම්පූර්ණ

කැමරා පද්ධතියම අක්‍රියවී පැවති අතර එහි විදුලි රැහැන් ගලවා ඉවත් කර ඇති බවත් නිරීක්ෂණය විය. ආයතනයේ ආරක්ෂක පද්ධතියට ඇති වූ හානියක් වන මෙයට නිසි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වීම ආයතනයේ හා එහි නිලධාරින්ගේ වෘත්තිමය ගරුත්වයට හානියක් බව කාරක සභාව අවධාරණය කරන ලදී. අමාත්‍යාංශය විසින් කැමරා පද්ධතිය පරීක්ෂාවට ලක් කොට වෙනත් රජයේ ආයතනයකට හෝ මෙය ලබා දීමේ හැකියාව සොයා බලන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළ අතර මෙම ආයතනයේ සියලු පරිපාලනය කටයුතු අඩුපාඩුවකින් තොරව ඉටු කිරීමේ වගකීම සහ ආයතනයේ භෞතික හා මානව සම්පත්වල වගකීම දිස්ත්‍රික් ලේකම්වරයාට ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කරන ලදී.

**7) <u>වයඹ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - ඖෂධ කල් ඉකුත්වීම</u>**

වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් රෝහල් 06 ක සහ කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලීය ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් ඒකකයේ ඖෂධ වර්ග 413 ක වටිනාකම රු. 16,945,704/- ක් වූ ඒකක 10,162,768 ක් ද වටිනාකම ගණනය කළ නොහැකිවූ තවත් ඖෂධ වර්ග 53 ක් ද, කල් ඉකුත්වීම, නියැදි සාම්පල අසමත්වීම, පැහැය හා සුවඳ වෙනස්වීම යන කරුණු මත භාවිතයෙන් ඉවත් කර තිබෙන බව කාරක සභාවට අනාවරණය විය.

මෙම ගැටලුව සියලුම පළාත් සභාවල පවතින්නක් බැවින් ඒ සඳහා විධිමත් ක්‍රියාවලියක අවශ්‍යතාව පෙන්වා දුන් කාරක සභාව මේ සඳහා මැදිහත්ව කටයුතු කරන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා හට උපදෙස් ලබා දුන් අතර සියලුම පළාත් සභා කැඳවා මෙම ගැටලුව පිළිබඳ සාකච්ඡා කොට, ඒවා ඇති වීමට හේතු සහ එය වලක්වා ගැනීමට ගතයුතු ක්‍රියා මාර්ග නිශ්චය කළ යුතු බවත්, මේ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා සෘජුවම මැදිහත් විය යුතු බවත්, මෙම තත්ත්වයන් ඇති වීමට හේතු සහ වළක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග හඳුනාගෙන ඒ අනුව රජයට නිර්දේශ ඉදිරිපත් කළ හැකි බවත්, කාරක සභාව නිර්දේශ කරන ලදී.

එසේම කල් ඉකුත් වූ ඖෂධ අදාළ අවසරයන් මත ඒ ඒ කාලසීමාවන් තුළදී අපහරණය කිරීම පිළිබඳව ද ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා විශේෂ අවධානයක් යොමු කළ යුතු බව නිර්දේශ කරයි.

**8) <u>දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව</u>**

2015 වර්ෂය වන විට මහනගර සභාවේ සමස්ත හිඟ ආදායම රු. 917,399,000/- ක්ව පැවතීම.

එයින් වරිපනම් හා බදු ආදායම් හිඟය රු. 344,899,000/- ක්ව පැවතීම.

2012 වසරේදී හිඟ වරිපනම් ආදායමෙන් රු. මිලියන 31 ක් කපා හැරීම.

නගින්දාස් ආයතනයෙන් අය විය යුතුව තිබූ රු. 2 ,900 ,000/- ක් කපා හැරීමට.

මෙම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු යොදා ඇති බවත්, හිඟ වරිපනම් වලින් රු. මිලියන 100 ක් මේ වන විටත් අයකරගෙන තිබෙන බවත්, ගණන් දීමේ නිළධාරියා පැවසීය.

මහ නගර සභාවේ නිර්දේශ මත අදාල මුදල් කපා හැරීමට කටයුතු කළ බව ගණන් දීමේ නිළධාරියා පැවසීය. ඒ පිළිබඳව පළාත් පාලන කොමසාරිස් දැනුවත්ව නොමැති බව නිරීක්ෂණය කළ කාරක සභාව අනුමැතිය ලබා නොගෙන අය විය යුතු වරිපනම් මුදල් කපා හැරීම් පිළිබඳ පූර්ණ පරීක්ෂණයක් සිදු කර ඒ පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙස පළාත් පාලන කොමසාරිස්ට නියෝග කරන ලදි.

### 9) <u>පොලිස් දෙපාර්තමේන්තුව</u>

පොලිස් දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන සේවාව සම්බන්ධයෙන් කාරක සභාවේ විශේෂ ප්‍රසංශාව හිමි විය. සමස්ත කාර්ය මණ්ඩලයේ 16% ක් සහ අභ්‍යන්තර විගණන අංශයේ 64% ක පුරප්පාඩු පැවතිම.අංශ තුනකින් සමන්විත වූ පොලිස් සේවයේ විවිධ අංශවල පුරප්පාඩු 16,000 ආසන්න ප්‍රමාණයක් පවතින අතර නිල සේවයට බඳවා ගැනිමට දැනට පවතින පුහුණු පාසල් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවිම.පොලිස් නිලධාරීන් 3700 ක පමණ පිරිසක් වෙනත් ස්ථානවල ආරක්ෂක කටයුතුවලට යෙදවීමට සිදුවිමෙන් සාමාන්‍ය කටයුතු පවත්වාගෙන යාම ගැටළුවක් වීම.

පොලිස් දෙපාර්තමේන්තුවේ දිගු කලක සිට බඳවා ගැනීමේ හා උසස්විම් ලබා දීමේ ක්‍රමවේදයක් නොපැවතිම මෙන්ම නිලධාරි වැටුප් තත්ත්වය, ප්‍රමාණවත් නිල නිවාස පහසුකම් නොමැතිවිම ආදිය ද මෙම ගැටළුව උග්‍ර විමට හේතු වි ඇති බව නිරීක්ෂණය කළ කාරක සභාව දිස්ත්‍රික්ක තුළ පවතින පොලිස් ස්ථාන සහ ආවරණය වන ප්‍රදේශවල විශාලත්වය ජනගහනය සහ පළාත්වල පවතින භාෂා අවශ්‍යතාවය පිළිබඳව ද අවධානය යොමු කරමින් එක් එක් පොලිස් ස්ථාන හා කාර්යාංශ සඳහා අවශ්‍ය නිලධාරී සංඛ්‍යාව හරියාකාරව තීරණය කළ යුතු බවත්, ඒ අනුව බඳවා ගැනීම් සහ පුහුණු කිරීම් කළ යුතු බවත්, මේ සඳහා රජය විසින් ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු බවටත්, අවධාරණය කරයි.

### 10) <u>ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව</u>

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කිරීම, රැස්වීම් පැවැත්වීම, ගණපූරණය සහ කොමිෂන් සභාවට නියෝජ්‍ය සභාපතිවරු පත් කර නොතිබීම සහ සාමාජිකයන් ලෙස අමාත්‍යාංශ නියෝජනයක් ඇති කිරීම ද, විද්‍යාත්මක කරුණු පිළිබඳ දැනුම ඇති නියෝජිතයන් පත් කිරීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

කොමිෂන් සභාව සාමාජිකයන් 15 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යභාර්ය පිළිබඳ අවබෝධයෙන් යුතුව කාර්යක්ෂම හා අර්ථපූර්ණ අයුරින් කටයුතු කළ හැකි එමෙන්ම පාසල් අධ්‍යාපන

ක්ෂේත්‍රයේ නියැලුනු ප්‍රවීණයන්ද සහිත සංයුතියක් කොමිසම තුළ තිබිය යුතු බව කාරක සභාව අවධාරණය කරයි.

# විමර්ශනය කරන ලද එක් එක් ආයතනවල හඳුනාගත් ප්‍රධාන ගැටලු, නිරීක්ෂණ හා නිර්දේශ

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව 2016 මැයි 04** | | |
| 1. | ප්‍රතිපාදන ඌන උපයෝජනය හා වෙරළ සංරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය | ප්‍රතිපත්තිමය කරුණුවල වෙනස්වීම් සහ විවිධ පාරිසරික තත්වයන් වෙනස්වීම ප්‍රතිපාදන ඌන උපයෝජනයට හේතු වූ බවත් වෙරළ සංරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කොට අවසන් කර ඇති අතර ඒ සඳහා මහජන අදහස් ලබාගැනීමට යොමු කිරීමට නියමිත බවත් ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි.<br>එම ජාතික ප්‍රතිපත්තිය අනුමත කර ගැනීම සඳහා වන ක්‍රියාවලිය ක්‍රියාවට නංවන අයුරු පිළිබඳ දින වකවානු සහිත වාර්තාවක් සති දෙකක කාලයක් තුළ කාරක සභාව වෙත ලබා දෙන ලෙස ප්‍ර.ග.නි. / ග.නි. හට නියෝග කරන ලදි. |
| 2. | වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් පෝට් සිටි ව්‍යාපෘතිය පිළිබඳව පාරසරික ඇගයීම් වාර්තාවක් නිකුත් කර තිබීම හා පෝට් සිටි ව්‍යාපෘතිය හේතුවෙන් සිදුවන පරිසර හානිය හා මුහුදු ඛාදනය | පෝට් සිටි ව්‍යාපෘතියට අදාළව දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇති නිර්දේශ හා කොන්දේසි සහිතව නිකුත් කොට ඇති නව පාරිසරික බලපත්‍රය පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ලබාදෙන ලෙස ප්‍ර.ග.නි/ග.නි. වෙත නියෝග කරන ලදි.<br>ව්‍යාපෘතිය හේතුවෙන් සිදුවන මුහුදු ඛාදනය වැලැක්වීම සඳහා ගෙන ඇති පියවර සම්බන්ධ විස්තර ඇතුලත් වාර්තාවක් කාරක සභාව වෙත එවන මෙන් ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 3. | දෙපාර්තමේන්තුව මගින් වෙරළ කලාපය තුළ රැස්වන කසළ ඉවත් කිරීම සඳහා යොදා ඇති වැඩපිළිවෙල සහ වෙරළ සංරක්ෂණය සඳහා ගෙන ඇති පියවර | මුහුදු සීමාවේ සිට මීටර 300 ක් ගොඩබිම දෙසටත් කි.මී. 2 ක් මුහුද දෙසටත් වන වපසරිය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පරිපාලනයට යටත් වුවද එම භූමියේ කසළ ඉවත්කිරීමේ කාර්ය භාරය අදාළ පළාත් පාලන ආයතන වලට පැවරෙන බව ග.නි. විසින් පෙන්වා දෙන ලදි.<br>දෙපාර්තමේන්තුවේ පරිපාලන කලාපය නවීන තාක්ෂණය උපයෝගී කරගෙන සිතියම් ගත කරන ලෙසත් ඒ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත එවීමට කටයුතු කරන ලෙසත් කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. වෙරළ ආරක්ෂක නියාමකයින්, ග්‍රාම නිලධාරීන් මෙම කාර්යයන් නියාමනය සඳහා යොදවන ලෙසත් අදාළ පළාත් පාලන ආයතන සමඟ යහපත් සම්බන්ධීකරණයක් තුලින් කසල කළමනාකරණය සඳහා පියවර ගන්නා ලෙසත් කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. හට උපදෙස් දෙන ලදි. |
| 4. | වෙරළ තීරයේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කිරීමේදී මතුවන සමාජමය ගැටලු හා සමහර ස්ථානවල පවතින ව්‍යාපාරික ස්ථාන | සමාජමය ගැටලු මෙන්ම වෙරළ තීරයේ පවතින සංචාරක ව්‍යාපාරය පිළිබඳව ද අවධානය යොමු කොට අදාළ පලාත් පාලන ආයතන මෙන්ම ආයෝජන මණ්ඩලය, සංචාරක මණ්ඩලය, ආදී ආයතන සමඟ ද සම්බන්ධීකරණයෙන් මෙම වෙරළ තීරය සංරක්ෂණය සඳහා සාධනීය වැඩපිළිවෙලක් අනුගමනය කරන මෙන් කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. හට උපදෙස් ලබා දෙන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 5. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කොට නොතිබීම. | වහාම අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවන ලෙසත් ඊට අනුෂංගිකව විගණන කළමනාකරණ කමිටු පවත්වන ලෙසත් කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදී. |
| 6. | දිය කඩන තුනක් ඉදිකිරීමේදී අදාළ කොන්ත්‍රාත් සමාගම විසින් ගිවිසුම් කඩ කොට තිබීම, වැඩ නිම නොකිරීම හා වැඩ සහතිකයකින් තොරව රු. මිලියන 4ක අත්තිකාරමක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබීම. | ගල් කුට්ටි 9400 කට අදාළව ගෙවීම් සිදු කර ඇති බවත්, කෙසේ වුවද රඳවා ගත් මුදලෙන් හා ගිවිසුම් ප්‍රකාරව රු. මිලියන 20 ක මුදලක් අයකරගෙන තිබෙන බවත් ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි. ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ලබා දෙන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. හට නියෝග කරන ලදි. |
| **රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව<br>2016 මැයි 05** | | |
| 1. | i. 2014 ජනවාරි 26 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛය ප්‍රකාරව පුස්තකාල පොත් සමීක්ෂණයක් මේ දක්වා සිදුකර නොතිබීම.<br>ii. ආංශික භාණ්ඩ ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබීම.<br>iii. දෙපාර්තමේන්තුවේ නඩු භාණ්ඩ සම්බන්ධයෙන් සිදුවී ඇති අක්‍රමිකතාවයක් මත නිලධාරීන් 04 දෙනකුට එරෙහිව නඩු පවරා ඇති නමුත් නීතිපති උපදෙස් ගැනීම වසර 07ක පමණ කාලයක් තිස්සේ ප්‍රමාදව පැවතීම. | මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර අදාළ කාර්යයන් නියමිත කාලසීමාවන් තුළදී ඉටු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 2. | 2015 වර්ෂය වන විට පරීක්ෂා කිරිමට ආදර්ශන 3,955 ක් පවතින බවත්, ඒ අතර අවුරුදු 10 ඉක්මවූ ආදර්ශනද | යුද සමයේ විශාල ආදර්ශන සංඛ්‍යාවක් විශ්ලේෂණයට ලැබීමත්, රස පරීක්ෂණ වාර්තා ඉල්ලුම් කර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරීගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | සැලකිය යුතු ප්‍රමාණයක් මෙතෙක් පරීක්ෂාවට ලක් නොවී පැවතීම. | වාර්තා නිකුත් කිරීමට පෙර අතරමගදී නඩු අවසන් වීමත්, නිලධාරී හිඟයක් පැවතීමත් මීට හේතු වූ බව, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. පරීක්ෂණ කිරීමට ඇති ආදර්ශන සංඛ්‍යාවෙන් අවු: 5 - 10ක් අතර කාලයක් ඉකුත් වී ඇති මෙතෙක් වාර්තා ලබා නොදුන් ආදර්ශන සංඛ්‍යාව හා ඒ අතුරින් තවදුරටත් අධිකරණයට වාර්තා අවශ්‍ය නොවන ප්‍රමාණය සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත කාරක සභාව දැනුම් දුන්නේය. |
| 3. | නිලධාරි පුහුණුව | මනුෂ්‍ය දත් සහ ඇටසැකිලිවල ඩී.එන්.ඒ පරීක්ෂා කිරීම සඳහා කොයිකා ව්‍යාපෘතියක් යටතේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හට කොරියාවේ පුහුණුවක් ලබා දීමට කටයුතු කර ඇති බවත් ඩිජිටල් අධිකරණ විද්‍යාගාරයක් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීමට කටයුතු කර ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. දෙපාර්තමේන්තුව මඟින් කළ නොහැකි පර්යේෂණ සිදු කළ හැකි විදේශ රට /දේශීය බාහිර ආයතන සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙසත්, විදේශ පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් සහභාගි කරවීම සම්බන්ධව සැලසුම් සකස් කරන ලෙසත්, කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත උපදෙස් දුන්නේය. |
| **නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව<br>2016 මැයි 06** | | |
| 1. | දෙපාර්තමේන්තුව මගින් පර්යේෂණ ඒකකයක් ස්ථාපිත කර නොතිබීම. | නීති පර්යේෂණ ඒකකයක් කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨය තුළ |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | | පිහිටුවීමට කටයුතු යොදා ඇති බවත්, එය වඩාත් ඵලදායක බවත් ප්‍ර.ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි. |
| 2. | නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීමේ හා ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතියේ වත්මන් තත්වය | ප්‍රතිශෝධනය කිරීමේ පනත් A සිට Z දක්වා කට්ටල වලට වෙන් කර ඇති අතර, මේ වන විට එහි K කාණ්ඩය දක්වා නිම කොට තිබෙන බවත්, අපේක්ෂිත පරිදි 2017 වසර වන විට එම ව්‍යාපෘතිය නිම කිරීමට හැකියාවක් නොපවතින බවත්, සම්බන්ධීකරණ නිලධාරි තනතුර පුරප්පාඩුව පැවතීම ද මේ සඳහා බලපා ඇති බවත් ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි.<br>නිලධාරීන් විශ්‍රාම යාමට නියමිත දින වකවානු පිළිබඳව අවධානය යොමු කොට, එම පුරප්පාඩු පිරවීම සඳහා පූර්ව සූදානමක් සහිතව කටයුතු කළ යුතු බවට කාරක සභාව විසින් අවධාරණය කරන ලදි. |
| 3. | දෙපාර්තමේන්තුව තුළ පනත් කෙටුම්පත් සම්පාදනය පිළිබඳ දත්ත සටහන් කිරීමේ ක්‍රමවේදයේ ඌනතාවන් පැවතීම. | ඒ සඳහා පරිගනක ජාලගත විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම හා එම ක්‍රමවේදය පහසුකර ගැනීම සඳහා පනත් කෙටුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය දැක්වෙන ආකෘති පත්‍රයක් සකස් කොට අමාත්‍යාංශ ඇතුළු අදාළ ආයතන වෙත ලබාගැනීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව දන්වා සිටින ලදි. අමාත්‍යාංශ මගින් මේ දක්වා කෙටුම්පත් කිරීමට / සංශෝධනය කිරීමට එවා තිබෙන පනත් සංඛ්‍යාව, ඒ අතුරෙන් සම්පාදනය කොට යවා ඇති පනත් සංඛ්‍යාව හා සම්පාදනය කිරීමට ඉතිරිව ඇති සංඛ්‍යාව පිළිබඳ දින වකවානු සහිත සවිස්තරාත්මක |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | වාර්තාවක් ලබාදෙන ලෙසද කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |
| **ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය<br>2016 මැයි 18** | | |
| 1. | සමස්ත කාර්ය මණ්ඩලයේ පවතින 28% පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව කාරක සභාව විමසිය. | කාර්යාලීය ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම පවතින පුරප්පාඩු පිරවීමට බාධාවක් වී ඇතත් රාජකාරී ආවරණය සඳහා ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන ඇති බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |
| 2. | 2015 මුලධන වැය යටතේ වෙන්කළ ප්‍රතිපාදන වලින් 52.1% ක ඉතිරියක් පැවතීම. | 2015 ඛණිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාංශය මෙම අමාත්‍යාංශය යටතට පැවරීම නිසා එහි ඉතිරිව තිබූ ප්‍රතිපාදන අමාත්‍යාංශය යටතේ ගිණුම් ගත වීම එයට හේතු වී ඇති බව ප්‍ර.ග.නි/ග.නී. පැවසිය. |
| 3. | අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම්වරියක් සංස්ථා සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමේදී වැටුප් හා දීමනා ලෙස පිළිවෙලින් රු.503,447/- සහ රු.317,800/- ලබාගැනීම. | වැරදීමක් සිදුව ඇති බව පිලිගෙන රු.224,065/- ක මුදලක් ආපසු ගෙවීමට කටයුතු කළ ඇය 2014 දි විශ්‍රාම ගැනීම නිසා ඉතිරි මුදල් අයකරගැනීමේ හැකියාවක් නොමැති බව ප්‍ර.ග.නි/ග.නී. දැන්වීය. |
| 4. | ඛණිජ තෙල් සංස්ථාව සහ හයිරුක්ස් මැලේසියා සමාගම අතර පවතින සේවා ගිවිසුම යථාවත් කිරීම වසරකට වැඩි කාලයකින් ප්‍රමාද වීම. | හයිරුක්ස් මැලේසියා සමාගම සමග තෙල් මිශ්‍ර කිරීමේ නව ව්‍යාපාරයක් ඇරඹීමේ ගිවිසුම් සකස් කිරීමේ දි සිදු වූ ප්‍රමාදය එයට හේතු වූ අතර 2013.10.18 දින සිට බලපැවැත්වෙන පරිදි ගිවිසුම යථාවත් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නී. ප්‍රකාශ කළේය. |
| 5. | සපුගස්කන්ද තෙල් පිරිපහදුව සහ පවතින නල මාර්ග අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග | තෙල් පිරිපහදුව නවීකරණය පිළිබඳව පත්කළ විද්වත් කමිටු වාර්තාව මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ සමග ගරු අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුව මගින් අධ්‍යනය කර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | සැකසූ පත්‍රිකාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. නල මාර්ග අළුත්වැඩියාව සම්බන්ධයෙන් පත් කළ ප්‍රසම්පාදන කමිටුව ඒ සඳහා රටවල් 4 ක් යෝජනා කර ඇති අතර එම රටවල තානාපති කාර්යාල හරහා මිල ගණන් කැඳවා සුදුසු ටෙන්ඩර් කරුවෙකු තෝරා ගැනිමට කටයුතු කිරීමට නියමිත බව ප්‍ර.ග.නි/ග.නී. පැවසිය. |
| 6. | රටේ සමස්ත ඉන්ධන ඉල්ලුම පිරිපහදු කිරිම මගින් පමණක් සපුරා ගන්නේ නම් එයින් රටට අත්වන මුල්‍ය වාසිය | බැරල් 50,000 වන දිනක නිපැයුම සමස්ත ඉල්ලුමෙන් 35% වන අතර පිරිපහදු කිරිම මගින් මුළු ඉල්ලුම සපුරා ගන්නේ නම් වාර්ෂිකව ඩොලර් මිලියන 350 විනිමය ඉතිරි කර ගත හැකි බව ප්‍ර.ග.නි /ග.නි. දැන්වීය. |
| 7. | තෙල් ගවේෂණ කටයුතු වල වර්තමාන තත්ත්වය | දැනට සොයාගෙන ඇති දත්ත අනුව මන්නාරම් ද්‍රෝණියේ ඉන්ධන බැරල් බිලියන 5 පමණ ද ස්වභාවික ගෑස් ඝන අඩි ට්‍රිලියන 9 පමණ ද පවතින අතර එය වසර 60 ක අවශ්‍යතාවය සපුරාලිමට ප්‍රමාණවත් බවත් තෙල් ලිඳක කැණීමේ සිට නිෂ්පාදනය දක්වා ක්‍රියාවලිය සඳහා ඩොලර් මිලියන 50 සිට බිලියනය දක්වා වියදමක් දැරීමට සිදුවන අතර මන්නාරම ද්‍රෝණියේ එම් 2 කොටස ගවේෂණ අදියරේ සිට සංවර්ධන අදියරට ළඟාවිය හැකි මට්ටමක පවතින බැවින් සුදුසු ආයෝජකයෙකු සොයා ගැනිම ලේකම් කාර්යාලයේ මූලික අපේක්ෂාව බවත් ප්‍ර.ග.නි /ග.නි. සඳහන් කළේය. |
| 8. | පොලිප්ටෝ ලංකා සමාගමේ කාර්ය භාරය සහ එහි ප්‍රේෂණ | 2008 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරිය යටතේ ස්ථාපිත කළ මෙම සමාගම ප්ලාස්ටික් පොලිතීන් වැනි ඝන අපද්‍රව්‍ය යොදාගෙන ඉන්ධන නිපදවිම ප්‍රධාන කාර්යය වන අතර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | මෙහි 60%, 30% සහ 10% හිමිකාරිත්වය පිළිවෙලින් අමාත්‍යාංශයට, නිමැවුම්කරුට සහ මොරටුව විශ්ව විද්‍යාලයේ ඛණිජ සම්පත් පර්යේෂණ පීඨය සතුවන බව ප්‍ර.ග.නි /ග.නි දැන්වීය. |
| **ලේඛනගත නොවූ ණය සහ 2015 ජනවාරි මස සිදු කළ බැඳුම්කර නිකුතුව හේතුකොට ගෙන රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට හානියක් / පාඩුවක් සිදුවී තිබේද යන්න විමර්ශනය කිරීම සඳහා කැඳවන ලද විශේෂ කාරක සභා රැස්වීම 2016 ජුනි මස 07** | | |
| 1. | ශ්‍රී ලංකා මහ බැංකුව මගින් 2015 වසරේ ජනවාරි මාසයේදී සිදුකළ බැඳුම්කර නිකුතුව හේතුවෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට යම් හානියක් / පාඩුවක් සිදුව තිබේද යන්න | ශ්‍රී ලංකා මහ බැංකුව මේ වන විට මුදල් අමාත්‍යාංශය යටතේ නොපවතින බැවින් බැඳුම්කර නිකුතුව පිලිබඳ ප්‍රකාශයක් නිකුත් කිරීමට තමාට නොහැකි බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කරන ලදි. එහෙත් රජයට අවශ්‍ය වන ආදායම් වියදම්වලට වඩා අඩුවූ අවස්ථාවලදී හෝ අනපේක්ෂිත වියදම් දැරීමට සිදු වූ අවස්ථාවලදී, පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇති උපරිම ණය සීමාවට යටත්ව, ණය ගැනීමට සිදුවන බවත්, ඒ අනුව මහ බැංකුව භාණ්ඩාගාරයේ ඉල්ලීම මත, අවශ්‍ය මුදල් සම්පාදනය කරනු ලබන අතර, භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව ඉන් එක් ක්‍රමවේදයක් බවත්, වෙළඳපොළ හැසිරීම අධ්‍යනය කර, රජයට අවම පිරිවැයක් දැරීමට හැකි වන සේ මෙම කටයුතු සිදුවිය යුතු බවත්, ප්‍ර.ග.නි /ග.නි විසින් පැහැදිලි කරන ලදී.<br>කාරක සභාව විසින් මේ සම්බන්ධව වාර්තාවක් ඉල්ලන ලදුව ශ්‍රී ලංකා මහ බැංකුව ඔහුගේ විෂය පථයට නොගැනෙන හෙයින් එවැනි වාර්තාවක් ලබාදීම අපහසු කාර්යයක් බව මුදල් අමාත්‍යාංශයේ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ලේකම්වරයා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී. |
| 2. | රජය විසින් ලබාගෙන තිබෙන ණය තුළ ලේඛනගත නොවූ ණය පැවතීමට හැකියාවක් පවතින්නේද යන්න | රජය විසින් භාණ්ඩාගාරය හරහා ගනු ලබන සියලුම ණය ලේඛනගත කරන බවත්, එහෙත් ඊට පරිබාහිරව අනෙකුත් ආයතන ලබාගන්නා ණය ඒ ඒ ආයතනවල ශේෂ පත්‍රවල සඳහන් වන අවස්ථා තිබෙන බවත් අනාවරණය විය.<br>එසේම රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතන තමන්ගේ ප්‍රතිපාදන ඉක්මවා දේශීය හෝ විදේශීය බැඳීම් ඇති කර ගන්නා බවත්, ඒ අනුව 2015 වසරේ ලබාගත් තොරතුරු අනුව මෙම ප්‍රමාණය රු.බිලියන 1043ක් බවත්, මෙවැනි ගනුදෙනු භාණ්ඩාගාරයේ සටහන්ව නොමැති වුවද, රජය වෙනුවෙන් භාණ්ඩාගාරයට එම මුදල් ගෙවීමට සිදුවන බැවින් අවිනිශ්චිත බැරකමක් ඇතිවන බවත්, ප්‍ර.ග.නි/ග.නි අවධාරණය කළේය. |
| **ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව<br>2016 ජුනි 08** | | |
| 1. | 2015 අපේක්ෂිත ඉලක්කය වෙත ළඟා වීමට නොහැකි වූ ප්‍රජා විද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණය | මෙම සමීක්ෂණය සඳහා DHS තාක්ෂණය යොදා ගැනීම සඳහා ICF නැමති ඇමෙරිකානු සමාගම ඉදිරිපත් කර තිබූ රුපියල් මිලියන 367 ක ඇස්තමේන්තුව 25% අඩුකර ගැනිමට කටයුතු කළ අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු එම තාක්ෂණය යොදා ගනිමින් සමීක්ෂණය සිදුකරමින් පවතින අතර මෙම වසර අවසාන වීමට ප්‍රථම එහි කටයුතු නිම කළ හැකි බව අනාවරණය විය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 2. | ජාතික ගිණුම් සකස් කිරීමේ දි පාදක වර්ෂයන් වෙනස් කිරිම නිසා සංඛ්‍යා දත්ත වල සිදුවන වෙනස්කම් | රටක ආර්ථික ප්‍රසාරණය සැලකිල්ලට ගනිමින් පාදක වර්ෂ වෙනස් කරන අතර අතීතයේ අංශ 13 ඒ සඳහා පදනම් කර ගත් අතර වර්තමානයේ අංශ 89 දක්වා එය පුළුල් වි ඇති බවත් ඊට අමතරව එක්සත් ජාතින්ගේ සංවිධානය හඳුන්වා දී ඇති නව අන්තර් ජාතික ගිණුම් ගත කිරිමේ ක්‍රමවේද සහ මූල්‍ය ආයතන වල මග පෙන්වීම ආදිය මෙහිදී සලකා බලන බවත් අනාවරණය විය.<br><br>2010-2015 කාල පරාසය 2002 සහ 2010 යන වර්ෂ දෙකම පාදක කර ගනිමින් ජාතික ගිණුම් සකස් කර ඇත.<br><br>ඒ අනුව<br><br>(1) 2015 වර්ෂය සඳහා 2002 පාදක වසර ලෙස සලකා රටේ ආර්ථික වර්ධනය, ඉතුරුම් අනුපාත සහ ආයෝජන අනුපාත ආදිය ඇතුලත් වාර්තාවක්<br><br>(2) මෑතක සිදුකළ කුටුම්භ අයවැය සමික්ෂණය පදනම් කරගෙන කුටුම්භයක ආදායම/වියදම එක් එක් අංශ වෙත බෙදි ගොස් ඇති අකාරය ප්‍රතිශත සහ රුපියල්වලින් දැක්වෙන වාර්තාවක්<br><br>(3) 2014 සහ 2015 වර්ෂයන්ට අදාලව ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මතුපිට සහ මූලික උද්ධමනයන් අතර වෙනස ගණනය කරන ලද වාර්තාවක් කාරක සභාවට ලබාදෙන ලෙස නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | **පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව<br>2016 ජුනි 08** | |
| 1. | අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරියෙකු පත් කර නොමැති අතර ප්‍රසම්පාදන කටයුතු වල බොහෝ දුර්වලතාවයන් නිරීක්ෂණය විම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමුවිය. | ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු අභ්‍යන්තර විගණන ඒකකයට ලබාදෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ වෙත යොමු කර ඇති ඉල්ලීමට මේ දක්වා ප්‍රතිචාරයක් නොලැබුණු බව හෙලිවිය.<br>මේ පිළිබඳව අමාත්‍යාංශයේ විශේෂ අවධානය යොමු විය යුතු බවත් අමාත්‍යාංශය මැදිහත්ව හෝ විගණකවරයෙකු පත් කර එහි කටයුතු ක්‍රමවත් කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව උපදෙස් ලබා දුන්නේය. |
| 2. | 2015-2016 වර්ෂවල ප්‍රමාණවත් විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබිම. | කලින් ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පැවති මෙම දෙපාර්තමේන්තුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පත්විමෙන් පසු කමිටු රැස්වීම් ක්‍රමවත්ව පවත්වාගෙන යාමට කටයුතු කරන බව ප්‍ර.ග.නි./ග.නි පැවසීය. |
| 3. | 2476 වන සමස්ත කාර්ය මණ්ඩලයේ 31% ක පුරප්පාඩු පැවතිම. | සුදුසුකම් ලත් පිරිස් බඳවා ගැනිමේ ප්‍රායෝගික ගැටළු පවතින බැවින් රාජ්‍ය සේවා කොමිසම සමග සාකච්ඡාකර පවතින පුරප්පාඩු පිරිවිමට කටයුතු කරන බව ප්‍ර.ග.නි./ග.නි.පැවසිය.<br>මෑතකදි රාජ්‍ය සේවා කොමිසම සමග කළ සාකච්ඡාවේදි සහකාර අධ්‍යක්ෂ තනතුරු වලට බඳවා ගැනීම සඳහා පැවති සුදුසුකම් සංශෝධනය කිරීමට එකඟ වූ බවද අනාවරණය විය. |
| 4. | 2013 වර්ෂයේදී අනුරාධපුර විජයාරාම ආරාම සංකීර්ණයේ දාගැබ සහ බැම්ම සංරක්ෂණයට වෙන් කළ රු. | පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත පොලොන්නරුව මානික්කම්පට්ටිය චෛත්‍යය ප්‍රදේශවාසීන්ගේ විවිධ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | 2,014,638/= ක ප්‍රතිපාදන වෙනත් කාර්යයක් සඳහා යොදා ගැනීම. | ඉල්ලීම් හේතුවෙන් එම අවශ්‍යතාවයට ප්‍රමුඛත්වය දී අදාල ප්‍රතිපාදන යොදවා මෙම චෛත්‍යයේ සංරක්ෂණ කටයුතු සිදුකර ඇත. අනුරාධපුර විජයාරාම ආරාම සංකීර්ණයේ දාගැබ සහ බැම්මේ සංරක්ෂණය කටයුතු මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සිදු කිරිමට නියමිතව තිබූ බව ද ප්‍ර.ග.නි./ග.නි වැඩිදුරටත් පැවසිය. |
| 5. | යුධගනාව දාගැබ සංරක්ෂණයට ප්‍රමිතියෙන් යුතු ගඩොල් සපයා ගැනිමට නොහැකිවිම සහ ප්‍රතිපාදන ඌන උපයෝජනය | නිසි ප්‍රමිතියෙන් යුතු ගඩොල් සපයා ගැනිමේ දුෂ්කරතාවය නිසා 2013 වර්ෂයේ වෙන් වූ රුපියල් මිලියන 10 ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගැනිමට නොහැකි වූ බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. සම්පීඩන ධාරිතාව 600-800 වූ ගඩොල් සපයා ගැනිමට ගත් උත්සාහයන් අසාර්ථක වූ බවත් අවසානයේ සඳහිරු සෑයට ගඩොල් සැපයූ පුද්ගලයා වෙතින් මිලදී ගැනිමට කටයුතු කළ බවත් ප්‍ර.ග.නි./ග.නි. වැඩිදුරටත් පැවසිය. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම සඳහා ක්‍රමවත් සැලැස්මක් සකස් කිරිමේ අවශ්‍යතාවය දැඩිව අවධාරණය කළ කාරක සභාව ඉතිරිව ඇති ප්‍රතිපාදන සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස නියෝග කළේය. |
| 6. | 2016 ප්‍රතිපාදන මත කාර්ය සාධනයේ ප්‍රගතිය සහ පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතුවලදී පවතින බාධක කාරක සභාවේ අවධානයට ලක්විය. | රුපියල් මිලියන 1520 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් මිලියන 1200 ක් පුනරාවර්තන වියදම් සඳහා ද මිලියන 152 ක් සංවර්ධන වැඩසටහන් සඳහා ද වෙන් කර ඇති අතර, සැලසුම් කල කාර්යයන් අතරින් 30% ක් පමණ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | වැඩ ආරම්භ කර ඇති බවත්, සංරක්ෂණ කටයුතු සඳහා වෙන් කළ රුපියල් මිලියන 05 ක් වන මුළු මුදලින් රුපියල් මිලියන් 01 ක් දීඝවාපිය වෙනුවෙන් වෙන් කර ඇති බවත්, අනාවරණය විය. තවදුරටත් කරුණු දක්වමින් ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේ කාර්ය මණ්ඩලයේ විශාල පුරප්පාඩු ප්‍රමාණයක් පැවතිම සංරක්ෂණ කටයුතුවලට බාධාවක් වි ඇති අතර සහකාර අධ්‍යක්ෂ තනතුරු 28 න් 26 ද අධ්‍යක්ෂ තනතුරු 12 න් 10 ද පුරප්පාඩු වි පැවතිම එයට නිදසුනක් ලෙස දැක්විය හැකි බවයි. පුරප්පාඩු පිරවීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කාල වකවානු සහිතව සකස්කළ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි ට නියෝග කළේය. |
| 7. | පුරාවස්තු ආරක්ෂා කිරීමට දායකත්වය ලබාදෙන පුදගලයින් ධෛර්යමත් කරනු වස් පිහිටුවා ඇති තැගි අරමුදලට 2010 – 2015 කාලය තුළ ලැබුණු රු.73,486,473/-ක මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවා තබාගෙන 2015 වර්ෂයේ අවසානයේ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කිරීමෙන් අරමුදලේ අරමුණ ඉටුවී නොතිබීම. | පසුගිය කාලයේ අභ්‍යන්තර ගැටළු හේතුවෙන් තෑගි මුදල් ලබාදීමට නොහැකි වූ බව අනාවරණය වූ අතර, පුරාවස්තු ආරක්ෂා කිරිම සඳහා ඍජුව හා වක්‍රව දායක වන සියළු දෙනාටම එහි ප්‍රතිලාභ හිමිවන සේ නිතීරිති සංශෝධනය කිරිමේ අවශ්‍යතාවය මතුව ඇති බැවින් ඒ අනුව කටයුතු සිදුකර ගෙන යන බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |
| **ගණකාධිකාරි සේවයේ පවතින පුරප්පාඩු සහ වැටුප් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වන දෙවන රැස්වීම<br>2016 ජුනි 09** | | |
| 1. | 2017-2020 දක්වා ඇති විය හැකි පුරප්පාඩු පුරෝකථනය කිරීම. උක්ත කරුණ සම්බන්ධව 2015. 06.11 දින පැවති පළමු සාකච්ඡාවේදී ගන්නා ලද තීරණ වල ප්‍රගතිය. | පහත ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇති බව රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | - ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයට සුදුසුකම් ලත් පුද්ගලයින් බඳවා ගැනීම සඳහා වාර්ෂිකව විභාග පැවැත්වීම<br>- සියළුම දීප ව්‍යාප්ත සේවා ඒකාබද්ධ කොට පොදු විභාග ක්‍රමයක් පැවැත්වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා ඇත.<br>- වසර 03කට පසු 2015 වසරේ බඳවා ගැනීම් සිදු කර ඇති අතර සෘජු බඳවා ගැනීම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂිතය<br>- සුදුසුකම් ලත් පුද්ගලයින් බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා අංශ විභාගය පැවැත්විමට සැලසුම් කරමින් සිටී.<br>- විශේෂ ශ්‍රේණි සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂිතය.<br>- ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ සේවක සංඛ්‍යා තත්ත්වය විධිමත්ව කලින් කලට සමාලෝචනය කිරීම සඳහා දීප ව්‍යාප්ත සේවා සංගම්වල අදහස්/යෝජනා ලබා දෙන ලෙස ඉල්ලීම් සිදු කර ඇත. |
| **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (නැවත කැඳවීම)<br>2016 ජුනි 10** | | |
| 1. | වාහන ලිපි ගොනු 597 ක් අස්ථානගතවීම පිළිබඳ වත්මන් තත්වය | ලිපිගොනු 597 ක් ලබාදෙන ලෙස කරන ලද නියෝගය ප්‍රකාරව මේ වන විටද ලැබී තිබෙනුයේ ගොනු 33ක් පමණක් බවත්, එයට අමතරව වශයෙන් ඉල්ලා ඇති තොරතුරු කිසිවක් ද ලැබී නොමැති බවත් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් පෙන්වා දෙන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | එම ගොනු සෙවීමේ කටයුතු සිදුවෙමින් පවතින බවත්, ලිපිගොනු පරිහරණය කරන නිලධාරීන්ගේ අනන්‍යතාවය තහවුරු කළහැකි වන පරිදි ක්‍රමවේදයක් සකස්කර ඇති බවත්, ඒ අනුව ඉදිරියේදී එවන් තත්වයක් ඇති නොවීමට කටයුතු කර ඇති බවත් ග.නි. විසින් සඳහන් කරන ලදි.<br>එම පිළිතුරෙන් සෑහීමකට පත්විය නොහැකි බව පළ කළ කාරක සභාව, මෙම ඉතිරි ලිපි ගොනු සියල්ල ලබා දීමට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය පිළිබඳව දින වකවානු සහිතව වාර්තාවක් මසක් ඇතුලත ලබා දෙන ලෙසත්, එමෙන්ම මෙවැනි සිදුවීම් ඉදිරියේදී සිදුවී වැලැක්වීම සඳහා ගෙන ඇති පියවර සවිස්තරව සඳහන් වාර්තාවක් ද එවන ලෙස ප්‍ර.ග.නි./ග.නි හට නියෝග කරන ලදි. |
| 2. | 2015 වසර තුළ ලියාපදිංචි නව වාහන 668,907 තුල පවතින මෝටර් කාර් රථ ( Motor Car ) 105,628 පිළිබඳ තොරතුරු රේගුවට යොමු කොට ලබාගත් නිර්දේශ. | එම වාහන වල තොරතුරු රේගු වාර්තා සමඟ සැසඳීමේදී වාහන 164 ක තොරතුරු නොසැසඳෙන බව අනාවරණය වූ බව ග.නි. සඳහන් කළ අතර ඒ සම්බන්ධයෙන් පවතින ගැටලු නිරාකරණය කිරීමට රේගුව සමඟ එක්ව කටයුතු කර ඇති බවත්, 2016 අගෝස්තු මස 01 දින සිට නව වැඩ පිළිවෙල ක්‍රියාත්මක වන බවත් ග.නි. පැවසීය. වාහන ආනයනය හා ලියාපදිංචිය පිළිබඳව පැවති ගැටලු නිරාකරණය කොට තිබෙන එම ක්‍රියාවලිය පිළිබඳ වාර්තාවක් කාරක සභාවට එවීමට කටයුතු කරන මෙන් ප්‍ර.ග.නි./ග.නි හට නියෝග කරන ලදි. |
| 3. | E මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ වත්මන් තත්වය | ඒ සඳහා ඉදිරිපත් කළ කැබිනට් සංදේශය අනුමත නොවූ බවත්, පසුව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත්කොට තිබෙන වාර්තාව අනුව කටයුතු සම්පාදනය කරමින් පවතින බවත් හෙළිවිය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාවේ යෙදවීම සඳහා වන දින වකවානු සහිත ක්‍රියාකාරී සැලැස්ම මසක් තුළ කාරක සභාව වෙත ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |
| 4. | පරිපාලන කටයුතු විධිමත් කිරීම | රේගීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද උපදෙස් වලට අනුව, නව චක්‍රලේඛ නිකුත් කරමින් දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන තිබෙන බව ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි. දෙපාර්තමේන්තුවේ කටයුතු අධීක්ෂණය සඳහා රේගීය අමාත්‍යාංශ නිලධාරීන් ද ඇතුලත්ව 07 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි පැවසීය. |
| 5. | අත් ට්‍රැක්ටර් ආනයනය කළ රේගු සටහන්කර භාවිතා කරමින් ව්‍යාජ ලෙස ප්‍රාඩෝ වර්ගයේ ජීප් රථ 7 ක් ලියාපදිංචි කිරීම සම්බන්ධ වත්මන් තත්ත්වය. | ප්‍රාඩෝ ජීප් රථ 7 හි ලියාපදිංචිය අහෝසි කිරීම සඳහා ගෙන ඇති පියවර පිළිබඳ කාරක සභාව විමසීය. එම වාහන වල ලියාපදිංචිය අහෝසි කිරීම සඳහා නීතිපති උපදෙස් ලබාගැනීමට පියවර ගෙන ඇතැයි ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි. මෝටර්රථ ප්‍රවාහන පනත මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු නොකරමින් මේ පිළිබඳ වඩාත් සංකීර්ණ ක්‍රියාදාමයකට යොමුවීම පිළිබඳ කාරක සභාවට සෑහීමකට පත්විය නොහැකි බවත්, නීතිපති සමඟ සාකච්ඡා කොට, ඒ පිළිබඳව කඩිනම්, නිශ්චිත හා නිවැරදි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ක්‍රියාමාර්ගයකට යොමු වන ලෙසත්, මසක් ඇතුලත එහි ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කරන ලෙසත් ප්‍ර.ග.නි. වෙත උපදෙස් ලබා දෙන ලද අතර මෙම සිද්ධියට සම්බන්ධවූ නිලධාරීන්ට එරෙහිව පවත්වනු ලබන විනය පරීක්ෂණ වසරක කාලයක් තුළ නිම කරන ලෙසත් දන්වන ලදි. |
| **ශ්‍රී ලංකා නාවික හමුදාව<br>2016 ජුනි 22** | | |
| 1. | 2015 වර්ෂය සඳහා පිළියෙල කර ඇති වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රායෝගික සැලැස්මක් නොවීම. | ප්‍රායෝගික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට ඒ අනුව පියවර ගත යුතු බවත් එමඟින් කාලීනව අදාළ ඉලක්ක සපුරා ගෙන තිබේද යන්න සම්බන්ධයෙන් ඇගයීමක් සිදු කල යුතු බවත් කාරක සභාව අවධාරණය කළේය. |
| 2. | ශ්‍රී ලංකා නාවික හමුදාව සතුව සිවිල් නිළධාරීන්ගෙන් සැදුම්ලත් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටු වීමේ අවශ්‍යතාවය | අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටු වීම සඳහා අවශ්‍ය වන ගණකාධිකාරිවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන් ලබා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ කළමණාකාර සේවා දෙපාර්තමේන්තුව වෙත ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සනින් යුතුව ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසත් ඒ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සමඟ සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමඟ කඩිනම් සාකච්ඡාවක් පවත්වා අවශ්‍ය කාර්ය මණ්ඩලය සංශෝධනයට ලක් කොට අවශ්‍ය නිලධාරීන් යොමු කිරීම සම්බන්ධයෙන් කටයුතු කොට ඒ සම්බන්ධයෙන් වාර්තාවක් මසක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 3. | මුදල් රෙගුලාසි 237 උල්ලංඝනය කරමින් මිලදී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලැබීමට පෙර චෙක්පත් ලිවීම සහ සැපයුම්කරුවන්ට චෙක්පත් ලබාදීමේ පූර්ව ගෙවීම් ප්‍රේෂණපත් ක්‍රමය සහ 2011 ජූලි මස සිට 2015 දෙසැම්බර් දක්වා කාලය තුළ එම ක්‍රමය උපයෝගී කර ගනිමින් අවස්ථා 8653 කදී රු.2,729,523,290ක් වැය කර භාණ්ඩ මිලදී ගැනීම. | 2015 වර්ෂයේ සිට මේ ක්‍රමය නිවැරදි කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි පැවසූ අතර, ප්‍රායෝගික තත්ත්වයන් හමුවේ මෙම ක්‍රමවේදය අනුගමනය කිරීමට සිදුවූයේ නම් ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම අත්‍යාවශ්‍ය බවත්, හැකිතාක් දුරට පූර්ව ගෙවීම් ප්‍රේෂණපත් ක්‍රමයෙන් බැහැර වන ලෙසත් කාරක සභාව උපදෙස් දුන්නේය. |
| 4. | ශ්‍රී ලංකා නාවික හමුදාව මගින් පවත්වාගෙන යනු ලබන සියළුම ආදයම් උපයන ව්‍යාපාර කටයුතු | මේ සඳහා මූලික ප්‍රාග්ධනය සහ අනෙකුත් වියදම් සඳහා ඒකාබද්ධ අරමුදලින් වියදම් දරණු ලබන බැවින්, එම ව්‍යාපෘතිවල ශුද්ධ ලාභය මුළුමනින්ම ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සහ අනෙකුත් මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කොට පවතින මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා පියවර ගෙන 2016 ජූනි මස 20 දිනට පෙර වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස ප්‍ර.ග.නි. වෙත කාරක සභාව උපදෙස් දුන්නේය.<br>නාවික හමුදාව පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර, එම ව්‍යාපාරවලට යොදවා ඇති ආරම්භක ප්‍රාග්ධන ප්‍රමාණය, ආදායම් සහ වියදම් තත්ත්වය සහ ලාභය හෝ අලාභය සම්බන්ධයෙන් වාර්තාවක් මසක් ඇතුලත කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 5. | 2011 වර්ෂය තුලදී රු. 23,373, 952 /= මුදලක් වැය කර සපත්තු ජෝඩු 10,000ක් මිලට ගෙන තිබූ අතර මේ සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන කමිටු | ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි අඩුපාඩු නිරීක්ෂණය කළ කාරක සභාව මේ සම්බන්ධයෙන් වාර්තාවක් මසක් ඇතුලත කාරක සභාව වෙත ඉදිරිපත් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | රැස්වීම් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකුගේ සහභාගිත්වයෙන් තොරව ප්‍රසම්පාදන කමිටු තීරණ ගෙන තිබීම හා විගණන විමසුමට අදාලව පිළිතුරු දී නොමැති වීම. | කරන ලෙස ප්‍ර.ග.නි. /ග.නි වෙත දැනුම් දුන්නේය. |
| 6. | 2012 වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ස්කැප්පෝල්ඩින් 250 ක අවශ්‍යතාවයක් ඉටුකර ගැනීම සඳහා ස්කැප්පෝල්ඩින් ඒකක 1000 ක් මිලදී ගැනීම නිසා රු.2,094,731/= ක නිශ්කාර්ය වියදමක් සිදු කර තිබීම. | ස්කැප්පෝල්ඩින් ඒකකයක් කොටස් හතරකින් සමන්විත වන බවත්, එම කොටස් හතර, ඒකක 1000 ක් ලෙස ගණන් බලා ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. අදාළ පිළිතුර සම්බන්ධයෙන් සෑහිමට පත් විය නොහැකි බව කාරක සභාවේ තීරණය කළ අතර මේ සම්බන්ධයෙන් වාර්තාවක් නොපමාව ලබා දෙන ලෙස ග. නි. වෙත දැනුම් දෙන ලදී. |
| 7. | කොන්ත්‍රාත් පිරිනැමීමේ දී සැපයුම ප්‍රතික්ෂේප කිරීම වැලැක්වීම පිණිස ලංසු සුරක්ෂණයක් හා කාර්යසාධන සුරක්ෂණ ලබාගෙන නොතිබීම. | මෙවැනි තත්ත්වයන් සෘජුවම සැපයුම් ක්‍රියාවලියටත් වක්‍රාකාරයෙන් අනෙකුත් සෑම අංශයකටත් අහිතකර ලෙස බලපාන බැවින් අදාළ සුරක්ෂණ ලබා ගැනීමේ වැදගත්කම පිළිබඳව කාරක සභාව අවධාරණය කළේය. |
| | **ශ්‍රී ලංකා පොලිසිය<br>2016 ජුනි 22** | |
| 1. | සමස්ත කාර්ය මණ්ඩලයේ 16% ක් සහ අභ්‍යන්තර විගණන අංශයේ 64% ක පුරප්පාඩු පැවතිම දෙපාර්තමේන්තු සේවාවන් පවත්වා ගෙන යාමට බාධාවක් නොවන්නේදැයි කාරක සභාව විමසීය. | අංශ 3ක් සමන්විත වූ පොලිස් සේවයේ විවිධ අංශවල පුරප්පාඩු 16,000 ආසන්න ප්‍රමාණයක් පවතින අතර නිල සේවයට බඳවා ගැනිම දැනට පවතින පුහුණු පාසල් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවිම දැඩිව බලපා ඇති බවත් විකල්පය ස්ථාන පිහිටුවා ශිෂ්‍ය හට ව්‍යාපාරය හරහා අනාගත අවශ්‍යතාවන්ට සරිලන පරිදි බඳවා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ගැනිමේ යාන්ත්‍රණයක් සැකසීමට කටයුතු කරන බවත් ග.නී පැවසිය. පොලිස් දෙපාර්තමේන්තුවේ දිගු කලක සිට බඳවා ගැනීමේ හා උසස්වීම් ලබා දීමේ ක්‍රමවේදයක් නොපැවතිම මෙන්ම නිලධාරි වැටුප් තත්ත්වය, ප්‍රමාණවත් නිල නිවාස පහසුකම් නොමැතිවිම ආදිය ද මෙම ගැටළුව උග්‍ර විමට හේතු වි ඇති බව නිරීක්ෂණය කළ කාරක සභාව මේ සඳහා රජය විසින් ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු බව අවධාරණය කළේය. |
| 2. | 2014 වර්ෂයේදී නිවාස යෝජනා ක්‍රමයක් සඳහා වෙන් කළ රුපියල් මිලියන 500 මුදල මේ දක්වා ප්‍රයෝජනයට නොගැනීම පිළිබඳව කාරක සභාව විසින් කරුණු විමසන ලදී. | රුපියල් මිලියන 500 ප්‍රතිපාදනය දෙපාර්තමේන්තු ඉල්ලිමක් මත ලබා දුන් මුදලක් නොව පොලිස් නිලධාරින්ට නිවාස යෝජනා ක්‍රමයක් ඇති කිරිම සඳහා පසුගිය අයවැයෙන් වෙන්කල මුදලක් බවත් ඒ සඳහා අවිස්සාවේල්ල ප්‍රදේශයෙන් ඉඩමක් පවරා ගැනිමේ කටයුතු දැනට සිදු කරමින් පවතින බවත් අනාවරණය විය. |
| 3. | පොලිස් ස්ථානවල කටයුතු පවත්වාගෙන යාමට ප්‍රමාණවත් නිලධාරින් සංඛ්‍යාවක් නොමැතිවිම හා ඒ සඳහා ගත හැකි විකල්පයන් | පොලිස් නිලධාරීන් 3700 ක පමණ පිරිසක් වෙනත් ස්ථානවල ආරක්ෂක කටයුතුවලට යෙදවීමට සිදුවීමෙන් සාමාන්‍ය කටයුතු පවත්වාගෙන යාම ගැටළුවක් වි ඇති බවත් අත්‍යාවශ්‍ය ස්ථානවලට පමණක් පොලිස් නිලධාරීන් යොදවා අනෙකුත් ස්ථාන වෙත සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරින් යෙදවිම පවතින විකල්පය බවත් ග.නි. පැවසිය.<br>සේවක සංඛ්‍යාව පිළිබඳව විමර්ශනයක් සිදුකර පොලිස් ස්ථානවලට අවශ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ සකස් කළ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරිමට කටයුතු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කරන බව ප්‍ර.ග.නි./ග.නී ප්‍රකාශ කළේය. |
| 4. | පොලිස් ස්ථානවල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරිම සඳහා තාක්ෂණය යොදා ගෙන ඇති ආකාරය පිළිබඳව කාරක සභාව විමසිය. | මේ සඳහා පස්වසරක සලැස්මක් සකස් කර ඇති අතර මූලික පියවර ලෙස කොළඹ විශ්ව විද්‍යාලයේ සහය මත ඇඟිලි සලකුණු පරික්ෂාව, අත්අඩංගුවට පත්වූ පුද්ගලයින්ගේ තොරතුරු මාර්ගගත (Online) ක්‍රමය මගින් ලබා දිම, පොලිස් වාර්තා නිකුත් කිරිම ආදි කටයුතු සිදුකරන අතර ඒ සඳහා පරිගනක තාක්ෂණ ආයතනයේ (ICT) සහයෝගය ලබාගැනිමට අපේක්ෂා කරන බව ග.නී. පැවසීය.<br>පොලිස් දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාවට නැංවීමට බලාපොරොත්තු වන සමස්ත තොරතුරු තාක්ෂණ වැඩ පිළිවෙල සම්බන්ධව දින වකවානු සහිත සකස් කළ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස නියෝග කළේය. |
| 5. | 2013 වර්ෂයේදී විධිමත් පරිදි බලපත්‍ර ලබා නොගත් පුද්ගලික ආයතනයක් වෙතින් සතුන් සහ සත්ව ආහාර මිලදී ගැනීම හා කෙටි කාලයක් තුල අශ්වයින් මිය යාම. | සමාගම් ලියාපදිංචි කිරිමේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති ජයන්ති එන්ටප්‍රයිසස් නැමති ආයතනයෙන් සත්ව ආහාර මිලදි ගැනිම සිදුකරන අතර සතුන් මිය යාම සහ ලබාදුන් ආහාර අතර සම්බන්ධයක් නොමැති බව ද පිළිකා තත්ත්වය, ආමාශයේ තුවාල,සහ සතුන්ගේ වයස ආදීය මරණ වලට හේතුව බව පරීක්ෂණ වලින් සනාථ වී ඇත.<br>සතුන්ගේ ආරක්ෂාව සඳහා පශු වෛද්‍යවරු තිදෙනෙකු බඳවා ගැනිමටත් දිගු කාලීන විසඳුමක් ලෙස අශ්වයින් සෞඛ්‍යාරක්ෂිතව ගාල්කර තැබිම සඳහා හොරණ ප්‍රදේශයෙන් අක්කර 50 ඉඩමක් මිලදි ගැනිමටත් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කටයුතු කරගෙන යන බව ප්‍ර.ග.නි./ග.නි වැඩි දුරටත් පැවසීය. |
| **ශ්‍රී ලංකා රේගුව<br>2016 ජුනි 23** | | |
| 1. | රජයේ නීතිරීතිවලට අනුකූල නොවන අන්දමින් අතිකාල දීමනා ගෙවීම. | මෙය අතිකාල දීමනාවක් නොව රාජකාරිය මත කරනු ලබන ගෙවීමක් ( work base payment) බවත් මේ සඳහා මුදල් ගෙවීම විවිධ ආයතනවලින් සිදු වන බවත්, භාණ්ඩාගාරයෙන් කිසිදු මුදලක් අතිකාල සඳහා ලබා නොගන්නා බවත් රේගු දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරිවරයා ප්‍රකාශ කරන ලදී. එම මුදලින් 10% ක් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව ගැසට් පත්‍රයේ සඳහන් බව පෙන්වා දුන් කාරක සභාව වෙනත් රටවල ක්‍රමවේදයන් ද අධ්‍යානය කර මේ සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 2. | කාරක සභා යෝජනාවක් වූ වාහන ලියාපදිංචියේ දී සාවද්‍ය තොරතුරු පරිගනක දත්ත පද්ධතියට ඇතුලත් කර සිදු කරන වංචා වැලැක්වීම සඳහා රේගු දෙපාර්තමේන්තුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අතර පරිගනක පද්ධතිය එකිනෙකට සම්බන්ධ කල යුතු බව හා ස්වයංක්‍රීය සැසඳුම් ක්‍රමයක් සැකසීම. | වර්තමානයේ වාහන ලියාපදිංචිය පිළිබඳ තොරතුරු සංයුක්ත තැටිවල අන්තර්ගත කොට ලබා ගන්නා බවත් එම දත්ත රේගු දෙපාර්තමේන්තුව සතු දත්ත සමග සංසන්දනය කරන බවත් ඉදිරි මාස 03 ක කාලයක් ඇතුලත ආයතන දෙකෙහි දත්ත පද්ධති එකිනෙකට සම්බන්ධ කිරීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය. |
| 3. | ඇඟිලි සලකුණු සටහන් කර පැමිණීම වාර්තා කිරීම සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය | රාජකාරි ස්වභාවය අනුව එම ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් අත්සන් කිරීම ඇතැම් නිලධාරින්ට ප්‍රායෝගිකව සිදු කළ නොහැකි බව ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | | ඒ සම්බන්ධයෙන් තිබෙන ගැටළු අදාළ පාර්ශව සහ මුදල් අමාත්‍යාංශය සමග සාකච්ඡා කොට නියමානුකූල කර ගන්නා ලෙසත් ඒ සම්බන්ධයෙන් අධ්‍යනය කර වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත්, ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී.<br>එතෙක් ගෙන්වා ඇති ඇඟිලි සලකුණු යන්ත්‍ර විනාශ වීම වැළැක්වීම සඳහා වෙනත් රාජ්‍ය ආයතනයකට ලබා දීමේ හැකියාව සොයා බලන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 4. | තීරු බදු නිදහස් පදනම මත භාණ්ඩ අලෙවි කරන වෙළඳ සැල් හිමියන් විසින් එම බදු සහනය ගුවන් මගීන්ට ලබා දීම නිරීක්ෂණය කිරීම සඳහා රේගු දෙපාර්තමේන්තුව ගෙන ඇති පියවර | ආගමන විගමන දෙපාර්තමේන්තුව හරහා නව පරිගනක මෘදුකාංගයක් වෙළඳසැල් සඳහා හඳුන්වාදීමට නියමිත බවත් එමගින් ගුවන් මගීන්ට ගුවනේ සිට අවශ්‍ය භාණ්ඩ ඇනවුම් කිරීමට පහසුකම් ලබා දෙන බවත් එය බැඳුම්කර ගුදමේ දත්ත පද්ධතියට සම්බන්ධ කරන බවත් ඉදිරියේ දී සක්‍රීය ගුවන් ගමන් බලපත්‍රයකට පමණක් භාණ්ඩ මිල දී ගැනීමට හැකි වන පරිදි නව වැඩපිළිවල ක්‍රියාත්මක වන බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය.<br>ගුවන් මගීන්ට හිමි බදු සහනය නියමාකාරයෙන් නොලැබෙන බවද කාරක සභාව නිරීක්ෂණය කළේය.<br>පසුගිය අවුරුදු තුනක කාලයක් තුල තීරු බදු නිදහස් පදනම මත භාණ්ඩ අලෙවි කරන වෙළඳ සැල් සඳහා ලබා දුන් භාණ්ඩවල වටිනාකම සහ ලබා දුන් බදු සහන පිළිබඳ වාර්තාවක් මසක් ඇතුලත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 5. | රේගු බදු කටයුතු සඳහා වටිනාකම් තක්සේරු කිරීම් නිරන්තරව වෙනස් කිරීම හේතුවෙන් විශාල වශයෙන් බදු අලාභ සිදුවන බව පෙන්වා දුන් කාරක සභාව ආනයනය කර තිබූ ප්‍රාඩෝ මාදිලියේ වාහන 407කින් සිදුවී ඇති බදු අලාභය දළ වශයෙන් රුපියල් මිලියන 3,000 ක් බව නිරීක්ෂණය කලේය. | මෙමඟින් කිසිදු අලාභයක් රජයට සිදුවී නොමැති බවත්, මේ වන විට අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද විශේෂ කමිටුවක් මගින් පරීක්ෂණයක් පැවැත්වෙන බවත් ග.නි. පැවසීය.<br>මේ පිළිබඳව පැවැත්වෙන පරීක්ෂණය පිළිබඳ වාර්තාවක් 2016 ජුලි 15 වන දින වන විට කාරක සභාව වෙත ලබා දෙන ලෙස නියෝග කරන ලදී. |
| 6. | අයවැය මගින් මිල වැඩි කල වාහන ආයනික බදු මග හැරීම සඳහා වාහන ශ්‍රී ලංකා වරාය පරිශ්‍රයට පැමිණීමට දින 03 ක් සහ දින 06කට පමණ පෙර රේගු පරිගනක පද්ධතියට, රේගු සටහන් කර ඇතුළු කිරීමට කටයුතු කිරීම. | මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වාගෙන යන බව ග.නි. සඳහන් කළ අතර , එම පරීක්ෂණය අවසන් කළ වහාම වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි වෙත දැන්වීය. |
| 7. | බී.එම්.ඩබ්ලිව්.එම්. 05 මාදිලියේ සිලින්ඩර ධාරිතාවය 4395 ක් වූ වාහන දෙකක් ආනනය සඳහා බදු ගෙවීමේ දී නියම කළ යුතුව තිබූ ස්ථාවර මිලට වඩා පහළ මිලක් නියම කිරීම හේතුවෙන් රජයට අවම වශයෙන් රු.7,705,170 /= ක රේගු බදු ආදායමක් රජයට අහිමි වීම. | මේ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වෙන බවත් අදාල පුද්ගලයන්ගෙන් සාක්ෂි විමසා ඇති බවත් ප්‍රකාශ කල ග.නි. ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීමට එකඟ විය. |
| **ශ්‍රී ලංකා යුධ හමුදාව<br>2016 ජුනි 24** | | |
| 1. | පොදු තැන්පත් ගිණුමේ ඉතිරි වී ඇති රු. 1,327,018/= ක ශේෂය නිරවුල් නොකිරීම. | අධිකරණ ක්‍රියාමාර්ගයකට යටත්ව පවතින රු. 400,000/= ක මුදල හැර සෙසු සියලුම ශේෂයන් එලැඹෙන ජූලි මස අවසන් වීමට පෙර නිරවුල් කිරීමට කටයුතු කරන බව ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 2. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමේ පවතින හිඟ හිටි ණය ශේෂ | අග්‍රහාර රක්ෂණය මත ඇපකරුවන් රහිතව නිකුත් කොට තිබූ උත්සව අත්තිකාරම් හේතුවෙන් මෙම තත්වය උද්ගතව ඇති බවත්, එමෙන්ම මින් ඉදිරියට ණය නිකුත් කිරීමේදී ඇපකරුවන් සහිතව එම ණය නිකුත් කරනු ලබන බවත්, අනිවාර්ය ඉතිරිකිරීම්වලින් අයකරගැනීමට කටයුතු කිරීම හා සේවය හැර ගිය අයට පොදු සමා කාලයක් ලබාදී නැවත සේවයට වාර්තා කිරීමට අවකාශ ලබාදීම මගින් එම ණය අයකරගැනීමට කටයුතු කර ඇති බවත් ග.නි. පැවසීය. |
| 3. | 2015 දෙසැම්බර් මස 31 වන දිනට බේරුම් නොකළ රු. 552,425,500/- ක බැරකම් පැවතීම. | මෙම මුදලින් 75%ක පමණ ප්‍රමාණයක් යුධ හමුදාවට සපයන ලද ඉන්ධන වෙනුවෙන් මහා භාණ්ඩාගාරය මඟින් ගෙවිය යුතු මුදල් වන අතර, ඉතිරි මුදල නිරවුල් කිරීමට කටයුතු කර ඇති බවත්, ප්‍ර.ග.නි පැවසීය. |
| 4. | අවුරුදු 55 ඉක්මවූ මියගිය රණවිරුවන්ගේ ඥාතීන් වෙත වැටුප් හා දීමනා ලෙස රු. 15,626,164/= ක මුදලක් ගෙවීම නිවැරදි කරන ලෙසට ලබා දී තිබූ උපදෙස් වල ක්‍රියාත්මක භාවය | එම මුදලින් රු. මිලියන 13 ක් මේ වන විට අයකරගෙන තිබෙන බවත්, ඉතිරි මුදල අයකරගැනීම සඳහා කටයුතු යොදා ඇති බවත් ග.නි. පැවසීය. |
| 5. | පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව කටයුතු කර තිබීම හා ලබාගෙන තිබූ පොත් සඳහා භාණ්ඩ ලැබීමට පෙර මුදල් ගෙවා තිබීම. | මේ පිළිබඳ අදාළ නිලධාරියාට එරෙහිව විනයානුකූලව කටයුතු කොට ඇති බවත්, මින් ඉදිරියට සියලු කටයුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගතව සිදු කරන බවත් ග.නි. සඳහන් කලේය. |
| 6. | මෝදර රොක්හවුස් කඳවුරේ ඉදිකිරීමක් සඳහා පෙර නිමි කොන්ක්‍රීට් මිලදී ගැනීම වෙනුවෙන් කොන්ක්‍රීට් නිපදවීම සිදු | තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ලියාපදිංචි සැපයුම්කරුවෙකු වෙත මෙම ටෙන්ඩර් ප්‍රදානය සිදුකර ඇති බවත්, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | නොකරන්නාවූ ගාමිණී ෆර්නිචර් ඇන්ඩ් ටිම්බර් ස්ටෝර්ස් නම් ආයතනයක් වෙත ටෙන්ඩර් ප්‍රදානය කිරීම. | එහි ඉදිකිරීම් කටයුතු යථා පරිදි නිමකොට ඇති බවත් ග.නි. පැවසීය. ටෙන්ඩර් ප්‍රදානයට පෙර අදාළ සැපයුම්කරුවන්ගේ ශක්‍යතාව පිළිබඳ අවධානය යොමු කළ යුතු බව කාරක සභාව විසින් අවධාරණය කරන ලදි. |
| 7. | සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය දුර්වල මට්ටමක පවතින බැවින් එය විධිමත් කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් | හමුදා කටයුතු අනෙකුත් ආයතන කටයුතු වලට වඩා විශේෂිත ලෙස සැලකිය යුතු බැවින්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ යම් වෙනස්කම් කිරීමට අවශ්‍යවන්නේ නම් ඒ අනුව නීති රීති හා රෙගුලාසි සකස්කර ගන්නා ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි. වෙත උපදෙස් දෙන ලද අතර එම සමස්ත ක්‍රියාවලිය පිළිබඳ රේඛීය අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් අවශ්‍ය කටයුතු සම්පාදනය කොට ඒ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස ද ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදි. |
| 8. | ත්‍රිවිධ හමුදාවේ ගිණුම් අංශයන්හි පවතින පුරප්පාඩු හා ගණකාධිකාරි සේවයේ නිලධාරීන්ගේ අවශ්‍යතාවය | වරලත් ගණකාධිකාරි වරයෙකු වන අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂවරයෙකු යුධ හමුදාවේ සිටින බවත්, ඔහු යටතේ සුදුසුකම්ලත් නිලධාරීන් 16 ක් හා සේවක මණ්ඩලය 256 ක් සිටින බවත්, යුධ හමුදාව තුළ අභ්‍යන්තර විගණන කටයුතු විධිමත් අයුරින් සිදුවන බවත්, ග.නි.පැවසීය. විගණන නිලධාරීන් හා ගණකාධිකාරි සේවය ස්වාධීන විය යුතු බවත්, විගණන මූලධර්ම වලට අනුව කටයුතු කළයුතු බවත් කාරක සභාව විසින් අවධාරණය කරන ලදි. භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව විගණන අංශ සෑම අමාත්‍යාංශයකම පිහිටුවා ඇති බවත්, යුධ හමුදාව වැනි ආයතනයක වුව ද සිවිල් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | නිලධාරීන්ගෙන් සැදුම්ලත් ස්වාධීන අභ්‍යන්තර විගණන ඒකකයක් පැවතිය යුතු බවත් මහා භාණ්ඩාගාර නිලධාරීන්ගේ අදහස විය. මේ පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇති බව ප්‍ර.ග.නි. පැවසීය. |
| 9. | භාවිතයෙන් පසු ඉවත් කරන ලද බර අවි පතුරම් කොපු බැහැර කිරීමේ ක්‍රමවේදය සහ යුද්ධය නිම වීමෙන් පසු ඉතිරිව ඇති උණ්ඩ අලෙවියේදී යම් අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න පිළිබඳව කාරක සභාව විමසීය. | හිස් පතුරම් කොපු කාර්මික සංවර්ධන මණ්ඩලයට ලබාදීමේ ක්‍රමවේදයෙහි සිදුව ඇතැයි කියන අක්‍රමිකතා හේතුවෙන් මේ වන විට නවතා ඇති බවත්, ආරක්ෂක අමාත්‍යාංශයේ අවසරය මත පන්සල් කිහිපයකට සුළු කොටසක් ලබා දී ඇති බවත්, ඉතිරිව පවතින ප්‍රමාණය විවෘත ටෙන්ඩර් ක්‍රමය යටතේ විකිණීමෙන් පසු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇති බවත් ග.නි. පැවසීය. යුද්ධය නිම වීමෙන් පසු ඉතිරිව ඇති උණ්ඩ දේශීය කර්මාන්තකරුවන්ට ලබාදීමේ ක්‍රියාවලිය සහ අලෙවිකරණ ක්‍රමවේදය පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත එවීමට කටයුතු කරන බව ග.නි. වැඩි දුරටත් පැවසිය. |
| 10. | යුධ හමුදා සුභ සාධන ක්‍රියාදාමයේ වත්මන් ප්‍රගතිය | ක්‍රියාන්විත රාජකාරියේදී මියගිය හා දරුණු තුවාල ලැබූවන්ට එම වැඩපිළිවෙලෙහි ප්‍රමුඛත්වය ලැබෙන බවත්, ඒ අනුව මේ වන විට හඳුනාගත් පවුල් 402 ක් සඳහා නිවාස ඉදිකරදීමේ ව්‍යාපෘතියක් යුධ හමුදාව මගින් අරඹා ඇති බවත් ග.නි. පැවසූ අතර එයට අමතරව ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති "අපි වෙනුවෙන් අපි" අරමුදල මගින් ද නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන බවත් පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 11. | ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ දරුවන් ජාතික පාසල් වලට ඇතුලත් කරගැනිමේදී පැවති කෝටාව 7 සිට 5 දක්වා අඩුකර තිබීම. | මෙම කෝටාව වැඩි කිරීම පිළිබඳව නැවත අධ්‍යාපන අමාත්‍යාංශයේ අවධානයට ලක් විය යුතු බව කාරක සභාවේ මතය විය. |
| **ශ්‍රී ලංකා ගුවන් හමුදාව<br>2016 ජුනි 24** | | |
| 1. | ත්‍රිවිධ හමුදාවේ අභ්‍යන්තර විගණන අංශ ශක්තිමත් කිරිම සඳහා ගණකාධිකාරි සේවාවේ සිවිල් නිලධාරින් යෙදවිම. | ත්‍රිවිධ හමුදාවේ සිවිල් තනතුරු සඳහා බඳවා ගැනිමේ දි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වන බැවින් ආරක්ෂක අමාත්‍යාංශය හරහා එම අනුමැතිය ලබාගෙන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට යොමු කර අවශ්‍ය නිලධාරින් ලබා ගැනිමට කටයුතු කරන බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br>ත්‍රිවිධ හමුදාවට අවශ්‍ය කාර්ය මණ්ඩල තොරතුරු නොපමාව මුදල් අමාත්‍යාංශය වෙත යොමුකර අනුමැතිය ලබාගෙන අගෝස්තු 01 දිනට සියළු තනතුරු පිරවිමට කටයුතු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. වෙත නියෝග කළේය. |
| 2. | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බිහිණුමට අදාලව 2010 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු. 23,466,822/= ණය ශේෂය අයකර ගැනීම හෝ කපා හැරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග වල ප්‍රගතිය. | රුපියල් ලක්ෂ 45 ආසන්න මුදලක් අයකර ගැනිමට කටයුතු කර ඇත. ගෙවීම් පැහැර හැර ඇති ණය 1640 ක් අතරින් රු. 10,000/= ට අඩු ණය 1021 කපා හැරිමටත් ණය 439 ක් යළි අයකර ගැනිමටත් කටයුතු කර ඇති අතර ඉදිරියේදි මෙවැනි ණය ශේෂයන් ඇති නොවීමටත් වගබලා ගන්නා බවත් ප්‍ර.ග.නි./ග.නී පැවසිය.<br>ණය අයකර ගැනිමේ පැවති දුර්වලතාවයන් නිරීක්ෂණය කළ කාරක සභාව නිසි ක්‍රමවේදයක් අනුව අදාල අංශය ශක්තිමත් කර ගත යුතු බව අවධාරණය කළේය. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| 3. | 2012 වර්ෂය සඳහා ගුවන් හමුදාවට සපත්තු මිලදි ගැනිමේදි කලින් වර්ෂයේ සැපයුම්කරුගේ අවම මිල ගණන් නොසලකා වැඩි මිලට මිලදී ගැනිමෙන් රු. 5,502,000/= ක මුදලක් ඉතිරිකර ගැනිමට කටයුතු නොකිරිම සහ තාක්ෂණ ඇගයිම් කමිටු නිර්දේශයන් විගණන අවශ්‍යතාව සඳහා ඉදිරිපත් නොකිරිම. | හෙලිටුවර්ස් ට්‍රේඩින් අනුබද්ධ සමාගම හරහා මිලදි ගැනිම සිදුකර ඇති අතර මිලට ගත් භාණ්ඩවල පසු වගකිම එම ආයතනය විසින් නිසි පරිදි භාරගෙන කටයුතු කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි පැවසිය.<br>තාක්ෂණික ඇගයීම් කමිටුව නියමිත පිරිවිතරයන්ට අනුව භාණ්ඩ මිලදී ගැනීම නිර්දේශ කළද එම වාර්තාවේ සිදුවී ඇති වැරදීමක් හේතුවෙන් වැඩි මිලට ගැනීමට ක්‍රියා කිරීමෙන් කිසියම් අක්‍රමිකතාවක් සිදුව ඇති බව පැහැදිලි වන බැවින් ඒ සම්බන්ධව විනයානුකූලව කටයුතු කරන බව ප්‍ර.ග.නි පැවසීය.<br>ඉදිරියේදි විශේෂ හදිසි අවස්ථා හැරුනු කොට අනෙකුත් සෑම අවස්ථාවකදීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුගතව කටයුතු කර මෙවැනි දුර්වලතාවයන් ඇති නොවීමට කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 4. | මුදල් රෙගුලාසි 237 උල්ලංඝනය කරමින් 2015 දෙසැම්බර් 31 දින වනවිට රු.203,738,728/= වටිනා භාණ්ඩ කලින් මුදල් ගෙවා පෞද්ගලික ආයතන වෙතින් මිලදි ගැනිම. | විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය, ප්‍රමිති කාර්යාංශය, ගමනාගමන මණ්ඩලය, එයාර් ලංකා ගුවන් සමාගම වැනි රාජ්‍ය ආයතන වෙතින් ණය පහසුකම් යටතේ සේවා සපයා ගැනිමේ දි පවතින දුෂ්කරතා නිසා මෙවැනි ක්‍රමයක් අනුගමනය කිරීමට සිදුවු බවත් අත්‍යාවශ්‍යම මිලදි ගැනිමක් හැර කලින් මුදල් ගෙවා මිලදි ගැනිම් දැනට සිදු නොකරන බවත් අනාවරණය විය.<br>මෙවැනි මිලදි ගැනිම් හේතුවෙන් ප්‍රමිතියෙන් තොර භාණ්ඩ ලැබිමත් ව්‍යාජ බිල්පත් ඉදිරිපත් කිරිමත් සිදුවිය හැකි බැවින් ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව කටයුතු කර අක්‍රමිකතා අවම කර ගැනිමට කටයුතු කරන ලෙස කාරක සභාව උපදෙස් දුන්නේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 5. | සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස රජයේ නිලධාරීන් කටයුතු කිරිමේ දි පවතින නීතිමය තත්ත්වය | ගුවන් හමුදාවට අනුබද්ධ හෙලිටුවර්ස් ආයතනය වාණිජ පදනමක් මත සේවා සපයන ආයතනයක් වන අතර එහි ආදායම් භාණ්ඩාගාරයට බැර කරන බවත් මෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් කිසිඳු වේතනයක් හෝ දීමනාවක් ලබා නොගන්නා බවත් ප්‍ර.ග.නි./ග.නි පැවසිය.<br>සමාගම් පනත යටතේ රජයේ නිලධාරීන් සමාගමක නිලතල දැරීම පිලිබඳව ගැටළුවක් පවතින බව පිළිගත් ප්‍ර.ග.නි./ග.නි. ඒ පිලිබඳව නැවත විමර්ශනයක් සිදු කිරිමට කටයුතු කරන බව වැඩිදුරටත් පැවසිය. |
| 6. | 2010 දෙසැම්බර් 31 දිනට රජයේ පොදු සේවා සැපයිම් වෙනුවෙන් ගුවන් හමුදාවට රුපියල් මිලියන 5.7 ක මුදලක් අයවිය යුතුව ඇති අතර එයින් රුපියල් මිලියන 1.6 විදේශ කටයුතු අමාත්‍යාංශයෙන්ද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලක්ෂ 9 ක් ද ජනාධිපති ලේකම් කාර්යාලයෙන් රුපියල් මිලියන 2.3 ද විය. | අයකර ගැනිම සඳහා අදාල අංශ වෙත යොමු කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසිය. |
| 7. | අභ්‍යන්තර අරමුදල් 96 පවත්වා ගෙන යාම, ඒවායේ ක්‍රියාකාරිත්වය සඳහා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන තිබිම ආයෝජන ආදායම් වලින් රාජ්‍ය භාගය නොගෙවා සුභසාධන අරමුදල්වල පමණක් බැර කිරිම මෙන්ම එම ව්‍යාපෘති සහ ඒවායේ ගිණුම් තොරතුරු විගණන අංශ වෙත නිසි පරිදි ලබා නොදිම. | ගුවන් හමුදා සාමාජිකයින්ගෙන් මාසික වැටුපෙන් අයකරන මුදල් ආයෝජනය කර ත්‍රිවිධ හමුදා සේවා නියුක්තිකයන් හට සහනදායි මිල ගණන් යටතේ සේවා ලබාදිමත් ගුවන් හමුදාවේ ඒකක 24 ක පවතින නිවස්න, අවන් හල් සහ යහසාදක අරමුදල ආදියේ විවිධ ගිණුම් පවතින බවත් සැම ගිණුමක්ම නිසි විගණනයට භාජනය කර පවත්වාගෙන යන අතර රජයේ ප්‍රතිපාදන වල හිඩැස පියවා ගැනිම සඳහා යොදා ගන්නා බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br>රජයේ දේපල සහ සේවකයින් යොදා සිදුකරන ආදායම් උත්පාදන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ව්‍යාපෘතිවලින් ලැබෙන මුදල් සුභසාධන අරමුදල්වල පමණක් බැරකිරීම සාධාරණ නොවන අතර කැපවෙන සේවක කොටස් වලට මෙන්ම රජයේ යෙදවුම් සඳහා ද සාධාරණ ප්‍රතිශතයක් හිමිවිය යුතු බවත් ඒවා ක්‍රමවත් කිරිම මිස අඩපණ කිරිම කාරක සභාවේ අරමුණ නොවන බවත් කාරක සභාව අවධාරණය කළේය. ත්‍රිවිධ හමුදාව මෙහෙයවන කාර්යයන් පොදු විගණන ප්‍රතිපත්තියක් යටතේ තවදුරටත් පවත්වාගෙන යාම සඳහා ක්‍රමවේදයක් සකස් කර මාසයක් තුල කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි.ට නියෝග කළේය. |
| 8. | 2009 වර්ෂයේදී සූර්ය බල වීජී පහන් 187 සහ බැටරි 37 මිලදී ගැනිම හා වගකිම් කාලය තුලදිම ඒවා අක්‍රිය විම හේතුවෙන් ගුවන් හමුදාවට මිලියන 19 ක අලාභයක් සිදුවිම. | 2009 වර්ෂයේ මෙම භාණ්ඩ ආයතන2 කින් මිලදී ගෙන ඇති අතර පසුව සොයා බැලිමේදි එම ආයතන දැනට නොමැති බව අනාවරණය විය. ඒ සම්බන්ධයෙන් පරික්ෂණයක් පැවැත්වෙන අතර පාඩුව අයකරගැනිම සඳහා නීති උපදෙස් ලබාගැනිමට කටයුතු කරන බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය |
| 9. | වර්තමානයේ විශාල ගොඩනැගිලි ඉදිවෙමින් පවතින අතර ඒවායේ මතුවිය හැකි ගිනි අවදානම සඳහා ගුවන් හමුදා ගිනි නිවිමේ ඒකකයේ පූර්ව සූදානම. | ගිනි නිවිමේ ඒකකයේ උපකරණ රත්මලාන සහ කටුනායක ස්ථාන ගතකර ඇති බවත් කොළඹ නගරාසන්නයේ සුදුසු ස්ථානයක් නොමැති විම ගැටළුවක් බවත් ප්‍රමාණවත් ඉඩකඩ සහිත ස්ථානයක් ලබා දිම කාලීන අවශ්‍යතාවයක් බවත් ඕනැම ගිනි අභියෝගයකට ගුවන් හමුදා ගිනි නිවීමේ ඒකකය සූදානම් බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. මෙම කාරණය පිළිබඳව මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයට ඉල්ලිමක් යොමු කරන ලෙසත් සාකච්ඡා කර සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර දිමට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | මැදිහත් විය හැකි බවත් කාරක සභාව දැන්විය. |
| **ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව<br>2016 ජූලි 08** | | |
| 1. | පාසල් විෂය මාලාවට හඳුන්වාදෙන ලද තාක්ෂණ විෂය මාලාව ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය | මෙම විෂය මාලාව හඳුන්වා දීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් කළ නිර්දේශයන් ඒ අයුරින්ම ක්‍රියාත්මක නොවූ බව කොමිෂන් සභා සාමාජිකයින් විසින් පෙන්වා දෙන ලදි. එම කරුණු පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව, තාක්ෂණ විෂය ධාරාව පාසල් තුළ ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේද හා ඒ සඳහා නිකුත් කළ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්දේශයන් සමඟ වූ ගැලපීම් හා නොගැලපීම් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාව වෙත එවන මෙන් ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |
| 2. | දීර්ඝ කාලයක් වැය කොට සකස් කිරීමෙන් අනතුරුව කැබිනට් මණ්ඩලය අනුමත කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත්කරන ලද ගුණවර්ධන කමිටු වාර්තාව පිළිබඳ | කොමිෂන් සභාව විසින් නව වාර්තාව සකස් කිරීමේදී එම ගුණවර්ධන කමිටු වාර්තාවේ නිර්දේශ මෙන්ම ඊට අනුෂංගිකව පැවති කමිටු වල නිර්දේශ හා යෝජනා ද සැලකිල්ලට ගත් බවත්, නව යෝජනා මාලාව ඒවායින් සැදුම්ලත් බවත් ග.නි. ප්‍රකාශ කරන ලදි. ගුණවර්ධන කමිටු නිර්දේශ හා සකස් කරන ලද නව වත්මන් කොමිෂන් සභා වාර්තාව අතර පවතින වෙනස්කම්, සමානකම් හෝ පරස්පරයන් සහ එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී සිදුවූ හෝ සිදුවන වෙනස්කම් ද ඇතුලත් වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන මෙන් |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | | ප්‍ර.ග.නි./ග.නි.වෙත නියෝග කරන ලදි. |
| 3. | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කිරීම, රැස්වීම් පැවැත්වීම, ගණපූරණය සහ කොමිෂන් සභාවට නියෝජ්‍ය සභාපතිවරු පත් කොට නොතිබීම සහ සාමාජිකයන් ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන් පත් කිරීම. | කොමිෂන් සභාව සාමාජිකයන් 15 දෙනෙකුගෙන් සමන්විත වේ. සිය කාර්යභාරය පිළිබඳ අවබෝධයෙන් යුතුව කාර්යක්ෂම හා අර්ථපූර්ණ අයුරින් කටයුතු කළ හැකි එමෙන්ම පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලුනු ප්‍රවීනයන් ද සහිත සංයුතියක් කොමිසම තුළ තිබිය යුතු බව කාරක සභාව අවධාරණය කරයි. |
| 4. | විදුහල්පතිවරුන් විසින් පරිපාලන කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කිරීම හේතුවෙන් පාසල් වල අධ්‍යාපන සංවර්ධනය අඩාල වෙමින් පැවතීම හා එම තත්වය හඳුනාගෙන එය සමනය කිරීම සඳහා කටයුතු කර තිබේදැයි කාරක සභාව විමසන ලදි. | මෙම තත්වය කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇති බවත්, පරිපාලන වගකීම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ නීති රීති සකස් කිරීමට යෝජනා කර ඇති බවත් හෙලිවිය. එමෙන්ම පාසල් දරුවන් මත ආරෝපණය වන විභාග පීඩනය අවම කිරීම සඳහාද නිර්දේශ ලබා දී ඇති බවත්, එක් උදාහරණයක් ලෙස අ.පො.ස.(සා.පෙළ) විභාගයේ විෂයයන් ගණන 8 දක්වා අඩුකිරීමට යෝජනා කිරීම දැක්විය හැකි බවත්, හෙතෙම වැඩි දුරටත් පැවසීය. කොමිෂන් සභාව විසින් සම්පාදනය කොට ඇති නව වාර්තාවේ අන්තර්ගතය පිළිබඳ අවධානය යොමුකළ කාරක සභාව එම වාර්තාව කඩිනමින් ජනාධිපතිවරයා වෙත භාරදීමට කටයුතු කරන මෙන් ප්‍ර.ග.නි./ග.නි. වෙත උපදෙස් ලබා දෙන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 5. | විශ්ව විද්‍යාල ප්‍රවේශ ක්‍රමවේදයේ පවතින අවිධිමත්භාවය හේතුවෙන් සිසුන්ට යම් අසාධාරණයක් සිදු වීම | යම් පාඨමාලාවක් සඳහා පළමුවරට ලියාපදිංචි වූ සිසුන්ට දෙවන වර විභාගය සමත්වූ පසු එම ප්‍රතිඵල මත අදාළ වන පාඨමාලාවට, පළමු ලියාපදිංචිය හේතුකොට ගෙන, ඇතුලත්විය නොහැකි වන බැවින් ඔවුනට අසාධාරණයක් වන අතර ඒ හේතුවෙන් විශ්ව විද්‍යාලවල ඉඩකඩ තිබියදී සිසුන් ඇතුලත් නොවීම හේතුවෙන් තවත් සිසු පිරිසකට ද අසාධාරණයක් සිදුවන බව කාරක සභාවේ නිරීක්ෂණයට ලක් විය. එම කරුණු අනුව මෙම ගැටලුව නිරාකරණය කිරීම සඳහා යම් ප්‍රතිපත්තිමය තීරණයකට එලැඹීමේ අවශ්‍යතාවයක් පවතින බව කාරක සභාව අවධාරණය කළ අතර ඒ සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ද මැදිහත්විම හා දායකත්වය ලබාදෙන ලෙස දන්වන ලදි. |
| 6. | පාසල් දරුවන්ට පාසල තුළදී මෙන්ම ඉන් පිටත දී සිදුවන ලිංගික අපයෝජන වලක්වා ගැනීම සඳහා වන ක්‍රමවේදයක අවශ්‍යතාවය පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. | ඒ සඳහා දරුවන් දැනුවත් කිරීමේ විකල්ප ක්‍රමවේද මෙන්ම පාසල් විෂය මාලාවට ලිංගික අධ්‍යාපනය ඇතුළත්කිරීමේදී අනුගමනය කළ යුතු සූක්ෂම පිළිවෙත් පිළිබඳව ද කාරක සභාවේ සාකච්ඡාවට භාජනය විය. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සකස්කිරීමේදී මෙම කරුණ පිළිබඳව ද විශේෂ අවධානය යොමු කරන මෙන්, කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත උපදෙස් ලබා දෙන ලදි. |
| **රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br>2016 ජූලි 08** | | |
| 1. | 2010, 2011 හා 2012 වර්ෂ සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබීම. | එම වසර සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණද, 2016 වර්ෂය සඳහා |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර මේ වන විට පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා යොමු කර ඇති බව කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ප්‍රකාශ කරන ලදී. එම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගති සමාලෝචනය හා ප්‍රගති වාර්තා කිරීම් සිදු විය යුතු බව කාරක සභාව විසින් අවධාරණය කරන ලද අතර එම ප්‍රගති වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නියෝග කරන ලදී. |
| 2. | කොමිෂන් සභාවට එරෙහිව රජයේ නිලධාරීන් විසින් ගොනු කර ඇති නඩු සඳහා මීට පෙර නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගෙන තිබුණද පෞද්ගලික නීතිඥ සහාය ලබා ගෙන නොතිබුණි. එහෙත් එක්තරා නඩුවකට විශේෂ ලෙස සලකා නීතිපතිගේ අනුමැතිය නොමැතිව පෞද්ගලික නීතිඥ සහාය ලබා ගෙන ඒ වෙනුවෙන් රු. 318,052/-ක් ගෙවීම. | එම නඩුවේ මුල් නඩු වාර දෙකක් සඳහා නීතිපති දෙපාර්තමේන්තුව පෙනී සිට ඇත ඊට පසු නඩු වාර සඳහා පෞද්ගලික නීතිඥ සහාය ලබා ගන්නා ලෙස නීතිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත දන්වා ඇති බව කොමිෂන් සභාවේ ලේකම්වරයා ප්‍රකාශ කළේය |
| 3. | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන නිම නොකළ විනය කටයුතු, නව බඳවා ගැනීමේ පරිපාටි, නව සේවා ව්‍යවස්ථා, ස්ථාන මාරු පටිපාටි සැකසීම, අභියාචනා ආදී කරුණු සම්බන්ධයෙන් කාරක සභාව විමසීය. | අභියාචනා විභාග කිරීම සම්බන්ධයෙන් පමණක් යම් ප්‍රමාදයක් පවතින බවත්, අමාත්‍යාංශ වලින් නිරීක්ෂණ ලැබී ඇති අභියාචනා සම්බන්ධයෙන් ඉදිරි කටයුතු ක්‍රමානුකූලව කර ගෙන යන බවත්, ලේකම්වරයා විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කර සිටින ලදී. අභියාචනා සම්බන්ධයෙන් ඇතැම් අමාත්‍යාංශ වලින් නිරීක්ෂණ එවීම ප්‍රමාද වී ඇති අතර එම අමාත්‍යාංශ සම්බන්ධ වාර්තාවක් ජූලි 20දා මීළඟ රැස්වීමට රැගෙන එන ලෙස කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නියෝග කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ඉහත සඳහන් කළ කරුණු සම්බන්ධයෙන් ආකෘති පත්‍ර, උපදෙස් පත්‍රිකා අවශ්‍ය තොරතුරු ලැයිස්තුවක් සකසා අදාළ අමාත්‍යාංශවලට යොමු කරන ලෙසත්,, එම ලැයිස්තුවට අනුකූල නොවන තොරතුරු භාර නොගෙන, එම තොරතුරු යථා පරිදි සම්පූර්ණ කර නැවත ගෙන්වා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකසන ලෙසත් කාරක සභාව කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නියෝග කරන ලදී. |
| **නීතිපති දෙපාර්තමේන්තුව<br>2016 ජූලි 20** | | |
| 1. | ගණන් දීමේ නිලධාරියා වන නීතිපතිවරයා මෙම රැස්වීමට සහභාගි නොවීම පිළිබඳ කාරක සභාවේ විමසුමට ලක්විය. | පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමට සහභාගිවන ලෙස සිදුකරන ලද විධිමත් කැඳවීමකින් අනතුරුව, ඒ සඳහා අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මෙන්ම ගණන් දීමේ නිලධාරියා වන නීතිපතිවරයා සහභාගි වීම හෝ නොවීම පිළිබඳ පවතින නීතිමය තත්වය පැහැදිලි ලෙස දක්වමින් 2016 ජූලි මස 27 දිනට පෙර වාර්තාවක් ලබාදෙන මෙන් කාරක සභාව විසින් ප්‍ර.ග.නි.වෙත නියෝග කරන ලදි. |
| **සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය<br>2016 ජූලි 20** | | |
| 1. | ගිණුම් කාරක සභාව මගින් රාජ්‍ය ආයතනවල මානව භෞතික සහ මූල්‍ය කාර්ය සාධනය ඇගයීම සඳහා සකස් කළ ප්‍රශ්ණාවලිය අනුව මෙම අමාත්‍යාංශයේ කාර්යය සාධනය | මෙය මෑතකදි ස්ථාපිත කරන ලද අමාත්‍යාංශයක් බැවින් පවතින මූල්‍ය මානව හා භෞතික කාර්යය සාධන අඩුපාඩු නිවැරදි කර ගනිමින් සිටින බව ප්‍ර.ග.නි. පැවසිය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. | විසර්ජන ගිණුම් සකස් කිරීම, පොත්පත් ලේඛණ නඩත්තුව, මූල්‍ය බලතල පැවරීම, ගිණුම් කටයුතු, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, අභ්‍යන්තර විගණන ඒකකය, විගණන කළමනාකරණ කමිටුව ආදි පිළිබඳව අවධානය යොමු කළ කාරක සභාව ඒවායේ පවතින අඩුපාඩු නිවැරදි කර ක්‍රමවත් කර ගැනීමේ අවශ්‍යතාවය දැඩිව අවධාරණය කළේය. |
| **ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය<br>2016 ජූලි 21** | | |
| 1. | 2015 වර්ෂයේදී රු. මිලියන 16 ක් පමණ පිරිවැයක් දරා වේලාඩ් ආයතනය මගින් රිදීගම ගොවිපොළේ මාර්ගයක් ඉදිකර ඇති අතර රු. මිලියන 160 ක් ගොඩනැගිලි සහ මඩු සඳහා වියදම් කර ඇත. මෙම ඉදිකිරීම් සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවී ඇති අතර එම ඉදිකිරීම් ගුණාත්මකව සතුටුදායක තත්ත්වයක නොපැවති හා, මෙම මිළ ගණන් පිළිගත නොහැකි වීම. | මේ පිළිබඳව විශේෂ කමිටුවක් පත් කර එහි නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කරන බවත්, අදාළ මාර්ගය ගුණාත්මක බවින් යුතුව ඉදිකර ඇති බවත් අනෙකුත් ඉදිකිරීම් සම්බන්ධව පශු සම්පත් මණ්ඩලය සෑහීමට පත්වී ඇති බවත් සියලුම කටයුතු සම්බන්ධව පසු විපරම් කටයුතු කරන බවත් ප්‍ර.ග.නි. විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. |
| 2. | රු. බිලියන. 4.3 ක වියදමින් කිරි ගවයින් 4500 ක් ආනයනය කර ඇති අතර එම ගවයින් රක්ෂණය කර නොමැති වීම හා ආනයනික කිරි ගවයින් අතුරින් සැලකිය යුතු සංඛ්‍යාවක් (10% ක් පමණ) මරණයට පත් වීම. | කලින් පැවති පශු සම්පත් අමාත්‍යාංශය යටතේ පැවති, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ග.නි. කාලගුණ වෙනස්කම් හේතුවෙන් සහ අමතරව රෝග වලට ගොදුරු වීම හේතුවෙන් සමහර ගවයින් මරණයට පත් වූ බවත් නැව් මගින් ප්‍රවාහනය කිරීමේදී සතුන් මිය නොගිය බවත් පැවසීය. එසේම ප්‍රවාහනයේදී මියයන සතුන් සඳහා රක්ෂණ ආවරණයක් මගින් හිලව් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කරන බව ප්‍ර.ග.නි. විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.<br>මේ පිළිබඳව ගවයින් ආනයනය කිරීමේදී වූ පාඩුව, රක්ෂණය කිරීම හා සතුන් මියයාමට හේතු ද ඇතුළත් විස්තරාත්මක වාර්තාවක් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව නියෝග කරන ලදී. |
| 3. | බඩල්ගම කිරි නිෂ්පාදන කර්මාන්ත ශාලාව පිහිටුවීම. | මෙම කර්මාන්ත ශාලාව යුරෝ මිලියන 36.8 කට ඇස්තමේන්තු කර ඇති බවත්, සැකසුම් ධාරිතාව කිරි ලීටර් ලක්ෂ 2 ක් වන බවත් මෙය ආරම්භ කළ පසු නාරාහේන්පිට කර්මාන්තශාලාව වසාදමන බවත් 2018 අවසානයේදී වැඩ අවසන් කිරීමට නියමිත බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 4. | පවතින කිරි අලෙවිසැල් වැසී යාම සහ අළුතින් අලෙවිසැල් ආරම්භ කිරීම. | කිරි අලෙවිසැල් වලින් අපේක්ෂිත ලාභය නොලැබීම නිසා සමහර අලෙවිසැල් වැසුනු බව ප්‍ර.ග.නි. විසින් දැනුම් දෙන ලදී.<br>මෙය නැවත ආරම්භ කිරීම සහ නිසියාකාරව පවත්වාගෙන යාම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ඇතුළත් සවිස්තර වාර්තාවක් මාසයක් ඇතුළත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කලේය. |
| **5.** | ආර්ථික මධ්‍යස්ථාන වල ගිණුම් ක්‍රමවත්ව පවත්වා නැති අතර විගණනයට ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් පැවතීම. | අදාළ ප්‍රාදේශීය ලේකම් වරයාගේ අධීක්ෂණය යටතේ මෙම මධ්‍යස්ථාන වල පරිපාලන කටයුතු සිදුවිය යුතු බැවින් මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරයා වගකිව යුතු බව පැවසූ කාරක සභාව මෙම කරුණු සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ආර්ථික මධ්‍යස්ථාන වල ගිණුම් |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | | කටයුතු, එම මධ්‍යස්ථාන වල දැනට පවතින තත්ත්වය හා ඒවා ක්‍රමානුකූලව හා නිවැරදිව ක්‍රියාත්මක කිරීම පිළිබඳව විස්තරාත්මක වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කලේය. |
| **6.** | අමාත්‍යාංශය විසින් පශු සම්පත් අංශයේ කිරි නිෂ්පාදනය වැඩි කිරීම වෙනුවෙන් 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු. මිලියන 5213.4 ක් වැය කර තිබුණු අතර, 2010 ට සාපේක්ෂව 2015 වන විට කිරි නිෂ්පාදනය ලීටර් 126,889,200 පමණක් වැඩි වී ඇත. ඒ අනුව ලීටරයක කිරි නිෂ්පාදනය වැඩි කිරීමට දරා ඇති පිරිවැය රු. 41 ක් වන නමුත් 2015 මහ බැංකු වාර්තාවට අනුව දියර කිරි නිෂ්පාදනයේ සාමාන්‍ය පිරිවැය ලීටරයට රු. 32.42 ක් ලෙස පෙන්වා ඇත. | දියර කිරි නිෂ්පාදනය ප්‍රචලිත කිරීම සම්බන්ධව “මිල්කෝ” ආයතනය කටයුතු කරන බවත්, අඩුපාඩු අවම කිරීමට කටයුතු යොදා ඇති බවත් කිරි නිෂ්පාදනය පිළිබඳ සංඛ්‍යාලේඛන අතර නොගැලපීමක් ඇති නමුත් මෙම ගණනය කිරීම් කෙටිකාලීන පදනමක් මත සිදු කිරීම සාධාරණ නොවන බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කරන ලදී. |
| | **සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**<br>**2016 ජූලි 21** | |
| 1. | කිරි ගොවීන්ගේ ආර්ථිකය නගා සිටුවීම සම්බන්ධයෙන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති පියවර. | අමාත්‍යාංශය විසින් විශේෂයෙන් සුළු පරිමාණ කිරි ගොවීන් සඳහා ප්‍රධාන ව්‍යාපෘති 3 ක් ක්‍රියාත්මක කරන බවත්, එනම් ඔවුන්ගේ නිෂ්පාදන එකතු කිරීමේ වැඩ පිළිවෙළ, ගොවිපොළවල් වල ඵලදායීතාව වැඩි කිරීම සහ ඉදිරියේදී විශ්‍රාම වැටුපක් ගෙවීමටත් යෝජනා කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කරන ලදී. |
| 2. | 2016 වන විට රටේ සමස්ථ කිරි නිෂ්පාදන ඉලක්ක සපුරාගැනීමේ හැකියාව. | සාමාන්‍යයෙන් එක් ගවයකුගෙන් දිනකට කිරි ලීටර 16 ක් හා ආනයනික ගවයකු ගෙන් කිරි ලීටර 20ත් 22ත් අතර ලබාගත හැකිබව අනාවරණය විය. එසේම රටේ දියර කිරි අවශ්‍යතාවය දිනකට මෙට්‍රික් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ටොන් 350, 000 ක් වන අතර නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 150, 000 ක් වන බැවින් මේ අතර පරතරය පියවීම සඳහා සැලසුම් සකස් කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. වැඩිදුරටත් පැවසීය. |
| **සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව<br>2016 අගෝස්තු 10** | | |
| 1. | 2014 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් බී ගිණුමේ අවම බැර සීමාවට රු. 1,891,058/= න් ලගා වීමට අපොහොසත් වීම. | අවම බැර සීමාව සංශෝධනය කර ගැනීම සඳහා අයදුම් කළ ද සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව අයත් වූ අමාත්‍යාංශයේ අමාත්‍යවරුන් කලින් කලට වෙනස් වීම මෙම ප්‍රමාදයට හේතු වූ බවත් දැනට ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි. කාරක සභාව වෙත දැන්විය. |
| 2. | 2007 පෙබරවාරි සිට 2008 සැප්තැම්බර් දක්වා කාලය තුල ප්‍රයෝජනයට නොගත් ගොඩනැගිල්ලක් සඳහා කුලිය ලෙස රු. 6,600,000/= මුදලක් ගෙවා තිබීම. | නිවාස සංවර්ධන අමාත්‍යාංශය සතු මහල් තුනකින් සමන්විත වූ මෙම ගොඩනැගිල්ලේ එක් මහලක් 2007 නොවැම්බර් 01 සිට මාස 3 කාලයක් රජයේ නියෝගයක් මත අස්සු මුබාරක් නැමති මුස්ලිම් උත්සවයක් සඳහා ලබා දීමට සිදුවීම නිසා එහි නවීකරණ කටයුතු ප්‍රමාද වූ බවත් දැන් එම ගොඩනැගිල්ල දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා පරිහරනය කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසිය.<br>මේ සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවත් හැකි ඉක්මනින් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. |
| 3. | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව බැංකු ගිණුම් පවත්වාගෙන යාම. | අතීතයේ බලකාවලට වෙන් වෙන්ව විවෘත කර තිබූ ගිණුම් සියල්ල වසා දමා 2016.08.01 දින සිට භාණ්ඩාගාර අනුමැතිය මත නව ජංගම ගිණුම් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | විවෘත කර ඇති බවත් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කළ තැන්පත් ගිණුම 2015.12.31 දින සිට වසා දමා එම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ බව සඳහන් කළ ප්‍ර.ග.නි/ග.නී. පසුගිය මාස 8 තුළ රුපියල් මිලියන 378 ක් පමණ උපයා එම අරමුදලට බැර කිරිමට කටයුතු කළ බව වැඩිදුරටත් ප්‍රකාශ කළේය. |
| 4. | 40,000 ආසන්න සේවක පිරිසක් සිටින සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් ඉටුකෙරෙන කාර්යයන් සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ කටයුතු වලට ඔවුන් දායක කර ගත හැකි ආකාරය | රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ කටයුතු වලට සිවිල් ආරක්ෂක බලකාය දායක කර ගත හැකි ආකාරය පිලිබඳ මෙහිදි සාකාච්ඡා කළ අතර මූලික පියවරක් ලෙස හමුදා සේවයෙන් විශ්‍රාම ලබා සිටින වෘත්තීය නිපුණත්වය සහිත පුද්ගලයින් 2500 පමණ හඳුනාගෙන තොරතුරු ලැයිස්තු ගත කර විවිධ ආයතනය වල පවතින වෘත්තිකයින්ගේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් ඔවුන් ඒ වෙත යොමු කර ඵලදායි සේවාවක් සලසා ගැනිමට කටයුතු කරමින් සිටින බව ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව වෙත පැවසිය.<br>සිවිල් ආරක්ෂක බලකායේ කටයුතු ප්‍රවර්ධනය කළ යුතු අතර ඒ සඳහා සැලසුම් සහගත වැඩ පිළිවෙලක් සකස් කිරිමේ අවශ්‍යතාවය කාරක සභාව දැඩිව අවධාරණය කළේය. ඒ සඳහා සංචාරක මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය සහ ආයෝජන මණ්ඩලය වැනි ආයතන එක්ව පොදු වැඩ පිළිවෙලක් සකස් කරන ලෙසත් එම කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සම්බන්ධීකරණය කරන ලෙසත් කාරක සභාව නිර්දේශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 5. | මුදල් රෙගුලාසි 115 (4) ට අනුව පූර්ව මුදල් වර්ෂයට කලින් වූ මුදල් වර්ෂයට අදාල ගෙවීම් සිදු කිරිමේදි ප්‍රධාන ගණන් දිමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් 2011 වර්ෂයේදී ඊට පටහැනිව රු. 1,353,408/= ක මුදලක් ගෙවා තිබිම. | මෙහි කිසියම් වැරදීමක් සිදුව ඇති බව පිලිගත් ප්‍ර.ග.නි./ග.නි. ඉදිරියේදි එවැනි දේ සිදුනොවීමටත් පවතින නිති රීතිවලට අනුකූලව කටයුතු කිරීමටත් එකඟ විය. |
| 6. | 2013 වර්ෂයේ වාහන 7 අළුත් වැඩියා කර නිර්දේශිත වාර්තා නොමැතිව රු. 467,455/= ගෙවා තිබිම. | අතීතයේ වාහන අළුත්වැඩියාව සම්බන්ධයෙන් වෘත්තීය නිපුනත්වයක් තිබූ හමුදා මේජර්වරයකුගේ නිර්දේශය මත අදාල ගෙවීම් සිදු කළ නමුත් වර්තමානයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුක්ත ප්‍රවාහන පරික්ෂකගේ නිර්දේශය මත පමණක් සිදුකරන බව ප්‍ර.ග.නි./ග.නි. පැවසිය.<br>අළුත්වැඩියාවට අදාලව සිදුකළ ගෙවීම් පිලිබදව වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි.ට නියෝග කළේය. |
| 7. | 2014 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතිවලින් උපයන ලද මුදල්වලින් රු. 9,457,520/= වියදමක් දරා විඩියෝ කැමරාවක් සහ උපංග මිලදි ගෙන තිබිම. | "ව්‍යාපෘති හා සේවා වැඩිදියුණු කිරිම හා ඊට සමගාමි දෙපාර්තමේන්තු වියදම්" යන ශීර්ෂය යටතේ භාණ්ඩගාර අනුමැතිය මත දෙපාර්තමේන්තු ව්‍යාපෘතිවලින් උපයන ලද මුදලින් මෙම වියදම දරන ලද බවත් වාර්ෂිකව 1% වූ ප්‍රාග්ධන වෙන්කිරිම් වලින් මෙවැනි මිලදි ගැනිමක් සිදුකිරීම ඉතා දුෂ්කර කාර්යයක් වන බවත් මෙම උපකරණ මගින් දැනට ලක්ෂ 19 ආසන්න මුදලක් උපයා ගැනිමට හැකිවි ඇති බැවින් එය නිෂ්කාර්ය වියදමක් නොවන බවත් ප්‍ර. ග.නි./ග.නි. පැවසිය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 8. | 2016.06.22 දින පැවති පොලිස් දෙපාර්තමේන්තු ගිණුම් කාරක සභාවේදී පොලිස් නිලධාරීන් වෙනුවට සිවිල් ආරක්ෂක නිලධාරීන් පොදු ස්ථාන ආරක්ෂාව සහ ප්‍රභූ ආරක්ෂාව සඳහා යෙදවීමේ හැකියාව | ඒ සඳහා මූලික ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් පලමු පියවර ලෙස එක් සිවිල් ආරක්ෂක නිලධාරීයෙකු බැගින් යෙදවීමත් ක්‍රමයෙන් එය වර්ධනය කරමින් අදාල කාර්යයන් සඳහා මෙම නිලධාරින් පමණක් යෙදවීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසිය. |
| **බස්නාහිර පළාත් සභාව<br>2016 අගෝස්තු 11** | | |
| 1. | විගණන ක්‍රියාවලියේ දී බස්නාහිර පළාත් සභාව තුළ පවතින පහත සඳහන් අඩුපාඩු විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙන ලදි.<br>- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබීම.<br>- විගණන කළමනාකරණ කමිටු ස්ථාපිත නොකිරීම.<br>- අභ්‍යන්තර විගණනය විධිමත්ව ක්‍රියාත්මක නොවීම.<br>- විගණන විමසුම් සඳහා පිළිතුරු නොලැබීම.<br>- මූල්‍ය ප්‍රකාශන නියමිත කාලයට ඉදිරිපත් නොකිරීම.<br>- රජයේ අරමුදල්/ ප්‍රතිපාදන කෙටි කාලීනව ආයෝජනය කිරීම හේතුවෙන් සාපේක්ෂව මූල්‍යමය පාඩුවක් සිදුවීම (මෙය බොහෝ විට සියලුම පළාත් සභාවලට පොදු ලක්ෂණයකි) | මෙම අඩුපාඩු යාවත්කාලීන කරන ලෙස කාරක සභාව උපදෙස් දුන්නේය. |
| 2. | පළාත් සභාව යටතේ පවතින ආයතන සඳහා ඉදිරිපත් කරන ලද නමුත් පිළිතුරු ලබා නොදුන් විගණන විමසුම් | විග්‍රහයට අදාළ සියලුම කරුණු සඳහා සකස් කරන ලද පිළිතුරු වාර්තාවක් කාරක සභාව වෙත එවන ලෙසත් එමෙන්ම විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදුන් පහත සඳහන් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළිතුරු නොදුන් විගණන විමසුම් ගණන = 12<br>- පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - පිළිතුරු නොදුන් විගණන විමසුම් ගණන = 14<br>- පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය - පිළිතුරු නොදුන් විගණන විමසුම් ගණන = 04<br>- පළාත් පාලන ආයතන - පිළිතුරු නොදුන් විගණන විමසුම් ගණන = 155 | ආයතන පිළිබඳව හේතු සහිත වාර්තාවක් 2016 සැප්තැම්බර් මස 11 දිනට පෙර කාරක සභාවට එවන ලෙසත් ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |
| 3. | රජයේ අරමුදල් / ප්‍රතිපාදන කෙටි කාලීනව ආයෝජනය කිරීම හේතුවෙන් සාපේක්ෂව රජයට මූල්‍යමය පාඩුවක් සිදුවීම. | ඒ පිළිබඳ විග්‍රහයකින් අනතුරුව පළාත් නවයටම අදාළව සකස් කරන ලද සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට එවන මෙන් විගණකාධිපතිවරයා වෙත දන්වන ලදි. මුදල් අමාත්‍යාංශය, මුදල් කොමිෂන් සභාව, පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කොට මෙම කරුණ පිළිබඳ සුදුසු හා සාධනීය වැඩපිළිවෙලක් යෝජනා කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. ට නියෝග කරන ලදි. |
| 4. | පළාත් සභාවේ අභ්‍යන්තර විගණන කටයුතුවල විධිමත් භාවය | අභ්‍යන්තර විගණනය සඳහා පළාත් සභාව තුළ ඒකකයක් ස්ථාපිත කර තිබුණ ද එය ප්‍රමාණවත් නොවන බව ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි. පළාත් සභාවල අභ්‍යන්තර විගණන ඒකක ස්ථාපිත කිරීම සඳහා සේවක සංඛ්‍යාව අනුමත කිරීමේදී සැලකිල්ලට ගත් කරුණු, සියලුම පළාත් සභා සඳහා අනුමත කර ඇති සංඛ්‍යාව සහ සාපේක්ෂව බස්නාහිර පළාත සඳහා අනුමත කර ඇති සේවක සංඛ්‍යාව පිළිබඳ වාර්තාවක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ලබාදෙන ලෙස භාණ්ඩාගාර නිලධාරීන්ට දැන්වීය. |
| **වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>2016 සැප්තැම්බර් 22** | | |
| 1. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන ගෙවීම් පරිපාටිය රජයේ මූල්‍ය රෙගුලාසි වලට අනුකූල නොවන බැවින් ඒ පිළිබඳ කාරක සභාව විමසීය. මෙම පරිපාටිය නිවැරදි කරන ලෙස 2011 මාර්තු මස 24 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගය ක්‍රියාත්මක කර නොමැති බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය. | පෙර තිබූ ක්‍රමය අනුව කොට්ඨාශ භාර ඉංජිනේරු අනුමත කිරීම සහතික කිරීම හා ගෙවීම යන කරුණු තුනම සිදු කළද වර්තමානයේදී එය නිවැරදි කර ඒ අනුව ගෙවීම් අනුමත කිරීම වාරිමාර්ග ඉංජිනේරු, සහතික කිරීම කොට්ඨාශ සහකාර සහ ගෙවීම ප්‍රධාන ලිපිකරු යන නිලධාරීන් විසින් සිදු කරන බවත් මෙම පරිපාටියට අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |
| 2. | ගිං නිල්වලා ව්‍යාපෘතියට අදාළව රු. මිලියන 40 ක් ඇස්තමේන්තු කර ඇති කරුණක් සඳහා ගිවිසුමට පටහැනිව 2015 වසරේ දී රු. මිලියන 2700 ක් අමාත්‍යාංශය විසින් චීන සමාගමකට වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (Mobilization Advance) ලෙස ගෙවා ඇති අතර මෙය ඇස්තමේන්තුගත මුළු මුදලින් 4.35% ක් වීම සහ එම කටයුතු තවමත් ආරම්භ කර නොතිබීම. | මෙම ව්‍යාපෘතිය සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර ඉන් අනතුරුව කැබිනට් මණ්ඩලය විසින් නැවත සලකා බැලීමට නියමිත බවත් ඉන් ලැබෙන නියෝග අනුව ඉදිරි කටයුතු සිදුකරන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 3. | ගංගා ද්‍රෝණි 103 ක් අතරින් සංවර්ධනය කිරීමට අවශ්‍ය ඒවා හඳුනා ගැනීමට කටයුතු කිරීම. | සංවර්ධනය කළ හැකි ගංගා ද්‍රෝණි 10 ක් හඳුනාගෙන ඒවා සංවර්ධනය කිරීමට කටයුතු කරමින් සිටින බවත් දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ අදියර 02 යටතේ මෙම කටයුතු සිදු කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි/ගණකන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ව්‍යාපාර 82 ක් දැනට හඳුනාගෙන ඇති අතර මේවා උපායමාර්ගික සැලසුම් ක්‍රමවේදය යටතේ අවම පාරිසරික හා සමාජීය බලපෑම් සහිත ව්‍යාපාර, පාරිසරික හා සමාජීය බලපෑම් අවම කරගැනීමට අවශ්‍ය ව්‍යාපාර සහ කළ නොහැකි ව්‍යපාර ලෙස හඳුනාගෙන අවම පාරිසරික හා සමාජීය බලපෑම් සහිත ව්‍යාපාර වලට ප්‍රමුඛතාවය දී අනතුරුව අනෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය.<br>2010 වසරේ සකස් කරන ලද ජල සම්පත් කළමනාකරණ සැලසුම් හා ඒවා ක්‍රියාත්මක වීමේ තත්ත්වය සහ නව කමිටුවේ කටයුතු පිළිබඳ දින වකවානු සහිත වාර්තාවක් ඔක්තෝබර් 22 දිනට පෙර ඉදිරිපත් කරන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 4. | හම්බන්තොට තංගල්ල අවට ප්‍රදේශ වල පානීය ජල ගැටලුව විසඳීමට අදාළව ගෙන ඇති පියවර හා කළු ගඟ හැරවීමේ ව්‍යාපෘතිය. | ගංවතුර තර්ජනය හා ජල හිඟය යන කරුණු දෙකටම විසඳුම් ලෙස කලු ගඟ ව්‍යාපෘතිය වැදගත් වන බවත්, එහිදී උද්ගත වන ගැටලුකාරී තත්ත්වයන් මගහරවා ගැනීම සඳහා උමං මාර්ග ඔස්සේ ජලය ගෙනයාම සහ කුඩා ජලාශ නිර්මාණය කිරීමත් ඒ සමගම ගඟ ගලායාම සිදුවීම යන කටයුතු සිදුවන පරිදි මෙම කටයුත්ත සිදු කළ හැකි දැයි සලකා බලන ලෙස කාරක සභාව උපදෙස් දුනි.<br>මෙම කරුණ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සලකා බලන බව ද ගොවිතැන් සඳහා යොදාගන්නා ජලය හැකි පමණ පානීය කටයුතු සඳහා ඉතිරි කර ගැනීමට කටයුතු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කරන බව ද ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |
| 5. | 2016 වසරේ ප්‍රාග්ධන වියදම් වලින් වියදම් කර ඇති ප්‍රමාණය සහ එම වසරේ කාර්ය සාධනය. | ප්‍රාග්ධන වියදම් රු. බිලියන 12.5 ක් අයවැයෙන් වෙන් කර ඇති බවත් ඉන් 2016 අගෝස්තු 31 වන විට 39% ක් වියදම් කර ඇති බවත් 66% ක් ඉටුකර ඇති කටයුතු සඳහා ගෙවිය යුතු බවත් නිසි වේලාවට අක් මුදල් ලැබීම ඉතා වැදගත් බවත් එහි ප්‍රමාදයක් පවතින බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. එසේම මුළු ප්‍රාග්ධන වියදමෙන් ප්‍රධාන වාර්මාර්ග සඳහා රු. බිලියන 9ක් වෙන් කර ඇති බව ද ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. කටයුතු කර ඇති 66% ගෙවීමට රු. මිලියන 3800 ක මුදලක් ඉල්ලුම් කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |
| 6. | සුගලාදේවී වැව සහ වැලිඔය යන ව්‍යාපෘතියේ සිදුවී ඇති අක්‍රමිකතා පිළිබඳව පසුගිය කාරක සභාවේ සාකච්ඡා කල අතර ඒ පිළිබඳව ගෙන ඇති විනය ක්‍රියාමාර්ග සහ නීතිමය තත්ත්වය. | මේ පිළිබඳව නීතිමය උපදෙස් 2014 වර්ෂයේදී ලැබුණු බවත් ඒ අනුව අපරාධ නීතිය යටතේ නඩු පැවරීමට පියවර ගන්නා ලෙස නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. මේ පිළිබඳ අවශ්‍ය කටයුතු සිදුකර ඒ පිළිබඳ වාර්තාවක් කාරක සභාවට එවීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි. නියෝග කරන ලදී. |
| 7. | වෙහෙරගල ව්‍යාපෘතියේ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර 10 ක් අක්‍රිය වීම පිළිබඳ ගෙන ඇති පියවර. | මෙම කරුණ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට දන්වා ඇති බව ද මෙම යන්ත්‍ර දිගුකාලීනව භාවිතා කර ඇති බැවින් හා ඒවා විකිණීමෙන් රු. මිලියන 4 ක් ලබාගත හැකි බැවින් රු. මිලියන 3 ක් වූ අලාභය ආවරණය වන නිසා මෙම කරුණ සම්බන්ධයෙන් ආණ්ඩුවට පාඩුවක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | සිදුවී නොමැති බැවින් නීති කටයුතු සිදුකිරීම අනවශ්‍ය බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති බව ද ප්‍ර.ග.නි./ග.නි. සභාවට දැන්වීය. මේ සඳහා නීතිපති උපදෙස් ඉල්ලුම් කළ ලිපිය සහ නීතිපති උපදෙස් අඩංගු ලිපියෙහි පිටපත් හා මෙහි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් සතියක් ඇතුළත එවන ලෙස ප්‍ර.ග.නි./ග.නි. ට නියෝග කළේය. |
| 8. | (අ) විෂය අංක 28201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 18,620,869/= ක් වූ අතර එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතීම.<br>(ආ) 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 ක් ඉක්මවූ රු. 53,464,992/= ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබීම.<br>(ඇ) 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන් පරිදි දෙපාර්තමේන්තුව සතු රජයේ නිවාස 21 ක සිටින අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබීම.<br>(ඈ) 2012 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව දෙපාර්තමේන්තුව සතු රජයේ නිවාස 310 ක පදිංචියට නිලධාරීන් ඉදිරිපත් නොවීම, ඒවා අබලන්ව පැවතීම යන හේතුමත දීර්ඝ කාලයක සිට භාවිතයෙන් තොරව පැවතුණි. | මේ පිළිබඳව වාර්තා ඔක්තෝබර් 22 දිනට පෙර කාරක සභාව විසින් ඉල්ලා සිටින ලදී. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | (ඉ) නිල නිවාස 54 ක් රජයේ වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන වෙත පවරාදී තිබූ බව 2012 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන්ව තිබුණද ඒවා විධිමත්ව පවරාදීමට කටයුතු කර නොතිබීම.<br>(ඊ) රඹකැන් ඔය වාරිමාර්ග ව්‍යාපෘතිය විවෘත කිරීමේ උත්සවයට පිට පළාත් වලින් ජනතාව ප්‍රවාහනය කිරීමට රු. 2,143,527/= ක මුදලක් වැයකර ඇතත් එහි ප්‍රතිඵලය පැහැදිලි නොමැති වීම. | |
| 9. | වාර්මාර්ග දෙපාර්තමේන්තුව සතු වැව් 22හි බෝට්ටු සේවා පවත්වාගෙන යාමට ගත් උත්සාහය ඵල දරා නොතිබුණු බැවින් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළේය. | මෙය දියුණු කිරීමට ඇති හැකියාව සම්බන්ධව වාර්තාවක් හෝ තහනම් කරන්නේ නම් එයට හේතු ඇතුළත් වාර්තාවක් නොවැම්බර් 01 දිනට පෙර කාරක සභාව විසින් ඉල්ලා සිටින ලදී. |
| 10. | 2014 චක්‍රලේඛයට අනුව බඳවාගත් තනතුරට ස්ථිර කළ යුතු නමුත් චක්‍රලේඛයට පටහැනිව සේවයේ යොදවා ඇති තනතුරට ස්ථිර කිරීමට කටයුතු කිරීම. | මේ පිළිබඳ පරීක්ෂණයක් සිදුකරන බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. චක්‍රලේඛයට පටහැනිව ස්ථිර කළ අය හා ඒ සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග සහ මෙම කාර්යය නිම කළ හැකි දිනයන් පිළිබඳ වාර්තාවක් ඔක්තෝබර් 22 දිනට පෙර ඉදිරිපත් කරන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| | **රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව<br>2016 සැප්තැම්බර් 22** | |
| 1. | 2016 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබිම. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇතත් එය විගණකාධිපතිවරයා වෙත යොමු කිරිමට කටයුතු කර නොමැති බැවින් සති 2 ඇතුලත එය ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව ප්‍ර.ග.නි/ ග.නි. කාරක සභාව වෙත දන්වා සිටියේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳව අමාත්‍යාංශයේ වැඩි අවධානයක් යොමු විය යුතු බව සඳහන් කළ කාරක සභාව සකස් කර ඇති ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශ නිර්දේශය සමග එළඹෙන 26 දින විගණකාධිපති වරයා වෙත යොමුකර එහි පිටපතක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස නියෝග කළේය. |
| 2. | දෙපාර්තමේන්තුවේ පවතින තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ගවල ප්‍රගතිය. | නියෝජ්‍ය සහ සහකාර මුද්‍රණාලයාධිපති තනතුරු 12 ක් සඳහා අභ්‍යන්තර සහ බාහිර අයදුම්කරුවන් අතරින් බඳවා ගැනීමට තරඟ විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර ද්විතික මට්ටමේ තනතුරු 107 ක් ආධුනික පදනම මත බඳවා ගෙන වසර 3 ක සාර්ථක පුහුණුවකින් පසුව NVQ 5 සුදුසුකම් සපුරාලීමෙන් පසු ස්ථිර සේවයට අන්තර්ග්‍රහනය කිරීමටත් අතිරේක මුද්‍රණාලයාධිපති තනතුර දරන නිලධාරීන් අතරින් ජ්‍යෙෂ්ඨත්වය සහ සුදුසුකම් මත විශේෂ ශ්‍රේණියට උසස් කර පසුව මුද්‍රණාලයාධිපති තනතුරට පත් කිරීමේ ක්‍රමවේදයට අනුකූලව කටයුතු කිරීමට රාජ්‍ය සේවා කොමිසමේ අවධානයට යොමු කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කළේය.<br>මුද්‍රණාලයාධිපති තනතුරට බඳවා ගැනීමේ දි අභ්‍යන්තර අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය ලබා දීමේ අවශ්‍යතාවය අවධාරණය කළ කාරක සභාව සේවා ව්‍යවස්ථාවට අනුව තනතුරු පිරවීම සඳහා ගන්නා වූ ක්‍රියා මාර්ග පිළිබඳව සකස් කළ වාර්තාවක් ඔක්තෝබර් මස 5 දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි ට නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 3. | 2015 දෙසැම්බර් 31 දක්වා කාලය තුල සේවයෙන් ඉවත් කළ, වැඩ තහනම් කළ සහ වෙනත් හේතුන් මත සේවයෙන් ඉවත් වු නිලධාරීන්ගෙන් ආයතනයට අයවිය යුතු මුදල් අයකර ගැනිම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග වල ප්‍රගතිය | 1984-2009 කාලය තුල සේවයෙන් ඉවත් කළ නිලධාරීන් 5 දෙනෙකුගේ ණය ලියකියවිලි සහ වැඩ තහනමට ලක් වු නිලධාරීන් 31 ක ලිපි ගොනු අස්ථානගත වී ඇති බැවින් ඒවායේ තොරතුරු සොයා බලමින් සිටින බවත් නිලධාරින් 35 ක් සම්බන්ධයෙන් නිතිපති උපදෙස් අපේක්ෂා කරන බවත් වෙනත් හේතුන් මත සේවයෙන් ඉවත් වු 9 කුගේ ලියකියවිලි ආයතනයේ නොමැති බැවින් ක්‍රියාමාර්ග ගැනිමේ දුෂ්කරතාවයක් පවතින බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය.<br>අස්ථානගත වි ඇති ලිපිගොනු සම්බන්ධයෙන් ඊට වගකිවයුතු නිලධාරින්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගැනිමටත්, අමාත්‍යාංශය කමිටුවක් මගින් මුදල් අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව නීතිපති වෙත යොමුකර එම උපදෙස් මත මාස 3 ක් ඇතුලත මෙම ගැටලුවට නිරාකරණය කිරිමට කටයුතු කරන ලෙසත් කාරක සභාව නියෝග කළේය.<br>එම ක්‍රියාවලිය සිදුවන ආකාරය පිළිබඳව කාල වකවානු සහිතව සකස් කළ වාර්තාවක් ඔක්තෝබර් මස 05 දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස දන්වා සිටියේය. |
| 4. | මුළු එකතුව රු. 585,985,184/= ක් වූ මුද්‍රණ හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු නොකිරිම. | මුද්‍රණ දෙපාර්තමේන්තුව රාජ්‍ය ආයතන වලට පමණක් සේවා සපයන ආයතනයක් වන බැවින් සේවාලාභී ආයතන වල පැවති දුර්වලතා, ඇස්තමේන්තු වටිනාකම් වෙනස්වීම සහ තොරතුරු නොමැතිකම හිඟ ආදායම් ඉහළ යාමට හේතු වී ඇති බවත් ඊට විසඳුමක් ලෙස ප්‍රතිපාදන මාරු කිරිම සඳහා මුදල් අමාත්‍යාංශයට 2008 දි යොමු කරන ලද ඉල්ලිමට මේ දක්වා ප්‍රතිචාරයක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ලැබී නොමැති බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය.<br>කෙසේවෙතත් ඉහත මුදලින් රුපියල් මිලියන 173 පමණ යළි අයකර ගැනිමට කටයුතු කර ඇති අතර ඉදිරියේ දි මෙම තත්ත්වය අවම කර ගැනිම සඳහා සේවා සැපයීමට පූර්වයෙන් වටිනාකමින් 50% අත්තිකාරම් මුදලක් අයකිරිම හෝ 75% ක ප්‍රතිපාදන ලබාගැනිම වැනි ක්‍රියාමාර්ග වලට යොමු විමට අවධානය යොමු වි ඇති බව ප්‍ර.ග.නි./ග.නි. වැඩිදුරටක් ප්‍රකාශ කළේය.<br>සේවා ලාභින් සමග ගිවිසුම් ගත විමේ ක්‍රමවේදයක අවශ්‍යතාවය කාරක සභාව අවධාරණය කළේය. |
| 5. | 2011 පසුව භාණ්ඩ සමික්ෂණයක් පවත්වා නොතිබිම සහ ස්ථාවර වත්කම් සහ පරිගනක වත්කම් ලේඛන පිළියෙල කර නොතිබිම. | 1989 න් පසුව ක්‍රමවත් භාණ්ඩ සමීක්ෂණයක් සිදු වි නොමැති බවත් භාණ්ඩ සහ තොග ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම මෙන්ම ආයතනයේ සේවක, යන්ත්‍ර සූත්‍ර සහ වෘත්තීය සමිති ආදි සියළු අංශවල ගැටලු රාශියක් පවතින බැවින් ක්‍රමවත් අධ්‍යයනයක් සිදුකර ඒවා නිවැරදි කර ගැනිම සඳහා සාධාරණ කාල පරාසයක් ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ ග.නි. කාරක සභාවෙන් ඉල්ලා සිටියේය.<br>ඒ අනුව විගණන විමසුමෙන් පෙන්වා දි ඇති ආයතනික දුර්වලතාවයන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ කාරක සභාව පහත වාර්තා ඉදිරිපත් කරන ලෙස නියෝග කළේය.<br>- විගණකාධිපති දෙපාර්තමේන්තු නිලධාරීන් යොදවා ආයතනයේ ගිණුම්, පරිපාලන සහ අනෙකුත් අංශවල පවතින ගැටලු හඳුනාගෙන සකස් කළ වාර්තාවක් නොවැම්බර් 15 පෙර. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | - දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් සකස් කළ වාර්තාවක් ඔක්තෝබර් 20 දිනට පෙර<br>- විගණකාධිපතිවරයා විසින් අද දින ඉදිරිපත් කළ විගණන විමසුම මගින් ඉදිරිපත් කර ඇති කරුණුවල වර්තමාන ප්‍රගතිය පිළිබඳව සකස් කළ වාර්තාවක් |
| **සබරගමුව පළාත් සභාව<br>2016 ඔක්තෝබර් 04** | | |
| 1. | 2010 සිට 2014 දක්වා කර්මාන්ත සංවර්ධන අධිකාරිය සහ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යන ආයතන දෙක සම්බන්ධයෙන් විගණන මතය ව්‍යාචනය කිරීම. | මේ සම්බන්ධයෙන් විස්තරාත්මක වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ ග.නි වෙත සහ විගණකාධිපතිවරයා වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදී. |
| 2. | 2015.12.31 වන දින වන විට බැංකු ස්ථාවර තැන්පතු වශයෙන් රු. මිලියන 3787ක ආයෝජනයක් සබරගමුව පළාත් සභාව සතු වීම. | 2016 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් නොකළ අංශ සඳහා එම මුදල් යොදා ගත් බවත්, රජයේ අනෙකුත් ආයතන වර්ෂ අවසානයේ ගිණුම් වසා ඉතිරි මුදල භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළද, පළාත් සභාව විසින් එවැන්නක් සිදු නොකිරීම හේතුවෙන් ඉතිරි මුදල තැන්පතු වශයෙන් පෙන්නුම් කරන බව ද ප්‍ර.ග.නි./ ග.නි. විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයට ප්‍රතිපත්තිමය තීන්දුවක් හා පළාත් අමාත්‍ය සම්මේලනයේදී තීන්දුවක් ගැනීම යෝග්‍ය බව කාරක සභාව නිර්දේශ කරන ලදී. |
| 3. | 1973 සිට 2008 දක්වා නිකුත්කළ අධිභාර සහතික 15ක් වෙනුවෙන් රු. | ඉදිරියේදී ඇතිවිය හැකි අධිභාර සම්බන්ධයෙන් නිසි පසු විපරම් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | 1,999,034/= ක් අයවිය යුතුව පැවතීම. | කටයුතු සිදුවිය යුතු බව කාරක සභාව අවධාරණය කරන ලදී. |
| 4. | මාවනැල්ල ප්‍රදේශයේ විද්‍යාලයක 2015 වර්ෂය සඳහා සිසුන් ඇතුලත් කිරීමේදී සිසුන් 350 දෙනෙකුගෙන් රු. 1,525,000/= ක් අයකරගෙන ඇති බවත්, ඒ සඳහා ලදුපත් නිකුත් කර නොමැති බවත් අනාවරණය වීම. | දැනට විදුහල්පතිවරු විසින් මුදල් එකතු කිරීමේ කටයුතු නොකරන බවත්, පාසල් සංවර්ධන කමිටුව මඟින් අදාළ මුදල් ලබාගෙන ඇති බවත්, අදාළ විදුහල්පතිවරයා ස්ථානමාරු ලබා වෙනත් විදුහල්පතිවරයෙකු එම විද්‍යාලයට අනුයුක්ත කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වෙන බවත්, ප්‍ර.ග.නි/ ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 5. | 2001 මාර්තු 28 දිනැති අංක මුදල් 1/2001 දරන පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශ චක්‍රලේඛයේ විධිවිධාන පරිදි පළාත් සභා මන්ත්‍රීවරුන්ට ලබාදිය හැකි උපරිම ණය සීමාව රු. 250,000/= ක් වුවත් එම සීමාව ඉක්මවා, රු. 500,000/= බැගින් ණය ලබා දී තිබුණි. තවද, 2014 දෙසැම්බර් 31 දිනට එසේ ලබාදුන් ණය මුදලින් මන්ත්‍රීධුර අහෝසි වූ 12 දෙනෙකුගෙන් රු. 1,418, 600/= ක් අයවීමට තිබීම. | පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මේ සඳහා ලැබී ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. එම සීමාව වෙනස් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය මඟින් ඉල්ලුම් කර අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 6. | මුදල් කොමිෂන් සභා ලේකම්ගේ ලිපිය මඟින් පසුගාමී හා හුදෙකලා ගම්මාන පදනම් කර ගත් සංවර්ධන ව්‍යාපෘති සඳහා ඍජු ප්‍රතිපාදන ලබා නොදිය යුතු බව දන්වා තිබියදී රු. 1,403,603/= ක ඍජු ප්‍රතිපාදන ලෙස වැය කර තිබීම. | පන්සලක වහලය සෙවිලි කිරීම සඳහා සෙවිලි තහඩු වශයෙන් ලබා දී ඇති බවත්, හුදෙකලා ගම්මාන සංවර්ධනය යටතේ දුෂ්කරම පන්සල් 04 ට පුටු ලබා දීමක් වාර්තා වන බවත්, දැනට මෙවැනි දීමනා නොකරන බවත්, ප්‍ර.ග.නි/ ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 7. | රු. 60,372,500/= ක් වැය කර පරිගණක 589 ක් මිලදී ගැනීම | ජනාධිපති විමර්ශණ කොමිසම ඉතාමත් විධිමත් ලෙස මෙම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | සම්බන්ධයෙන් තාක්ෂණික පිරිවිතර සැකසීම, ඇගයීම වංචනික ලෙස සිදු කර සැපයුම් කරු වෙත රු. 7,961,513/= ක් වැඩිපුර ගෙවා තිබීම සම්බන්ධව මූලික විමර්ශනය පරිදි බරපතල නිර්දේශ පැවති නමුත්,මේ සම්බන්ධයෙන් පළාත් සභාව වශයෙන් කිසිදු පියවරක් ගෙන නොමැති වීම. | පරීක්ෂණය සිදුකරගෙන යන බවත්, එම පරීක්ෂණ වාර්තාව ලැබීමෙන් අනතුරුව චෝදනා කෙටුම්පත් කර යැවීමට බලාපොරොත්තු වන බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. බාහිර ආයතන මගින් සිදුකෙරෙන පරීක්ෂණ වලට අමතරව අභ්‍යන්තර පරීක්ෂණ ද නිසි පරිදි සිදු විය යුතු බව කාරක සභාව අවධාරණය කරන ලදී. |
| 8. | ආණ්ඩුකාර කාර්යාලය මඟින් 2014 වර්ෂය තුළ රු. 18,549, 089/- ක භාණ්ඩ මිලදීගෙන ඒවා තිළිණ ලෙස විවිධ පාර්ශ්වයන් වෙත බෙදාහැර තිබුණු අතර, භාණ්ඩ ලැබීම හෝ බෙදාහැරීම සම්බන්ධයෙන් කිසිදු විස්තරයක් විගණනය සඳහා ඉදිරිපත් නොවීම. | මේ සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු වූ අතර මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි. ට නියෝග කළේය. |
| 9. | (අ) සබරගමුවේ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සුභසාධක කටයුතු වෙනුවෙන් ආරම්භ කර තිබූ අරමුදල්වලට ව්‍යවස්ථාවක් හා නීති මාලාවක් සකස් කර නොතිබීම සහ සේවක සුභසාධනය වෙනුවෙන් කිසිදු මුදලක් වෙන් කර නොතිබීම.<br>(ආ) 2013 හා 2014 වර්ෂ දෙක සඳහා පිළිවෙලින් රු. 6,721, 443/= ක්, හා රු. 6,559,719/= ක් අධිකාරී අරමුණුවලට බැහැර කටයුතු සඳහා යොදවා තිබීම. | අරමුදල සම්බන්ධයෙන් ව්‍යවස්ථාව සකස් වෙමින් පවතින බව ප්‍ර.ග.නි/ ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. මෙම ආයතනයේ කටයුතු විමධ්‍යගත කිරීමෙන් පසු අවසාන ගිණුම් සකස් කර නොමැති අතර එම අවසාන ගිණුම් සකස් කෙරෙමින් පවතින බවත් තීරක ගිණුමෙන් ලැබෙන මුදල් සම්බන්ධයෙන් තොරතුරු ලබාගෙන අදාළ පුද්ගලයන්ට නැවත ලබා දීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කර සිටින ලදී. |
| 10. | පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ යෝජනාවක් පරිදි අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන්ට ලබා දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක් මඟින් රු. 1,176,457/= ක අභ්‍යාස පොත් 54,719 ක් 2014 අග භාගයේ දී | මෙය මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක වූ වැඩසටහනක් වන බවත්, පිටකවරය වෙනස් කර දෙන ලෙස රජයේ මුද්‍රණාලයට දැනුම් දුන් නමුත් දැන් ඔවුන් ඒ සඳහා ඉදිරිපත් නොවන බවත්, මුදල් ගෙවීම් නතර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | මිලදීගෙන තිබුණු බවත්, මෙම අභ්‍යාස පොත් මුද්‍රණයේදී අදාළ දේශපාලන අධිකාරියේ ඡායාරූපය පිටකවරයේ තිබීම හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම පොත් බෙදාහැරීම ප්‍රතික්ෂේප කර පළාත් සභා ලේකම් වෙත 2015 අප්‍රේල් මස භාරදී තිබුණි. සියළුම පොත් 2016 සැප්තැම්බර් වන විටත් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ගබඩාවේ තැන්පත් කර තිබීම. | කර ඇති බවත්, පොත අභ්‍යන්තරයේ පවතින ගුණාත්මකභාවය ඉතා හොඳ මට්මටමක පවතින බැවින් පළාත් සභාවේ මුදල් යොදවා පිටකවරය වෙනස් කරන බවත්, ප්‍ර.ග.නි./ග.නි. විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 11. | සබරගමුව පළාත් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අරමුදල්වල බැංකු ශේෂයන්ගේ එකතුව රු. 14,451,053/= ක් ද ස්ථාවර තැන්පතු 36 ක එකතුව රු. 145, 588, 314/= ක් පැවතීම. | අදාළ මුදල් සමූපකාර ලාභයෙන් කොටසක් වන අතර එම මුදල් නැවත සමූපකාර ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සඳහා යොදවන බවත්, ඒ සම්බන්ධයෙන් රීති කෙටුම්පත් කිරීමට කටයුතු කරමින් සිටින බවත්, එය සභාවට ඉදිරිපත් කර අනුමත කර ගත යුතු බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 12. | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය අලුත්වැඩියාව සඳහා ලබා දුන් වාහන 11 ක් මාස 4 සිට අවුරුදු 3ක පමණ කාලපරිච්ඡේදයක් නිෂ්කාර්යව රඳවාගෙන තිබීම. | අමතර කොටස් මිළදී ගැනීමේ ප්‍රමාදයත් අලුත්වැඩියා කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්මිකයින් නොසිටීමත් මෙම ප්‍රමාදයට හේතු වී ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කරන ලදී. අදාළ වාහන භාණ්ඩ සමීක්ෂණයක් මගින් බැහැර කරන ලෙස ප්‍ර.ග.නි/ ග.නි ට නියෝග කළේය. |
| | **හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>2016 ඔක්තෝබර් 05** | |
| 1. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විගණන කටයුතු මෙම වසරේ අභ්‍යන්තර විගණන වැඩසටහනට ඇතුලත් කර නොතිබීම හා 2016 සැප්තැම්බර් 19 දින වන විට ප්‍රාදේශීය ලේකම් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විගණන කටයුතු 2016 අභ්‍යන්තර විගණන වැඩසටහනට ඇතුලත් කර ඇති බවත් දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක විගණන කටයුතු අවසන් කර ඇති |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | කාර්යාල 07 ක 2016 විගණන කටයුතු සිදු කර නොතිබීම. | අතර ඉතිරි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක කටයුතු ඉදිරි කාලය තුළ නිම කරන බවත් ග.නි. පැවසීය. |
| 2. | 2009 වසරේ සිදුවූ මූල්‍යාමය වංචාවකට වරදකරු වූ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකුගේ විශ්‍රාම පාරිතෝෂිතයෙන් රු. මිලියන 1.7 ක් වූ අලාභය මෙතෙක් අය කරගෙන නොතිබීම. | අදාල නිලධාරියාගේ විශ්‍රාම වැටුප සකස් කිරීමට අදාල ගොනුව තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සකස් කර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇති බවත්, සිහිකැඳවීම් සිදුකලත් මෙතෙක් එය සකස් කර නොමැති බවත්, විශ්‍රාම වැටුප සකස් කිරීමෙන් පසු අදාල අලාභය අය කර ගැනීමට කටයුතු කරන බවත් ග.නි. පැවසීය. කාරක සභාව ප්‍ර.ග.නි / ග.නි වෙත පහත නියෝග පැනවීය.<br>i. අදාල නිලධාරියාට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පවත්වන අධිකරණ නඩු විභාගයක් ද පවතින හෙයින් එහි තීන්දුව ආයතන පරීක්ෂණයේ තීන්දුවට බලපෑ හැකි ආකාරය පිළිබඳ නීතිමය තත්වය නීතිපතිවරයාගෙන් විමසා සභාවට වාර්තා කරන ලෙස<br>ii. මෙම මුදල අයකර ගැනීම පිළිබඳ වාර්තාවක් කාරක සභාවට එවන ලෙස |
| 3. | 2011 වර්ෂයේදී බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාතර - කතරගම දුම්රිය මාර්ගයේ හිමිකම් නොපෑ ඉඩම් සඳහා වන්දි ගෙවීම වෙනුවෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුව නමින් රු. 2,432,488/=ක් වටිනා චෙක්පත් 16 ක් ලියා අත රඳවා ගෙන තිබුණු අතර මෙම හිමිකම් නොපෑ ඉඩම් වන්දිවලට අදාළ | සාමාන්‍ය ක්‍රියාපටිපාටිය අනුව උසාවියට මුදල් බැඳීමෙන් අනතුරුව අදාල ඉඩම් සඳහා උසාවිය විසින් තැන්පත් සහතික නිකුත් කළ පසු චෙක්පත් ලිවීම සිදු කරන බවත්, මෙහිදී උසාවි නියෝගය ලද වහාම චෙක්පත් ලිවීම සිදු කර ඇති බවත් උසාවියෙන් තැන්පතු සහතික නිකුත් කිරීම ප්‍රමාද වූ හෙයින් ඒ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | තැන්පත් සහතික උසාවියෙන් ලබා ගැනීමට කටයුතු කර නොතිබීම. | වනතෙක් චෙක්පත් ලියා අත රඳවා ගෙන තිබුණු අතර තැන්පතු සහතික නිකුත් කළ වහාම චෙක්පත් බැංකුගත කර ඇති බව ග.නි. පැවසීය. |
| 4. | 2011 වර්ෂයේදී ජාතික සවිය ගමනැගුම වැඩසටහන යටතේ වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව සෞඛ්‍ය මධ්‍යස්ථානයක් නවීකරණය කිරීමට අදාළ රු.3,296,503/-ක් වූ මුල් ඇස්තමේන්තුව කොන්ත්‍රාත් වැඩ දෙකක් ලෙස ඇස්තමේන්තු සකස් කර සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ අනුමත සමිති දෙකක් වෙත එකම දිනකදී කොන්ත්‍රාත් පිරිනමා තිබීම. | මෙහිදී එකම කොන්ත්‍රාත්තුව කොටස් දෙකකට බෙදා සමිති දෙකක් වෙත පවරා ඇති බවත්, මේ වන විට එය නිම කර ඇති බවත් ග.නි. පැවසීය. |
| 5. | 2012 වර්ෂයේදී අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කිරිමැටිය උස්සාන ජල යෝජනා ක්‍රමය සඳහා එකක් රු. 2,600/- ක වෙළඳ පොළ වටිනාකමක් සහිත අඟල් 3 Type 600 pvc බට රු.4,500/- ක් බැගින් ඇස්තමේන්තු කර මිලදී ගැනීම නිසා රු. 116,533/- ක වැඩිපුර ගෙවීමක් සිදුවී තිබීම. | අදාළ ඇස්තමේන්තුව පිළිබඳ විශ්ලේෂණය කොට, ඇස්තමේන්තුගත කිරීම් රජයේ නියමිත අනුපාතිකයන්ට දක්වන අනුකූල බව සම්බන්ධව වාර්තාවක් ඔක්තෝබර් 27 දින පැවැත්වීමට නියමිත කමිටුවට ඉදිරිපත් කරන ලෙසත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ඉදිරියට කැඳවීමේදී අදාළ ඉංජිනේරුවන්ද කැඳවන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි. වෙත දැන්වීය. |
| 6. | 2012 වර්ෂයේදී තංගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් අළුත්ගොඩ සියඹලාගස් වැවෙන් ජලය බස්නා ඇලෙහි කණ්ඩිය ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ | මේ පිළිබඳ පරීක්ෂණයක් 2014 වසරේ සිදු කළ අතර එහි වාර්තාවට අනුව බොරළු ඝන මීටර් 1611 ක් අතුරා ඇති බවත් එම නිසා වැඩිපුර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | බිල්පත් අනුව බොරළු ඝන මීටර් 759.35 ක් ඇතිරීම සඳහා රු.691,768/= ක් ගෙවා තිබුණු නමුත් ඉටුකළ වැඩවල ප්‍රමාණය ඝන මීටර් 173.65 ක් වූයෙන් රු.533,573/= ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබීම. | ගෙවීමක් සිදුවී නොමැති බවත් ග.නි. පැවසීය. විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදුකළ පරීක්ෂණය 2012 වසරේ සිදු වීමත්, ඊට වසර දෙකකට පසු සිදු කළ පරීක්ෂණයෙන් මෙහි සත්‍ය අසත්‍ය තත්වය විමසිය නොහැකි බවත් පැවසූ කාරක සභාව ඉංජිනේරුවන් ලවා නැවත පරීක්ෂණයක් සිදු කොට වාර්තාවක් ඔක්තෝබර් 27 දින පැවැත්වීමට නියමිත කමිටුවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි.ට දැන්වීය. |
| 7. | විගණනයට ඉදිරිපත් කර තිබූ සැසඳුම් ප්‍රකාශය අනුව 2015 දෙසැම්බර් 31 දිනට නිලධාරින් 20 දෙනෙකුට අදාළ රු. 2,556,027/= ක් වූ හිඟ ණය ශේෂ පැවති අතර, 2015 දෙසැම්බර් 31 දින වනවිට වසර 1 සිට 20 දක්වා කාල පරාසයක් ගත වී තිබුණ නමුත්, එම හිඟ ණය ශේෂ අයකර ගැනීමෙන් පසුව රු. 1,579,751/= ක ණය ශේෂ තවදුරටත් අයකර ගැනීමට තිබීම. | මධ්‍යම රජය යටතේ ස්ථාන මාරු වී ගිය සේවකයන්ගෙන් හිඟ ණය ශේෂ අයකර ගෙන ඇති අතර පළාත් සභාවේ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් පළාත් සභාව යටතේ ස්ථාන මාරු වී ගිය සේවකයන්ගෙන් වාරික වශයෙන් මුදල් අය වන බවත්, සේවය හැරගිය සේවකයන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන ඇති බවත් ග.නි. පැවසීය. |
| 8. | සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහජන නියෝජිතයින්ගේ සංවර්ධන වැඩසටහන් යටතේ 2014 දෙසැම්බර් 30 දින රු. 462,000/= ක වියදමින් මිලදී ගෙන තිබුණු විදුලි මෝටරය සහිත සිංගර් සාමාන්‍ය රෙදි මහන යන්ත්‍ර 20ක් 2016 ජුනි මාසය වන විටත් ප්‍රතිලාභීන් වෙත බෙදාහැර නොතිබීම. | මෙම රෙදි මහන යන්ත්‍ර මිලදී ගෙන ඇත්තේ මන්ත්‍රීතුමියකගේ ප්‍රතිපාදන යටතේ බවත්, එතුමිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිලාභී නාමලේඛනයේ පැවති ගැටළු නිසා එය බෙදා හැරීම ප්‍රමාද වූ බවත්, පසුව විමසීම් සිදු කළද ඇය විසින් ප්‍රතිලාභී නාමලේඛනය ඉදිරිපත් නොකළ බැවින් සූරිය වැව ප්‍රාදේශීය ලේකම්තුමා විසින් හඳුනාගත් සුදුසු පිරිසකට මෙම යන්ත්‍ර ලබාදීම සඳහා අවසර ඉල්ලා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ඇති බවත්, මේ පිළිබඳ නිශ්චිත තීරණයක් ගත නොහැකි නිසා දිස්ත්‍රික් ලේකම්තුමා ඊට අවසර ලබා දී නොමැති බවත් ග.නි විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.<br>ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරුන්ගෙන් විමසා තීන්දුවක් ගෙන මෙම යන්ත්‍ර බෙදා දීම පිළිබඳ අවධානය යොමු කරන ලෙස කාරක සභාව ප්‍ර.ගනි/ ග.නි වෙත නියෝග කරන ලදී. |
| 9. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් ලියාපදිංචි කර තිබුණු ඉඩම් දීමනා පත්‍ර 610 ක් හා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි නොකළ ඉඩම් දීමනා පත්‍ර 337ක් ඒවායේ හිමිකරුවන් වෙත බෙදා දීමට කටයුතු නොකර වර්ෂ 01 සිට වර්ෂ 32 දක්වා කාලපරාසයක රඳවාගෙන තිබීම. | මෙම ඉඩම් ඔප්පු බෙදා දීමේදී යම් යම් ගැටළු උද්ගත වීම මත ඒවා බෙදා දීම ප්‍රමාද වූ බවත්, අතිගරු ජනාධිපතිතුමා විසින් ඉඩම් ඔප්පු 10,000ක් බෙදා දීමට කටයුතු කරන බවත්, එතුමාගේ නියෝගය ලද වහාම ඒ සමඟ මේ ඔප්පුද බෙදා දීමට කටයුතු කරන බවත් ග.නි. පැවසීය.<br>කාරක සභාවේ නියමයෙන් ඊළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මෙය සාකච්ඡාවට ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, කාරක සභාවට වාර්තා කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ගනි/ ග.නි වෙත නියෝග කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 2016 ඔක්තෝබර් 06** | |
| 1. | 2016 වර්ෂය තුළ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට කැඳවනු ලැබූවේ සිව්වැනි වතාවට බව අවධාරණය කළ කාරක සභාව එසේ තිබියදීත් මෙම දෙපාර්තමේන්තුවේ වත්මන් කාර්ය සාධනය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි තත්වයක පවතින හෙයින්, මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු ධනාත්මක වර්ධනයක් නොපෙන්වන්නේ නම්, ඒ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා වෙත සහ ගරු අගමැතිතුමා වෙත මෙන්ම පාර්ලිමේන්තුවටත් වාර්තා කිරීම සඳහා අවශ්‍ය පියවර, කාරක සභාව විසින් ගනු ලබන බව දන්වා සිටින ලදි. | |
| 2 | 2016 ජනවාරි මස 09 වන දින සිට මේ දක්වා වරින් වර කැඳවනු ලැබූ කාරක සභා රැස්වීම්වලදී ලබා දෙන ලද නිර්දේශ ප්‍රකාරව E - මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාවේ යෙදවීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග හා එහි වත්මන් තත්වය | E - මෝටරින් ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා දින වකවානු සහිත සැලැස්මක් ක්‍රියාවේ යොදවන බවත්, ඒ අනුව 2017 වසරේ මාර්තු මස තුළ ඒ සඳහා අදාල ටෙන්ඩර් ප්‍රදානය සිදු කරන බවත්, දැනට දෙපාර්තමේන්තුව විසින් භාවිත කරනු ලබන පරිගනක වැඩ සටහන යෝජිත නව E - මෝටරින් ව්‍යාපෘතිය සමඟ සම්න්ධ කළ හැකි වන පරිදි අවශ්‍ය පහසුකම් (Data Base Migration) සලසා ඇති බවත් අදාළ වන වෙනත් ආයතන සමඟ ද සම්බන්ධ විය හැකි වන පරිදි අවකාශය වෙන් කර ඇති බවත් ප්‍ර.ග.නි. / ග.නි. පැවසීය. මෙම ව්‍යාපෘතියේ ඉදිරි පියවරයන් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ දින වකවානු සහිත වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස ප්‍ර.ග.නි./ ග.නි. වෙත නියෝග කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 3. | වාහන ලිපිගොනු අස්ථානගත වීම පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද කමිටුවේ ප්‍රධානියා ලෙස අදාළ වකවානුවේ එම ප්‍රශ්නගත කාර්යයන් වල නිරත වූ නිලධාරියෙකු පත් කොට තිබීම සහ 2015 වර්ෂයේ අග භාගය වන විට ද ලිපි ගොනු අස්ථානගතවීම් නිරීක්ෂණය වීම. | විමර්ශන කමිටුව මගින් සකස් කළ වාර්තාව තමා වෙත ලැබී ඇති බවත්, එම වාර්තාව පිළිබඳ තමාට ද සෑහීමකට පත්විය නොහැකි බවත් සඳහන් කළ ප්‍ර.ග.නි. වෙනත් නිලධාරියෙකු මගින් එම කටයුතු නැවත විමර්ශනය කරන බව සඳහන් කළේය.<br>එම විමර්ශනය පිළිබඳ වාර්තාවක් සහ වර්තමානයේ ලිපි ගොනු වල පරිපාලන කටයුතු සිදුකරන හා ලිපිගොනු භාරව කටයුතු කරන නිලධාරීන්ගේ නාමලේඛනයක් කාරක සභාව වෙත එවන ලෙස ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදි. |
| 4. | 2015 ජුලි මස 22 වන දින ව්‍යාජ ලෙස ලියාපදිංචි කරන ලද අංක CAI – 0469 දරණ වාහනය පිළිබඳ පහත සඳහන් තොරතුරු කාරක සභාව විසින් අනාවරණය කරන ලදි.<br>- හුන්ඩායි වර්ගයට අයත් වාහනය ලියාපදිංචියේදී ලෑන්ඩ් රෝවර් වර්ගයේ වාහනයක්ලෙස සටහන් කර තිබීම.<br>- 2001 නිෂ්පාදිත වර්ෂය වන අදාළ වාහනයේ නිෂ්පාදිත වර්ෂය 2011 ලෙස සටහන් කර තිබීම.<br>- වාහනයේ නිෂ්පාදිත රට ජපානය ලෙස සාවද්‍යව සටහන් කර තිබීම.<br>උක්ත කරුණු පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන ලද ක්‍රියා මාර්ග. | මෙම සිදුවීම පිළිබඳව මූලික විමර්ශනයක් සිදු කළ බවත් ඒ අනුව අදාළ වාහනයේ ලියාපදිංචිය අහෝසි කිරීමට කටයුතු කර ඇති බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ද පරීක්ෂණයක් සිදු කරන බවත්, ග.නි. පැවසීය.<br>මෙම සිදුවීම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන ලද ක්‍රියා මාර්ග සහ සිදු කොට ඇති මූලික විමර්ශනය පිළිබඳව සිය නොසතුට පළ කළ කාරක සභාව, පහත සඳහන් තොරතුරු සහ වාර්තා 2016 නොවැම්බර් මස 06 දිනට පෙර ලබා දෙන ලෙස ප්‍ර.ග.නි./ ග.නි. වෙත නියෝග කරන ලදි.<br>- 2005 වසරේ සිට මේ දක්වා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ රාජකාරි කරමින් සිදුකළ විවිධ වංචනික ක්‍රියා හේතුවෙන් දඬුවම් ලබා ඇති නිලධාරීන් /සේවකයින් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක්<br>- තනතුරු නාමය, රාජකාරි ස්වභාවය හා රාජකාරි ස්ථානය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | සඳහන් කරමින් පසුගිය වසර 15 ක කාලය පැවති දෙපාර්තමේන්තුගත තනතුරු පිළිබඳ වාර්තාවක්<br>- දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන වසර පහකට වඩා වැඩි සේවා කාලයක් සහිත ඒකාබද්ධ සේවයේ නිලධාරීන් පිළිබඳ ලේඛනයක්<br>- දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර මාරුවීම් ප්‍රතිපත්තිය සහ එම මාරුවීම් සිදු කළ අයුරු දැක්වෙන වාර්තාවක්<br>- ව්‍යාජ ලෙස ලියාපදිංචි කරන ලද අංක CAI – 0469 දරණ වාහනය පිළිබඳ පැවැත්වූ මූලික අභ්‍යන්තර විමර්ශන වාර්තාව<br>- ව්‍යාජ ලෙස ලියාපදිංචි කරන ලද අංක CAI – 0469 දරණ වාහනය පිළිබඳ රේඛීය අමාත්‍යාංශය මගින් ද පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව එයට අදාළ වාර්තාව<br>- දෛනිකව ලියාපදිංචි කරනු ලබන වාහන පිළිබඳ වාහන පන්තිය අනුව සකසන ලද වාර්තාවක්<br>- දෛනිකව ලියාපදිංචි කරනු ලබන බදු සහිත වටිනාකම රුපියල් මිලියන හත ඉක්මවන වාහන පිළිබඳ ලේඛනයක්<br>- පසුගිය වසර පහක කාලය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ, වාහන පන්තිය හා වාහන වර්ගය අනුව සැකසූ ලේඛනයක් , ඒවා ආනයනය කරනු ලැබූ සමාගම් වල තොරතුරු ද සහිතව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | මෙම විස්තර ලබා ගැනීමට අමතරව ව්‍යාජ ලෙස ලියාපදිංචි කරන ලද අංක CAI – 0469 දරණ වාහනය පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදුකොට ඇති පරීක්ෂණයේ ප්‍රගතිය පිළිබඳව වාර්තාවක් එම දෙපාර්තමේන්තුවෙන් කැඳවිය යුතු බවට ද තීරණය කරන ලදි. |
| 5. | ආනයනික විස්තර ඇතුලත් රේගු සටහන්කර වල දැක්වෙන ප්‍රමාණයන් වලට වඩා අති විශාල ප්‍රමාණයක් යතුරු පැදි ලියාපදිංචි කර තිබීම. | රේගු දෙපාර්තමේන්තුවේ තොරතුරු පරිගනක වැඩ සටහන ආධාරයෙන් තහවුරු කර ගැනීමේ ක්‍රමවේදය 2014.01.01 දින සිට ක්‍රියාත්මක කළ බවත්, එදින සිට යතුරු පැදි ලියාපදිංචි කිරීමේදී මෙවැනි ගැටලු ඇතිවී නොමැති බවත්, එම ක්‍රමවේදයට අනුගත වීමට පෙර රේගු සටහන්කර හා ලියාපදිංචි සංඛ්‍යාව අතර පරස්පරතා තිබී ඇති බවත් ග.නි. පැවසිය. |
| 6. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පවතින වත්මන් දූර්වලතා සහ අකාර්යක්ෂමතාවයන් මඟ හරවා ගැනීම සඳහා ගනු ලබන ක්ෂණික ක්‍රියාමාර්ග | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දෙනු ලබන නිර්දේශ සහ උපදෙස් අනුව කටයුතු කරන බවත්, සාධනීය ක්‍රමවේද වලට අනුගත වීම තුලින් දෙපාර්තමේන්තුවේ කාර්යාවලිය විධිමත් හා නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලබන බවත් ග.නි. පැවසීය.<br>මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳව තවදුරටත් කාරක සභාවේ දැඩි අධීක්ෂණයට ලක් කරන බවද, ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග තීරණය කරනු ලබන බවද කාරක සභාව විසින් අවධාරණය කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **වත්තල ප්‍රාදේශීය සභාව<br>2016 ඔක්තෝබර් 25** | | |
| 1. | සභා දේපල යටතේ ප්‍රාදේශීය සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි ප්‍රමාණාත්මකව අයවැය ලේඛනයට ඇතුලත් කර නොතිබීම හා එම ඉඩම් විධිමත් ලෙස ලේඛනගත කර නොතිබීම. | මින් ඉදිරියට බස්නාහිර පළාත තුළ ඉඩම් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යාමට උපදෙස් දී ඇති බව ප්‍ර.ග.නි. සඳහන් කළ අතර ඊට අමතරව මේ දක්වා පළාත තුළ වන ඉඩම් පිළිබඳව ලේඛනයක්ද වහාම සකසන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 2. | විගණන හා කළමණාකරණ කමිටු පැවැත්වීම. | අදාල චක්‍රලේඛයන්හි නියෝග උල්ලංඝනය නොවන පරිදි විගණන කමිටු පැවැත්වීම පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් සකස් කොට ඒ පිළිබඳ කාරක සභාවට වාර්තා කරන ලෙස ග.නි. හට නියෝග කළ අතර පළාත් පාලන අමාත්‍යාංශය මඟින් සමස්ත දිවයිනේම පළාත් පාලන ආයතන ආවරණය වන පරිදි විගණන කමිටු පැවැත්වීම පිළිබඳ එක් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කරන ලෙස ප්‍ර.ග.නි. හට නියෝග කරන ලදී. |
| 3. | පළාත් පාලන ආයතනවල පරිගණක වැඩසටහන් භාවිතය | වරිපනම් හා වෙළඳ බලපත්‍ර පරිගණක ගත කර ඇති බවත් 2015 වසරේ සිට මෙය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන බවත් ඊට පිළිතුරු ලෙස ග.නි. සඳහන් කළ අතර වර්තමානය වන විට පළාත් පාලන ආයතන බහුතරයක පරිගණක මෘදුකාංග භාවිතයෙන් ආදායම් අය කර ගැනීම සිදුවන බවත්, පරිඝණක මෘදුකාංග භාවිතය පිළිගත් ගණකාධිකරණ ක්‍රමවේදයන්ටද අනුගත වීම ආරම්භ කර ඇති බවත් ප්‍ර.ග.නි. පැවසීය.<br>මෙහිදී කාරක සභාව පළාත් පාලන ආයතන සියල්ල ඒකාබද්ධ කර එක් පරිගණක මෘදුකාංගයක් භාවිතා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කිරීමේ වැදගත්කම අවධාරණය කළ අතර එමඟින් මහජනතාවට වරිපනම් ගෙවීමේ පහසුව ඇති වන බවත්, ක්‍රමානුකූලව හිඟ ආදායම් අය කර ගැනීමේ හැකියාව ඇති වන බවත් එබැවින් ඒකාබද්ධ පරිගණක වැඩසටහන් ක්‍රියාවට නැංවීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදී. |
| 4. | සභාව අනුමත දැන්වීම් පුවරු ආදායම හා දුරකථන කුළුණු ආදායම | 2016.09.30 වන විට මුළු සභා බල ප්‍රදේශයම දැන්වීම් පුවරු 35කින් පමණක් ආදායම් ලැබීම පිළිබඳ සෑහීමකට පත් විය නොහැකි බව පැවසූ කාරක සභාව දැන්වීම් පුවරු මඟින් ආදායම් ඉපැයීම කෙරෙහි ප්‍රාදේශීය සභාව වඩා වැඩි අවධානයක් යොමු කළ යුතු බව අවධාරණය කරන ලදී.<br>දුරකථන කුළුණු මඟින් ආදායම් වැඩි කරගත හැකි ක්‍රම සොයා බලන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 5. | කසල බැහැර කිරීම සඳහා 2015 වර්ෂයේදී රු. 43,120,454/= ක් වැයවීම සහ එම මුදල පසුගිය වර්ෂවලදී කසල බැහැර කිරීම සඳහා වැය වූ මුදලට සාපේක්ෂව අති විශාල ප්‍රමාණයකින් වැඩිවීම. | සේවක නඩත්තු වියදම්, ඉන්ධන හා යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් ද මීට ඇතුළත් වීම මෙවැනි මුදලක් වැයවීමට හේතුව වූ බව ග.නි. සඳහන් කළ අතර එම පිළිතුර පිළිබඳ සෑහීමකට පත් නොවූ කාරක සභාව එක් එක් වර්ෂයන්හි කසල බැහැර කිරීම සඳහා වන වියදම්වල පරස්පරතාවයන්ට හේතු සඳහන් කරමින් වාර්තාවක් සපයන මෙන් ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 6. | හැඳල උත්සව ශාලාවේ බදුකුලී වෙනුවෙන් 2009 මැයි මාසයේදී ලැබී ඇති රු. 974,800/= ක් වටිනා අගරු | මෙයට අදාල ගිවිසුම සභාපති අත්සන් කර නැති අතර, සභාවේ එකඟතාව අනුව මෙම ගනුදෙනුව සිදුවූ බවත් |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | චෙක්පත සම්බන්ධයෙන් 2015 දෙසැම්බර් මස 31 දින වන විටත් නීතිමය පියවර ගෙන නොතිබීම. | මුළු මුදලින් කොටසක් අදාල බදුකරුගේ තැන්පතු මුදලින් අයකරගෙන ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. එසේම චෙක්පත අහරු වීම සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කර ඇති බවත්, නීතිඥයෙකු මාර්ගයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බවත් ප්‍ර.ග.නි./ග.නි. සඳහන් කරන ලද අතර මේ සම්බන්ධයෙන් වාර්තාවක් එවන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| **මීරිගම ප්‍රාදේශීය සභාව<br>2016 ඔක්තෝබර් 25** | | |
| 1. | 2012-2015 කාලය තුල සභා බල ප්‍රදේශයේ වරිපනම් ඒකක ප්‍රමාණයේ සංඛ්‍යාත්මක වැඩිවීමක් පෙන්නුම් නොකිරිමට හේතුව විමසන ලදි. | නව ප්‍රදේශ හඳුනා ගනිමින් එහි දේපල තක්සේරු කර වාර්තාවක් ලබාගැනිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවත් ඒ අනුව සංඛ්‍යාත්මක වැඩිවීමක් හා ආදායම් වැඩිවීමක් බලාපොරොත්තු වන බවත් ප්‍ර.ග.නි/ ග.නි පැවසිය. |
| 2. | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනුමත දැන්වීම් පුවරුවලින් ලද ආදායම් 2015 සිට 2016.09.30 වන විට අඩුවීම සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය. | ඉහල වාණිජ වටිනාකම් සහිත ප්‍රදේශවල පවතින දැන්වීම් පුවරුවලින් ලැබෙන ආදායම් පිළිබඳව සෑහීමකට පත් විය නොහැකි බව ප්‍රකාශ කළ කාරක සභාව ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදි මෙවැනි කරුණු අවධානයට ලක්කර සංසන්දනාත්මක විග්‍රහය තුලින් ආදායම් යථාවත් කර ගැනිමට කටයුතු කරන ලෙස අවධාරණය කළේය.<br>ඒ සඳහා සුදුසු ක්‍රමවේදය සකස් කර ගැනිමේ වගකීම ප්‍රාදේශීය සභාව සතුවන බවද වැඩිදුරටත් පැවසීය. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| 3. | ලෝලුවාගොඩ කැම්ලස්වත්ත නැමති ඉඩම වෙන්දේසි කිරීමේදි සභාවට පවරා දි ඇති ඉඩම් ප්‍රමාණය පොදු පහසුකම් සඳහා සුදුසු නොවන බව නිරීක්ෂණය වි ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව විමසිය. | මෙම ඉඩම කොටස් කිරිමේදි මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගෙන නොමැති අතර පොල් සංවර්ධන මණ්ඩලයේ විරෝධතාවයද ප්‍රකාශ කර ඇත. ඊට වගකිව යුතු නිලධාරින් දැනට සේවයේ නොමැති බැවින් ඔවුනට එරෙහිව ක්‍රියාමාර්ග ගැනිම දූෂ්කර වි ඇති බව ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කළේය.<br>දැනට කෙටුම්පත් කර ඇති අතුරු ව්‍යවස්ථාව අනුමත කර ගැනිමෙන් මෙම ගැටලු ක්‍රමිකව විසඳා ගැනිමට හැකියාව ලැබෙන බව ප්‍ර.ග.නි./ග.නී. වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br>මේ පිළිබඳව අප්‍රසාදය පලකළ කාරක සභාව මෙවැනි ප්‍රශ්න සම්බන්ධයෙන් පලාත් ප්‍රධාන ලේකම්ගේ විශේෂ අවධානය යොමු විය යුතු බව අවධාරණය කළේය. |
| 4. | සභා බල ප්‍රදේශය තුළ ඇති සම්ප්‍රේෂණ කුළුණු හඳුනාගෙන ගාස්තු අයකිරිමට පියවර නොගැනිම. | දැනට කුළුණු 7ක් හඳුනාගෙන ඇති බව ග.නි. ප්‍රකාශ කළේය.<br>ප්‍රාදේශීය ලේකම්ගේ අධීක්ෂණය මත ග්‍රාම නිලධාරීන් මගින් බල ප්‍රදේශය තුල පවතින කුළුණු පිලිබඳව තොරතුරු රැස්කර ඒවා පලාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන ඉදිකර තිබේද යන්න සනාථ කරගැනිමට කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 5. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරිම සහ අදාල පාර්ශ්වයන් වෙත ලබා දිමේ දි ප්‍රමාදයන් සිදු කිරීම. | මේ පිළිබඳව අවධානය යොමු කිරීමටත් පසු විපරම් කිරීමටත් ප්‍ර.ග.නි./ග.නී. පොරොන්දු වූ අතර මෙවැනි තත්ත්වයන් වලක්වා ගැනීම සඳහා පරිගනක වැඩසටහන් යොදා ගන්නා ලෙස කාරක සභාවට උපදෙස් දුන්නේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 6. | පස්යාල ප්‍රදේශයේ අපද්‍රව්‍ය පිළිස්සුම් ඒකකය මගින් සිදුවන පාරිසරික ගැටලු විසඳීමට කටයුතු නොකිරිම. | මෙය පෞද්ගලික සමාගමක් විසින් සිදුකරන බව අනාවරණය වූ අතර ප්‍රාදේශිය සභාවේ මැදිහත් වීම මත එහි කටයුතු නැවැත්වීමට ක්‍රියාකළ බවත් මේ පිළිබඳව ක්‍රියාමාර්ග ගැනිම මධ්‍යම පරිසර අධිකාරියේ වගකිම බවත් ග.නි. ප්‍රකාශ කළේය.<br>ප්‍රාදේශිය සභා වලට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් අනුයුක්ත කිරිම සහ ඔවුන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් සහ සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත වගකිව යුතු ලෙස පත් කිරීමේ වැදගත්කම කාරක සභාව අවධාරනය කළේය. |
| | **බස්නාහිර පළාත් සභාව<br>2016 ඔක්තෝබර් 25** | |
| 1. | 2015.08.11 වන දින පැවති බස්නාහිර පළාත් සභාව පිළිබඳ රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී මතු කරන ලද පහත සඳහන් විගණන විමසුම් හා කාරක සභාවේ නිර්දේශ මත ඒ සම්බන්ධයෙන් පළාත් සභාව පහත සඳහන් පියවර ගෙන ඇති බව ප්‍ර.ග.නි/ ග.නි විසින් පැහැදිලි කරන ලදී.<br>(අ) බස්නාහිර පළාත් සභාවේ ආයතනවල ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල නොකිරීම.<br>(ආ) විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබීම. | ඒ අනුව ආයතන විසින් පහත සඳහන් පරිදි කටයුතු කර තිබුණි.<br>(අ) බස්නාහිර පළාතේ සියළු ආයතන විසින් ක්‍රියාකාරී සැලැස්ම සකසා ඇති අතර සියළු ආයතන විසින් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇති බව ප්‍ර.ග.නි/ ග.නි දැන්වීය.<br>(ආ) සියළු අමාත්‍යාංශවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇති බවත් අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු ද, අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුවලට සම්බන්ධ කර ගෙන ඇත. අධිකාරී තුනක හැර අනෙකුත් අධිකාරිවලද විගණන හා කළමනාකරණ කමිටු පවත්වා ඇත. මෙම අධිකාරී තුනටද මෙම මස තුළ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | (ඈ) 2015 වර්ෂයේදී ආයතන තුනක් විගණකාධිපතිවරයා වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබීම.<br>(ඇ) පළාත් සභාව යටතේ ඇති ආයතන විසිපහට අදාළව නිකුත් කර තිබූ විගණන විමසුම් 185 ට පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම.<br>(ඉ) පළාත් සභාවේ අතිරික්ත මුදල් රු. මිලියන 9000 ක් කෙටිකාලීන ආයෝජනවල ආයෝජනය කර තිබීම. | විගණන හා කළමනාකරණ කමිටු පවත්වන ලෙස උපදෙස් ලබා දී ඇත.<br>(ඈ) මෙම ආයතන තුන 2015 වර්ෂය සඳහා අවසන් ගිණුම් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇති අතර 2016 වර්ෂයේ අවසන් ගිණුම්ද 2017.03.31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව ප්‍ර.ග.නි/ ග.නි විසින් සඳහන් කළේය.<br>(ඇ) මේ වන විට විගණන විමසුම් 124 ට පිළිතුරු ලබා දී ඇති අතර ඉතිරි විමසුම් 61 ද මසක් තුළ පිළිතුරු ලබා දෙන ලෙස උපදෙස් ලබා දී ඇති බව ප්‍ර.ගනි/ග.නි විසින් ප්‍රකාශ කළේය.<br>(ඉ) මෙම මුදලින් 2016.08.30 දින වන විට රු. මිලියන 6,750 ක් පමණක් භාණ්ඩාගාර රිපෝ යටතේ පවතින අතර ඇස්තමේන්තුගත වියදම් පියවා ගැනීම සඳහා භාණ්ඩාගාර රිපෝවල තැන්පත් කළ මුදලින් රු. මිලියන 3,944 ක් උපයෝගී කර ගෙන ඇති අතර ඉතිරි රු. මිලියන 2,806 ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු හා උපකරණ, සේවා හා ගෘහභාණ්ඩ ලබා ගැනීමට යෙදවීමට අපේක්ෂා කරන බව ප්‍ර.ග.නි/ ග.නි විසින් දන්වා තිබිණ. |
| | **දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව**<br>**2016 ඔක්තෝබර් 26** | |
| 1. | 2013 – 2015 වසර තුනක කාළ පරාසය තුළ විමර්ශන නිලධාරීන්ගේ කටයුතු වලට අදාළ වන මහජන පැමිණිලි පිළිබඳ වැඩි අවධානයක් යොමු කොට නොතිබීම. | විමර්ශන නිලධාරීන්ගේ හිඟය මෙයට හේතුවූ බවත්, නව බඳවාගැනීම් සිදු කොට මේ වන විට එම කටයුතු විධිමත් කොට ඇති බවත් ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 2. | 2015 වර්ෂය වන විට මෙම මහනගර සභාවේ සමස්ත හිඟ ආදායම රු.917,399,000/= ක් පැවතීම.<br>- එයින් වරිපනම් හා බදු ආදායම් හිඟය රු.344,899,000/= ක්ව පැවතීම.<br>- 2012 වසරේදී හිඟ වරිපනම් ආදායමෙන් රු. මිලියන 31 ක් කපා හැරීම.<br>- නගින්දාස් ආයතනයෙන් අය විය යුතුව තිබූ රු. 2,900,000/= ක් කපා හැරීමට හේතුව | මෙම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු යොදා ඇති බවත්, හිඟ වරිපනම් වලින් රු. මිලියන 100 ක් මේ වන විටත් අයකරගෙන තිබෙන බවත්, ග.නි. පැවසීය.<br>මහ නගර සභාවේ නිර්දේශ මත අදාල මුදල් කපා හැරීමට කටයුතු කළ බව ග.නි. පැවසීය. ඒ පිළිබඳව පළාත් පාලන කොමසාරිස් දැනුවත්ව නොමැති බව නිරීක්ෂණය කළ කාරක සභාව අනුමැතිය ලබා නොගෙන අය විය යුතු වරිපනම් මුදල් කපා හැරීම් පිළිබඳ පූර්ණ පරීක්ෂණයක් සිදු කර ඒ පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙස පළාත් පාලන කොමසාරිස් හට නියෝග කරන ලදි. |
| 3. | 2014 වර්ෂයේ සිට 2016 වසර දක්වා පවත්වා තිබෙන විගණන හා කළමනාකරණ කමිටු ප්‍රමාණය අල්ප වීම. | අවම වශයෙන් මාස තුනකට වරක් මෙම කමිටු පැවැත්විය යුතු බව කාරක සභාව අවධාරණය කරන ලදි.<br>මෙම මහ නගර සභාවේ ඇස්තමේන්තු ගත වාර්ෂික ආදායම රුපියල් බිලියන 1.5 ක් පමණ වන බවත්, මහ නගර සභාවට අභ්‍යන්තර විගණකවරයෙකු අනුයුක්ත කර නොමැති බවත්, ඒ සඳහා ගණකාධිකාරී සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරියෙකු ලබා ගැනීම සඳහා අයදුම් කර ඇති බවත්, ග.නි. සඳහන් කළේය.<br>රුපියල් බිලියනයකට වැඩි ප්‍රමාණයක වාර්ෂික ආදායමක් පවතින සියලුම පළාත් පාලන ආයතන වලට ඉහල ශ්‍රේණියේ ගණකාධිකාරිවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන් පත් කිරීම සඳහා පියවර ගත යුතු බවට කාරක සභාව විසින් ප්‍ර.ග.නි. වෙත උපදෙස් ලබා දෙන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 4. | අධිභාර නිකුත් කිරීම හා අභියාචනා ඉදිරිපත් කිරීම. | අධිභාර අභියාචනා ඉදිරිපත් කිරීමේදී එය සිදුකළ යුත්තේ රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වෙතද නැතහොත් පළාත් අමාත්‍යවරයා වෙතද යන්න පිළිබඳ ගැටලු සහගත තත්වයක් පවතින බව ප්‍ර.ග.නි./ ග.නි පෙන්වා දෙන ලදි.<br>මෙම ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයකට එළැඹිය යුතු බැවින් ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්, විගණකාධිපති සහ පළාත් සභාවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කොට, අදාළ නිර්දේශ නීතිපතිවරයා වෙත යොමු කරන ලෙස ප්‍ර.ග.නි. හට නියෝග කරන ලදි. |
| 5. | ගොඩනැගිලි සහ බිම් කට්ටි සැලසුම් අනුමත කිරීමේ ක්‍රියාවලිය | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා විධිමත් ක්‍රියා පටිපාටියක් පැවතිය යුතු බව අවධාරණය කළ කාරක සභාව, එම කටයුතු මෙන්ම සියලුම පරිපාලන කටයුතු වල පහසුව, නිරවද්‍යතාව හා කාර්යක්ෂමතාව උදෙසා පරිගණක ජාලගත වැඩසටහනක අවශ්‍යතාව පෙන්වා දෙන ලදි.<br>ශ්‍රී ලංකාවේ සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධිත පරිගණක ජාලගත වැඩසටහනක් සම්පාදනය කළ යුතු බවත්, එම වැඩසටහනේ සැලසුම් සහ ක්‍රියාත්මක භාවය පිළිබඳ වාර්තාවක් 2016 දෙසැම්බර් මස 01 වැනි දිනට පෙර කාරක සභාව වෙත එවන ලෙසත් ප්‍ර.ග.නි. හට නියෝග කරන ලදි.<br>බස්නාහිර පලාත් සභාව තුළ පවතින සියලුම පළාත් පාලන ආයතන වල එම පරිගනක ජාලගත වැඩසටහන් වල ක්‍රියාත්මකභාවය පිළිබඳ වෙනම වාර්තාවක් කාරක සභාව වෙත එවන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ලෙස පළාත් පාලන කොමසාරිස් හට නියෝග කරන ලදි. |
| 6. | නාම පුවරු මගින් ලැබෙන ආදායම | මහ නගර සභාව මගින් ලබාදෙනු ලබන තීරණ ප්‍රකාරව නාම පුවරු සඳහා වන ගාස්තු වල උච්ඡාවචනයන් සිදු වන බව ග.නි. පැවසීය. අනවසර හෝ නියමිත ගාස්තු නොගෙවන දැන්වීම් පුවරු සඳහා ගනු ලබන නීතිමය පියවරයන්ට අමතරව ඒ සඳහා දඩ මුදල් අයකරගැනීමේ ක්‍රමවේදයක් සැකසිය යුතු බව අවධාරණය කළ කාරක සභාව මෙම කටයුතු නියාමනය සඳහා පළාත් සභාව විසින් කමිටුවක් පත් කොට ඒ සඳහා නිසි ක්‍රමවේදයක් සැකසිය යුතු බව නිර්දේශ කරන ලදි. |
| 7. | කසල කළමනාකරණය | කසල කළමනාකරණය පිළිබඳ රට පුරා පවතින අයහපත් තත්වය කෙරෙහි අවධානය යොමුකළ කාරක සභාව බස්නාහිර පළාත තුළ කසල කළමනාකරණය පිළිබඳ වත්මන් තත්වය අනාවරණය කරගැනීම සඳහා පහත සඳහන් තොරතුරු සහිත වාර්තාවක් කාරක සභාව වෙත ලබාදෙන ලෙස ප්‍ර.ග.නි. හට නියෝග කරන ලදි.<br><br>- පළාත තුළ තිබෙන පළාත් පාලන ආයතන ගණන, එම එක් එක් පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුල ඇති ග්‍රාම නිලධාරී වසම් ගණන සහ නිවාස ගණන<br>- ඒවායින් දැනට කසල එකතු කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් ගණන සහ නිවාස ගණන<br>- එම කසල එකතු කිරීමේ කාර්යය කරනු ලබන්නේ සභාව මගින්ද නැතහොත් කොන්ත්‍රාත් පදනම |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | | මත පුද්ගලික අංශය විසින්ද යන වග<br>- කසල කළමනාකරණය සඳහා ඒ ඒ සභා විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න හා කොම්පෝස්ට් ව්‍යාපෘති වැනි වැඩ සටහන් වලට අනුගතවී ඇත්ද යන වග<br>එසේ නොමැතිනම් මෙම කොම්පෝස්ට් ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කරන ලෙස කාරක සභාව නියෝග කරන ලදී. |
| **පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>2016 ඔක්තෝබර් 26** | | |
| 1. | 2015 ක්‍රියාකාරී සැලැස්ම අනුව එම වර්ෂය තුලදි නිමකිරීමට යෝජිතව තිබූ සැලසිනේ ආයතනය රාජ්‍ය සමාගමක් ලෙස ස්ථාපිත කිරීම සහ ජාතික විකාශන සංවර්ධන අධිකාරිය පිහිටුවිම යන කාර්යයන් හි වර්තමාන ප්‍රගතිය | සැලසිනේ ආයතනය සමාගමක් බවට පත්කිරිමේ තිරණයට එළඹී ඇතත් ජාතික විකාශන සංවර්ධන අධිකාරිය පිහිටුවිම රාජ්‍ය ප්‍රතිපත්තීන් හා බැඳී ඇති කාරණයක් බැවින් මේ දක්වා පියවරක් ගෙන නොමැති බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. |
| 2. | 2015 සහ අනෙකුත් වර්ෂවලට අදාල විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයිමේ ප්‍රමාදය | විගණන විමසුම් සඳහා සති 2 තුල පිලිතුරු ලබා දිමට කටයුතු කරන බවට ප්‍ර.ග.නි. පොරොන්දු විය. විගණන විමසුම් සඳහා නොපමාව පිලිතුරු ලබාදීමට කටයුතු කළ යුතු බවත් ඒ සඳහා තොරතුරු තාක්ෂණය යොදාගැනීම පිළිබඳව අවධානය යොමු විය යුතු බවත් නිර්දේශ කළ කාරක සභාව “වාහන පාලනය”යන ශිර්ෂය යටතේ 2015.10.19 දින පිළිතුරු යොමු කළ විගණන විමසුමේ පිටපතක් කාරක සභාවටද ඉදිරිපත් කරන ලෙස නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 3. | 2015 වර්ෂයේ ප්‍රමාණවත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබීම. | අමාත්‍යාංශය යටතේ ආයතන 13 පවතින අතර කාර්යයන් අනුව ඒවා එකිනෙකට වෙනස් වීමත් ඇතැම් ආයතන අක්‍රිය තත්ත්වයේ පැවතීමත් නිසා වාර්ෂිකව කමිටු රැස්වීම් 52 පැවැත්වීම ඉතා දුෂ්කර කාර්යයක් බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි.ඉදිරියේදි ආයතන කිපයක් එකතු කර කමිටු රැස්වීම් පැවැත්වීම කෙරෙහි අවධානය යොමු වි ඇති බව පැවසිය.<br>කමිටු රැස්වීම් පැවැත්වීම පමණක් අරමුණ නොවිය යුතු බවත් අපේක්ෂිත කාරණා ඉටුකරගැනිම කෙරෙහි වැඩි අවධානයක් යොමු විය යුතු බවත් කාරක සභාව අවධාරණය කළේය. |
| 4. | වැරදි තොරතුරු හෝ ප්‍රවෘත්ති ප්‍රචාරය වීම සම්බන්ධ පැමිණිලි සලකා බැලීමේ කොමිසම් පනත විද්‍යුත් මාධ්‍ය ආයතන සඳහා ද අදාල වන පරිදි සංශෝධනය කිරීම. | පුවත්පත් මගින් වැරදි ප්‍රවෘත්ති ප්‍රචාරය වීම සම්බන්ධ පැමිණිලි විමර්ශනයට පුවත්පත් මණ්ඩල පනතින් ප්‍රතිපාදන ඇතත් විද්‍යුත් මාධ්‍යයෙන් සිදුවන වැරදි පරික්ෂා කිරිමට හැකියාවක් නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් රජය ප්‍රතිපත්තිමය තිරණය වලට එළඹීමේ අවශ්‍යතාවයක් පවතින බැවින් වගකිව යුතු අංශවල අවධානයට යොමුකරවන බව ප්‍ර.ග.නි.ප්‍රකාශ කළේය.<br>පවතින නිතිරිති සංශෝධනය කර ගැනිම සඳහා ගරු අමාත්‍යවරයාගේ අවධානය යොමුකරවිමට කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 5. | රූපවාහිනී ප්‍රතිසම තාක්ෂණය (Analog) වෙතින් සංඛ්‍යාංක තාක්ෂණය (Digital) වෙත මාරුවීම සහ ඒ සඳහා ජර්මන් තාක්ෂණය හෝ | ප්‍රතිසම තාක්ෂණය සම්බන්ධයෙන් රජය මේ දක්වා තිරණයකට පැමිණ නැතත් ඒ සඳහා ජපන් තාක්ෂණය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | ජපන් තාක්ෂණය යොදා ගැනිමේ තීරණය සම්බන්ධයෙන් එහි වර්තමාන තත්ත්වය | තෝරාගෙන ඇති බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. |
| 6. | රාජ්‍ය මුදල් අයථා ලෙස පුද්ගලික පාර්ශ්වයන් වෙත යාම වැලැක්විම සඳහා බලපත්‍රලාභීන්ගේ වාර්ෂික ගාස්තු අයකිරීම සහ බලපත්‍ර අළුත් කිරිමේ ක්‍රමවේදයක් සැකසිම. | රූපවාහිනී සංස්ථා විකාශන පනතේ වගන්ති අනුව ස්වාධීන රූපවාහිනි ආයතනය හැර අනෙකුත් ආයතන වෙත තාවකාලික පදනම මත බලපත්‍ර නිකුත් කර ඇති බැවින් ඒවා අවලංගු කර ක්‍රමවත් බලපත්‍රයක් නිකුත් කිරිම කාලීන අවශ්‍යතාවයක් වන නමුත් මෙය සංවේදි කාරණාවක් වන බැවින් ඒ පිළිබඳව ඉහල මට්ටමේ අවධානයක් යොමු විය යුතු බව ප්‍ර.ග.නි./ග.නී ප්‍රකාශ කළේය. |
| 7. | යාපනය ප්‍රදේශයේ පවතින ලියාපදිංචි නොවූ වෙබ් අඩවි පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. | මෙම වෙබ් අඩවි විදුලි සංදේශ නියාමන කොමිසම හරහා තහනම් කිරීමේ හැකියාව සොයා බැලිය යුතු බවත් එසේ නොමැති නම් පැමිණිලි ඉදිරිපත් වන අවස්ථාවන් අනුව විමර්ශන සිදුකර නිතියට අනුකූලව කටයුතු කරන ලෙසත් මේ සම්බන්ධයෙන් වගකිව යුතු ඩිජිටල් තාක්ෂණ අමාත්‍යාංශයේ අවධානය යොමුකර සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගැනිමට කටයුතු යුතු බව කාරක සභාව අවධාරනය කළේය. |
| 8. | අනුමත ප්‍රමාණය ඉක්මවා අමාත්‍යවරයා නිල වාහන පරිහරනය කිරිම, දුරකතන සහ විදුලි බිල්පත් ගෙවිම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග | මෙම කාරණයේ සත්‍යාසත්‍යතාවය පරික්ෂා කර ගැනිමට තොරතුරු නොමැති විම ගැටලුවක් වි ඇති බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br>මෙම මුදල් අයකර ගැනිම ගණකාධිකාරිවරයාගේ වගකීම වුවත් එය නිසි පරිදි ඉටුකර නොමැති බැවින් මේ සම්බන්ධයෙන් වහා පරික්ෂණයක් සිදුකර කාරක සභාවට වාර්තාවක් ලබා දෙන ලෙසත් නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 9. | අනුමැතියකින් තොරව පෞද්ගලික ගුවන් විදුලි හා රූපවාහිනි බලපත්‍ර නිකුත් කිරීම. | ගුවන් විදුලි සංස්ථා හා රූපවාහිනි සංස්ථා පනතේ විධිවිධානවලට අනුව අමාත්‍යවරයාට පැවරී ඇති බලතල මත අදාල බලපත්‍ර තාවකාලික පදනමින් නිකුත් කර ඇත. සැටලයිට් නාලිකා සඳහා විදුලි සංදේශ නියාමන කොමිසමේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බවට කොන්දේසියක් පනවා ඇති බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. කෙසේ වෙතත්, සියළු විධිවිධාන ඇතුලත් කර විකාශන අධිකාරි පනත සම්මත කර ගැනිම මෙයට ඇති එකම විසඳුම බැවින් ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා සමග සාකච්ඡා කරමින් සිටින බව ප්‍ර.ග.නි./ග.නි දැන්විය. |
| 10. | 2012 වර්ෂයේ රන්මිණිතැන්න ටෙලි සිනමා ගම්මානයෙන් රු.මිලියන 39.5 ක පාඩුවක් සිදුවිම සහ වර්තමානයේද එය පාඩු පිට පවත්වාගෙන යාම. | පාඩුව අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල පුහුණු වැඩසටහන් පැවැත්විම සඳහා ලබාදීමටත් නේවාසිගාරයක් ලෙස යොදා ගැනිමටත් අවධානය යොමු වී ඇති බව ප්‍ර.ග.නි./ග.නි. සඳහන් කළේය. මෙම ගම්මානය වෙනත් අරමුණක් සඳහා යොදා ගැනිම පිළිබඳව සලකා බලමින් සිටින බව ද ප්‍ර.ග.නි/ ග.නි. වැඩිදුරටත් පැවසූ අතර මෙම අදහසට කාරක සභාවේද යහපත් ප්‍රතිචාර හිමිවිය. |
| 11. | හිටපු අමාත්‍යතුමියගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සාමාජියෙකු අමාත්‍යාංශයෙන් රු. මිලියනක වැටුප් ලබාගැනිම සහ එම කාලය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන්ද වැටුප් ලබාගෙන තිබිම. | නිතිපති උපදෙස් අනුව රු 50,000/= බැගින් වූ වාරික වලින් අයකරගැනිමට කටයුතු කර ඇති අතර රු.100,000/= මුදලක් ආපසු ගෙවා ඇතත් ඉතිරි මුදල් අයකරගැනිම සඳහා නිතිපති උපදෙස් අනුව කටයුතු කිරීමට සිදුවන බව ප්‍ර.ග.නි./ග.නී. ප්‍රකාශ කළේය. |
| 12. | ආනයනික වෙළඳ දැන්විම් හඳුනාගැනිමේ ක්‍රමවේදයක් | රූපවාහිනි දැන්විම් නියාමනය කිරිම සඳහා තාක්ෂණික ක්‍රමවේදයක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | නොතිබිමත් එහි පසු විපරමේ පවතින දුර්වලතාවතාවයත් නිසා රජයට රු.මිලියන 10 වැඩි ආදායමක් අහිමි විම. | නොමැති බවත් නියෝජිත ආයතන විසින් අදාල බදු මුදල් අනුග්‍රාහකයාට එකතු කරන බැවින් වංචාවක් සිදුවිමට ඉඩක් නොමැති බවත් ප්‍ර.ග.නි./ග.නී ප්‍රකාශ කළේය. |
| 13. | 2015 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු රු මිලියන 32 ක හිඟ බදු මුදල් අයකරගෙන නොතිබිම. | රූපවාහිනි නාලිකා 2 න් පමණක් මෙම හිඟ මුදල් අයවිය යුතු අතර නීතිපති උපදෙස් අනුව කටයුතු කිරිමට පියවර ගෙන ඇති බව ප්‍ර.ග.නි.දන්වා සිටියේය. |
| 14. | ආනයනික ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වෙළඳ ප්‍රචාරක වැඩ සටහන් වලින් බදු අයකිරීම. | මාධ්‍ය ආයතනවල කටයුතු පාලනය කිරිමේ 100% බලයක් අමාත්‍යාංශයට නොමැති අතර 2006 අංක 11 දරන මුදල් පනතට අනුව මාධ්‍ය ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය අමාත්‍යාංශ ලේකම්වරයා සතු කාර්යයක් වුවත් ඒ සම්බන්ධයෙන් දැනට පවතින නිතිමය අඩුලුහුඩුකම් නිවැරදි කර ගැනිම සඳහා අවධානය යොමු කර ඇති බව ප්‍ර.ග.නි./ග.නී. ප්‍රකාශ කළේය. |
| **ගණකාධිකාරි සේවයේ පවතින පුරප්පාඩු සහ වැටුප් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වන තෙවන රැස්වීම<br>2016 ඔක්තෝබර් 27** | | |
| 1. | රාජ්‍ය සේවයේ සංඛ්‍යාත්මක වැඩිවීමත් සමග ගණකාධිකාරි සේවයේ අනුමත සේවක සංඛ්‍යාව වැඩිකිරීම පිළිබඳ කාරක සභාව විමසීය. | 2016.06.30 දින වන විට තනතුරු 1871 ක් ගණකාධිකාරි සේවය සඳහා අනුමත වී ඇති බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |
| 2. | ගණකාධිකාරි තනතුරු ඇති කිරීම සඳහා යොදාගන්නා නිර්ණායකයන් | සේවක සංඛ්‍යාව, ආදායම, උප කාර්යාල, ස්ථානීය අවශ්‍යතාවය යන කරුණු පදනම්ව මෙම තනතුරු ඇතිකරන බවත්, ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව නිර්ණය කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 3. | ගණකාධිකාරි සේවයේ පුරප්පාඩු පිරවීමට ගෙන ඇති පියවර | පුරප්පාඩු 275 ක් පිරවීම සඳහා තරඟ විභාගයක් පවත්වා බඳවාගැනීම් සිදුකිරීමට කටයුතු කරන බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. මෙම තනතුරු ඇති කිරීම සඳහා නිර්ණායකයන් සෑදීමේදී හා නිලධාරීන් බෙදීමේදී ජනවාර්ගික තත්ත්වය හා සංස්කෘතික හුරුව පිළිබඳ අවධානය යොමු කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය. |
| 4. | විගණන කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමට ගෙන ඇති අතිරේක පියවර | විගණන කටයුතු කාර්යක්ෂම කිරීමට අතිරේක සහායක කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතු බවත් පවතින කාර්ය මණ්ඩලය අවශ්‍ය ස්ථාන වලට නැවත අනුයුක්ත කිරීමෙන් සේවක අවශ්‍යතාව සපුරා ගත හැකි බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. මීට අමතරව කාර්ය මණ්ඩලයේ සහ නිලධාරීන්ගේ භාෂා නිපුණතාව පිළිබඳව අවධානය යොමු කළ යුතු බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |
| 5. | ගණකාධිකාරි සේවයේ සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ ස්ථාන මාරුවීම් | වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලීම් නොමැති බැවින් දීර්ඝ කාලීනව එකම සේවා ස්ථානයේ සේවය කළ නිලධාරීන් හට අනිවාර්ය ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කරන බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. මෙම ස්ථාන මාරුවීම් පිළිබඳව කමිටුවක් පත් කර එහි සංයුතිය නොවැම්බර් 05 ට පෙර කාරක සභාවට දැනුම් දෙන ලෙස ද දෙසැම්බර් 20 වන විට මේ සඳහා අනුගමනය කරන ක්‍රමවේදය පිළිබඳව කාරක සභාවට දැනුම් දෙන ලෙස ද නියෝග කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>2016 ඔක්තෝබර් 27** | | |
| 1. | 2015 දෙසැම්බර් 31 දිනට 236ක අතිරික්ත කාර්ය මණ්ඩලයක් පැවතීම. | ආයතනයේ සේවක මණ්ඩලය වැඩි කිරීමට අවශ්‍ය වුවද මෙතෙක් එය අනුමත නොවීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වී ඇති බව ග.නි. පැවසීය.<br>මෙහි ගැටළු සහගත තත්වයක් පවතින බැවින් සෑම දිස්ත්‍රික්කයකම අනුමත කාර්ය මණ්ඩලය, පුරප්පාඩු සංඛ්‍යාව හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ සවිස්තර වාර්තාවක් 2016 නොවැම්බර් මස 20 වන දිනට පෙර ඉදිරිපත් කරන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 2. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් භාවිතා නොකරන නිල නිවාස | මෙම නිවාස බොහොමයක් අළුත්වැඩියා කිරීම් අවශ්‍ය තත්වයේ ඇති බවත්, ඒ සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වීම හා සමහර නිලධාරින්ට නිල නිවාස අනවශ්‍ය වීම වැනි හේතූන් කරණ කොට මෙම නිල නිවාස භාවිතා නොකරන තත්වයට පත්ව ඇති බව ග.නි. පැවසීය.<br>නිල නිවාස නඩත්තු කිරීමේ වගකීම ප්‍රාදේශීය ලේකම් විසින් භාර ගත යුතු බවත්, මෙය දිවයිනටම බලපා ඇති ගැටළුවක් බැවින් ඒ සඳහා සුදුසු ප්‍රායෝගික වැඩපිළිවෙළක් සකස් කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි. /ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 3. | භාවිතයට නොගන්නා බහුකාර්ය ගොඩනැඟිලි හා ප්‍රජා ශාලා | ගොඩනැඟිලිවල ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර නොමැති වීම, ඉඩම් පවරාගෙන නොමැති වීම, ජල විදුලි පහසුකම් ලබා දී නොමැති වීම යනාදි හේතූන් නිසා මෙම ගොඩනැඟිලි භාවිතයට ගැනීමට නොහැකි |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | | තත්වයේ පවතින බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.<br>ඵලදායි කටයුත්තක් සඳහා මෙම බහුකාර්ය ගොඩනැඟිලි ප්‍රයෝජනයට ගැනීමට ඇති හැකියාව සොයා බලන මෙන් කාරක සභාව නිර්දේශ කළ අතර, එම නිර්දේශය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යෝජනා කර එහි ප්‍රගතිය වාර්තා කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 4. | දෙවිනුවර ගන්දරවැල්ල ධීවර ගම්මානයේ රේන්දපොල ඉදිකිරීමේදී අනුමත වී තිබුණු රු.594,898/= ක ප්‍රතිපාදනවලින් රු. 41,378/= ක් වියදම් කිරීමෙන් අනතුරුව කර්මාන්තය අත්හැර දමා තිබීම. | පසුගිය ගිණුම් කාරක සභා නියෝගය පරිදි ව්‍යාපෘතියට අදාල ලිපි ලේඛන ධීවර හා ජලජ සම්පත් අමාත්‍යංශ ලේකම්තුමාට ඉදිරිපත් කළ බවත් කර්මාන්තය සඳහා ඉදිකළ ගොඩනැගිල්ල මුහුදු ඛාදනය නිසා විනාශ වී ඇති බවත් ඉන් අනතුරුව ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු ඇණ හිටි බවත් ග.නි. පැවසීය.<br>මින් පෙර කාරක සභාවකදී සාකච්ඡා කළ කරුණක් වන හෙයින් මීට වඩා සූදානම්ව පැමිණීමේ වැදගත්කම අවධාරණය කළ කාරක සභාව මෙහි වර්තමාන තත්වය පිළිබඳ වාර්තාවක් එවන ලෙසද නියෝග කරන ලදී. |
| 5. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ග්‍රාම නිලධාරි කාර්යාලය සඳහා ප්ලාස්ටික් පුටු 3250 ක් මිලදී ගැනීම සඳහා පළමුවෙන් කැඳවන ලද මිල ගණන්වල රු. 510/- ක් වූ දෙවන අවම මිල තෝරා නොගෙන, එම මිල ගණන් අවලංගු කර නැවත මිල ගණන් කැඳවා එකක් රු. 550/- බැගින් මිලදී ගැනීම නිසා රු. 130,000/= ක් වැඩිපුර ගෙවා තිබීම පිළිබඳ විමර්ශණාත්මක වාර්තාවක් | පසුගිය කාරක සභාවේදී මෙම කරුණ පිළිබඳ සටහන් තබාගෙන නොමැති නිසා වාර්තාව එවීම අතපසු වූ බව ග.නි. පැවසීය.<br>එම පිළිතුර සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බව පැවසූ කාරක සභාව අමාත්‍යාංශය විසින් මින් පෙර ගිණුම් කාරක සභා රැස්වීම් පැවැත්වූ සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සටහන් කාරක සභා කාර්යාංශයෙන් ගෙන්වා ගෙන ලිපි ගොනු විවෘත කළ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | ඉදිරිපත් කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට දන්වා තිබූ නමුත් විමර්ශණාත්මක වාර්තාවක් ඉදිරිපත් කර නොතිබීම. | යුතු බව අවධාරණය කළ අතර, මේ පිළිබඳ වාර්තාවක් මසක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 6. | දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ලක් 1997 වර්ෂයේ සිට රු. 4,000/= ක මාසික කුලිය මත සමූපකාර සමිතියකට බදු දී තිබූ නමුත්, එම සමිතිය 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා මාස 29 ක් වෙනුවෙන් බදු කුලී ගෙවා නොතිබුණි. රු. 116,000/= ක්වූ හිඟ බදු කුලී අයකිරීම සඳහා ද ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. වර්තමානය වන විට බදු කුලියේ වැඩිවීමත් සමඟ හිඟ බදු කුලිය රු. 5,053,433/= ක් විය. | මෙම ගොඩනැගිල්ල බදු ගෙන ඇත්තේ දෙවිනුවර විවිධ සේවා සමූපකාර සමිතිය බවත්, මෙම ගොඩනැගිල්ලෙන් එම සමිතිය ඉවත් කිරීම සඳහා උත්සහ කළ ද, පැමිණි මහජන විරෝධතා හමුවේ එය සිදු කිරීමට නොහැකි වූ බවද, ඉන් පසු ගොඩනැගිල්ල නීත්‍යානුකූලව සමූපකාර සමිතියටම පැවරීමට තීරණය කර ඇති බවද ග.නි. පැවසීය. මෙම ගෙවීම් අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට සමූපකාර කොමසාරිස්ට භාර දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 7. | දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2009 හා 2010 යන වර්ෂවල සුනාමි නිවාස ඉදිකිරීමට, මාතර කතරගම දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට සහ ජලසම්පාදන වැඩිදියුණු කිරීම් යන කාර්යයන් සඳහා ඉඩම් කැබලි 88 ක් පවරාගෙන තිබුණු නමුත්, 2012 වර්ෂයේ ඔක්තෝබර් දක්වාම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණු අතර වර්තමානය වන විටත් ඉඩම් කැබලි 84ක් ලියාපදිංචි කර නොතිබුණි. | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පවතින ලිපි ලේඛන හා ලේකම් කාර්යාලයෙන් යවන ලද ලිපි ලේඛනවල දත්තවල පවතින පරස්පරතාවය හේතුවෙන් ඉඩම් ලියාපදිංචිය සිදු කිරීමට නොහැකි බව දන්වා තිබූ බවද, ඉඩම් රෙජිස්ට්‍රාර්තුමියට මේ සම්බන්ධව උපදෙස් ලබා දීමෙන් පසු ඉදිරි කාලයේදී මෙය නිම කිරීමට එතුමිය එකඟ වූ බවද ග.නි. පැවසීය. |
| 8. | 2012 අගෝස්තු 29 දින රු. 919, 764/= ක වියදම් දරා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපිත කර තිබුණු නමුත්, එහි සේවා කටයුතු නිසි පරිදි | ආයතනයේ ආරක්ෂක පද්ධතියට ඇති වූ හානියක් වන මෙයට නිසි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වීම ආයතනයේ හා එහි නිලධාරින්ගේ වෘත්තිමය ගරුත්වයට හානියක් බව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | ඉටුකරවා නොගැනීම නිසා 2016 ජුනි 01 දින වනවිට සම්පූර්ණ කැමරා පද්ධතියම අක්‍රියවී තිබුණු අතර එහි විදුලි රැහැන්ද ගලවා ඉවත් කර තිබීම. | කාරක සභාව අවධාරණය කරන ලදී. අමාත්‍යාංශය විසින් කැමරා පද්ධතිය පරීක්ෂාවට ලක් කොට වෙනත් රජයේ ආයතනයකට හෝ මෙය ලබා දීමේ හැකියාව සොයා බලන මෙන් කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළ අතර මෙම ආයතනයේ සියලු පරිපාලන කටයුතු අඩුපාඩුවකින් තොරව ඉටු කිරීමේ වගකීම සහ ආයතනයේ භෞතික හා මානව සම්පත්වල වගකීම දිස්ත්‍රික් ලේකම්තුමාට ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කරන ලදී. |
| 9. | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදුවී තිබුණු රු. 664, 200/- ක මුද්දර වංචාව සහ වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගිනි තැබීමට අදාල සිද්ධීන් සම්බන්ධයෙන් වර්තමානය වන විටද කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳ ක්‍රියාමාර්ග ගත නොහැකිව තිබුණේ අදාල ලිපිගොනු අස්ථානගතව පැවතීම හේතුවෙන් බවත්, දැනට එම ලිපිගොනු හමු වී ඇති බැවින් මුද්දර වංචාවට සම්බන්ධ නිලධාරින් දෙදෙනාට එරෙහිව කටයුතු කිරීමට ක්‍රියා කරන බවත් ග.නි. පැවසීය.<br>මෙම කරුණ දීර්ඝ කාලයක් තිස්සේ පවතින ගැටළුවක් බැවින්ද, සිද්ධියට සම්බන්ධ නිලධාරින් විශ්‍රාම ගොස් ඇති හෙයින් ද සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය කරමින් හැකි ඉක්මනින් මෙයට විසඳුමක් ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| 10. | මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් විසින් දීමනාපත්‍රලාභින් වෙත රජයේ ඉඩම් බෙදාදීමට පිළියෙළ කර තිබූ දීමනාපත්‍ර 407 ක්, 2016 ඔක්තෝබර් 10 දින වනවිටත් බෙදාදීමට කටයුතු නොකර එම කාර්යාලවල රඳවාගෙන තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සියලු ප්‍රාදේශීය ලේකම්වරුන් කැඳවා සාකච්ඡාවක් පැවැත්වූ බවත්, මෙම දීමනා පත්‍ර බෙදා දී අවසන් බව එහිදී සඳහන් වූ බවත් ග.නි. පැවසීය.<br>නමුත් කාරක සභාව විසින් කාරක සභාව පැවැත්වෙන අවස්ථාවේම සිදුකළ විමසීමකදී මූලටියන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීමනාපත්‍ර තවමත් බෙදා දී නොමැති බව හෙළිවිය. සභාව හමුවේ ඉදිරිපත් කරන කරුණුවල විශ්වාසනීයත්වයේ වැදගත්කම අවධාරණය කළ කාරක සභාව මේ පිළිබඳ ලිඛිත වාර්තාවක් සපයන මෙන් ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදී. |
| **වයඹ පලාත් සභාව<br>2016 ඔක්තෝබර් 27** | | |
| 1. | පළාත තුළ ඇති පාසල් 1254 හි පවතින විදුහල්පති පුරප්පාඩු | පාසල් 326 ක වැඩ බලන විදුහල්පතිවරුන් සේවය කරන බව මෙහිදී ග.නි. විසින් අනාවරණය කරන ලදි. වැඩ බලන විදුහල්පතිවරුන් පිළිබඳව ද අවධානය යොමු කොට, ඉදිරි වසර 3 තුළ විශ්‍රාම යාමට නියමිත විදුහල්පතිවරුන් ප්‍රමාණය පිළිබඳව ද සැලකිල්ලට ගෙන මෙම විදුහල්පති පුරප්පාඩු පිරවීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයකට එළැඹෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි. හට උපදෙස් ලබා දෙන ලදි. |
| 2. | පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ පිහිටි පුද්ගලික සමාගමක් විසින් භුක්ති විඳින අක්කර 04 රූඩ් 03 පර්චස් 37 ක ඉඩම හා රූඩ් 01 පර්චස් 28 ක අනවසරයෙන් භුක්ති විඳින ඉඩම සඳහා වසර 12 කට ආසන්න කාලයක සිට දිගු කාලීන බදු ගිවිසුමකට ඇතුළත්ව බදු මුදල් අයකර නොතිබීම. | හිඟ බදු අය කරගැනීමට කටයුතු කර ඇති බවත්, රජයට ලැබිය යුතු මෙම ආදායම ලබා ගැනීම සඳහා කටයුතු කිරීම අදාළ ප්‍රාදේශීය ලේකම් සතු වගකීමක් බවත් ග.නි. පැවසීය. මෙම ඉඩම පිළිබඳව මෙන්ම, අද දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් සකස් කරන ලද සටහනෙහි සඳහන්ඉඩම් 5 පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන මෙන් ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 3. | 2012 සහ 2013 වර්ෂවලට අදාළව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් රෝහල් 03 ක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 03 ක සහ ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් ඒකකයේ, වටිනාකම රු. 222,540/= ක් සහ රු.3,016,124/= ක ඖෂධ වර්ග 96 ක් හා වටිනාකම ගණනය කළ නොහැකි ඖෂධ වර්ග 49 ක ඒකක 270012 ක සහ ඖෂධ වර්ග 84 ක ඒකක 874344 ක තොගයක් කල් ඉකුත්වීම හා විවිධ හේතූන් මත ගබඩා තුළ රඳවා තිබීම. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් රෝහල් 06 ක සහ කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලීය ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් ඒකකයේ ඖෂධ වර්ග 413 ක වටිනාකම රු. 16,945,704/= ක් වූ ඒකක 10,162,768 ක් ද වටිනාකම ගණනය කළ නොහැකිවූ තවත් ඖෂධ වර්ග 53 ක් ද, කල් ඉකුත්වීම, නියැදි සාම්පල අසමත්වීම, පැහැය හා සුවඳ වෙනස්වීම යන කරුණු හේතුවෙන් භාවිතයෙන් ඉවත් කර තිබීම. | මේ සඳහා ප්‍රධාන හේතු 06 ක් බලපාන බවත්, රේඛීය අමාත්‍යාංශය මගින් සපයන මෙම ඖෂධ අපහරණ ක්‍රියාවලිය සඳහා මණ්ඩලයක් පත්කොට ඇති බවත්, කෙසේ වුවද 2015 අගෝස්තු මස 08 හා 09 දිනවල අපහරණ කටයුතු සිදු කර ඇති බවත් ග.නි. පැවසීය. මෙම ගැටලුව සියලුම පළාත් සභා වල පවතින්නක් බැවින් ඒ සඳහා විධිමත් ක්‍රියාවලියක අවශ්‍යතාව පෙන්වා දුන් කාරක සභාව මේ සඳහා මැදිහත්ව කටයුතු කරන මෙන් ප්‍ර.ග.නි. හට උපදෙස් ලබා දෙන ලද අතර සියලුම පළාත් සභා කැඳවා මෙම ගැටලුව පිළිබඳ සාකච්ඡා කොට, ඒවා ඇති වීමට හේතු සහ එය වලක්වා ගැනීමට ගතයුතු ක්‍රියා මාර්ග ඇතුලත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස දන්වන ලදි. |
| 4. | 2006 අංක 21 දරණ පනත ප්‍රකාරව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් එකතු කළ මුදලින් 50% ක් වූ රු. 5,600,000/= ක් පළාත් සභාව වෙත නොයවා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් විශේෂ ගිණුමකට ඉන් රු. 3,610,685/= බැර කර තිබීම. | මෙම පනත ප්‍රකාරව, එක් එක් පළාත් සභා මගින් පසුගිය වසර 5 තුළ එක්රැස් කළ මුදල් ප්‍රමාණය සහ ඒවා බැරවී ඇති ආකාරය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට ලබාදෙන ලෙස ප්‍ර.ග.නි. හට නියෝග කරන ලදි. |
| 5. | පළාත් භාණ්ඩාගාර තැන්පතු ගිණුම යටතේ හානි හා පාඩු ලෙස ගිරිඋල්ල කලාප කාර්යාලයේ සිදුව ඇති රු. 13,609,655/= ක මූල්‍ය වංචාව සම්බන්ධයෙන් කපාහැරීම සඳහා ලබා දුන් මුදල ආපසු අය කරගෙන | 2011 වසරේ දී සිදුව ඇති මෙම සිද්ධිය පිළිබඳව පොලිසියට පැමිණිලි කොට ඇති බවත්, මූලික විමර්ශනයක් මගින් 14 දෙනෙකුට විරුද්ධව කටයුතු කර ඇති බවත්, ප්‍රධාන සැකකරු විදේශගතව ඇති බවත්, ග.නි. සඳහන් කළේය. අදාළ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | නොතිබීම හා ඒ පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැති වීම. | ගිණුම පැවති මහජන බැංකුවෙන්ද වාර්තාවක් ලබා ගෙන, මේ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු කොට මෙම දෙසැම්බර් මස 20 දිනට පෙර වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස ප්‍ර.ග.නි. හට නියෝග කරන ලදි. |
| **කළුතර නගර සභාව<br>2016 ඔක්තෝබර් 28** | | |
| 1. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම හා වරිපනම් බදු අය කරගැනීමේදී වරිපනම් තක්සේරු නොකිරීම හා 2011-2015 දක්වා වරිපනම් ඒකක වැඩි වීමේ සීඝ්‍රතාව අඩු මට්ටමක පැවතීම. | අනුකූලතා සහතික ලබා දී තිබූ ගොඩනැගිලි සැලසුම් 86 ක වරිපනම් තක්සේරුවක් සිදු කර ආදායම් අය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබීමද වරිපනම් ඒකක ප්‍රමාණය එතරම් වෙනස් නොවීමට හේතුවක් විය හැකි බවද නිරීක්ෂණය විය. මේ වන විට මින් 63 ක් තක්සේරු දෙපාර්තමේන්තුවට යවා තක්සේරු ලබාගෙන ඇති බව ග. නි. පැවසීය. මේ පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 2. | අපද්‍රව්‍ය කළමනාකරණය | කුණු කසල ඉවත් කිරීමට වසරකට මිලියන 47ක මුදලක් වියදම් වන අතර දිනකට කුණු ටොන් 25-30 ත් අතර ප්‍රමාණයක් ඉවත් කරන බවද මෙම කුණු බස්නාහිර පලාත් සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ කොම්පෝස්ට් පොහොර නිපදවීමේ ව්‍යාපෘතියකට යොමු කරන බවද මෙම ව්‍යාපෘතිය “මිහි සරු” නමින් නම් කර දකුණු පලාතේ තේ ඉඩම් වලට කොම්පෝස්ට් පොහොර විකුණා ලාබ ලබන බවද ප්‍ර. ග. නි. / ග. නි. පැවසීය. |
| 3. | ගොඩනැගිලි සැලසුම් අනුමැතිය ලද පසු ඒ බව දැනුම් දීමේ ක්‍රමවේදය හා අනුමත නොවන අයදුම්පත් | 2016 වසරේ සැප්තැම්බර් 30 දක්වා අයදුම්පත් වල ඇති අඩුපාඩු හේතුවෙන් මෙතෙක් අනුමත නොවූ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ගොඩනැගිලි සැලසුම් සංඛ්‍යාව 40 ක් වන බවද ග. නි. පැවසීය. මෙලෙස ප්‍රතික්ෂේප වන අයදුම්පත් වර්ගීකරණය කර අඩුපාඩු හඳුනාගෙන ඒවා මගහරවා ගැනීමට අවශ්‍ය උපදෙස් LP 93/30 චක්‍ර ලේඛනය අනුව ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 4. | කළුතර දකුණ ගඟබඩ පාරේ පිහිටි නගර සභාවට අයත් පර්චස් 06ක ඉඩම සභාපතිවරයා විසින් ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව 2004 මැයි සිට අවු:30 ක බදු පදනම මත නගර සභා සේවකයෙකුට පදිංචිය සඳහා ලබා දී ඇති අතර ඔහු විසින් නගර සභාවට අයත් යාබද ඉඩමද පරිහරණය කරන බව අනාවරණය වූ අතර වර්ෂයකට රු. 600/= ක මුදලක් ගෙවීමට තීරණය කළද රජයේ තක්සේරුකරුවෙකුගේ තක්සේරුවක්ද ලබා ගෙන නොතිබීම. | කාරක සභාව මේ පිළිබඳ විමසූ අතර දැනටමත් තක්සේරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති බව ප්‍ර. ග. නි./ ග. නි. පැවසීය. |
| 5. | නගර සභාවේ කාර්මික නිලධාරීන් විසින් ඇතැම් මාර්ග ව්‍යාපෘතීන් සඳහා සකස් කරනු ලැබ තිබූ ඇතැම් මාර්ග කොන්ත්‍රාත් සඳහා අධි ඇස්තමේන්තු සකසා තිබූ බවටත්, මුල් ගිවිසුම් අවලංගු කර නව ඇස්තමේන්තු සැකසීම සිදුව ඇති බවත් එම කාර්මික නිලධාරී විසින්ම පසුව සකසා තිබූ ඇස්තමේන්තු වැඩ විස්තර වල ඉටු කළ යුතු වැඩ ප්‍රමාණයන් එකිනෙකට බෙහෙවින් වෙනස් කර තිබීම. | මේ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේදැයි කාරක සභාව විමසූ අතර දැනට මූලික පරීක්ෂණ ආරම්භ කර ඇති බවත් මේ හා සම්බන්ධ එක් කාර්මික නිලධාරියෙකුට ස්ථාන මාරු වීමක් ලබා දී ඇති බවත් ප්‍ර. ග. නි./ ග. නි. පැවසීය. දැනට බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වල පවතින මෙවන් විමර්ශන කටයුතු සම්බන්ධව වාර්තාවක් නොවැම්බර් 20 ට පෙර කාරක සභාව වෙත එවන ලෙස ප්‍ර. ග. නි. / ග. නි.ට නියෝග කළේය. |

## සූචිය

පිටු අංකය

**ක**

කළුතර නගර සභාව 104

**ඛ**

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය 24

**ග**

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය 55

**ජ**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 27
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව 50

**ද**

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව 88

**න**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව 22
නීතිපති දෙපාර්තමේන්තුව 54

**ප**

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය 92
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 29

**බ**

බස්නාහිර පළාත් සභාව 61, 87

**ම**

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 98
මීරිගම ප්‍රාදේශීය සභාව 85

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 32, 79

**ර**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව 67
රාජ්‍ය සේවා කොමිෂන් සභාව 52
රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව 21

**ව**

වත්තල ප්‍රාදේශීය සභාව 83
වයඹ පලාත් සභාව 102
වාරිමාර්ග දෙපාර්තමේන්තුව 63
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව 19

**ශ**

ශ්‍රී ලංකා ගුවන් හමුදාව 46
ශ්‍රී ලංකා නාවික හමුදාව 35
ශ්‍රී ලංකා පොලිසිය 37
ශ්‍රී ලංකා යුධ හමුදාව 42
ශ්‍රී ලංකා රේගුව 40

**ස**

සබරගමුව පලාත් සභාව 71
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව 57
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 58
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය 54

**හ**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 74

**විශේෂ විමර්ශන**

- ගණකාධිකාරි සේවයේ පවතින පුරප්පාඩු සහ වැටුප් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වන දෙවන රැස්වීම 31

- ගණකාධිකාරි සේවයේ පවතින පුරප්පාඩු සහ වැටුප් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වන තෙවන රැස්වීම 96

- ලේඛනගත නොවූ ණය සහ 2015 ජනවාරි මස සිදු කළ බැඳුම්කර නිකුතුව හේතුකොට ගෙන රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට හානියක් / පාඩුවක් සිදුවී තිබේද යන්න විමර්ශනය කිරීම සඳහා කැඳවන ලද විශේෂ කාරක සභා රැස්වීම 26